විසල් නුවර එළිය
සංවර්ධන සැලැස්ම
2022- 2032

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම (2022- 2032)

"මිහිදුම් කඳුකරයේ පාරාදීසය"

නුවරඑළියට ආවේනික පාරිසරික හා ඉදිකිරීම් පරිසරය ආරක්ෂා කර ගනිමින් සියළු පාර්ශවයන්ට උපරිම උපයෝගිතාවයෙන් යුක්තව ජීවත් වීමට, සංචරණයට සුදුසු ප්‍රදේශයක් ලෙස පත් කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022-2032

©නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2022

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපැල - info@uda.gov.lk
දුරකථන අංක - + 94112 873 637
ප්‍රකාශනය 2022 අගෝස්තු

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022 -2032, I වන කොටස, II වන කොටස සහ III කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සැලැස්මය. දෙවන කොටස 2021 -2030 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියාමතා වලින් සමන්විත වේ. III කොටස කලාප සීමා මායිම් බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022-2032 සකස් කර ඇත්තේ නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය විසිනි.

අධීක්ෂණය

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර- සභාපති, නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර - අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ., ගෘහ නිර්මාණ ශිල්පී,නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානආරච්චි- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ, නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප I - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී බී.එච්.එම්. රංජිත් බණ්ඩාර මධ්‍යම පළාතනීතිඥ සී . ජයවර්ධන - උපදේශක (නීති) - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න - අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්) නා.සං.අ.

සැලසුම් කණ්ඩායම

නගර නිර්මාණ ශිල්පී ජේ.එම්.යූ. එස්.කුමාර - ස්ථානභාර නිලධාරී, නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය-නා. සං.අ,

පී.ජී.සී. පුෂ්පකුමාරි මිය - බලාත්මක සැලසුම්කරු, නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා. සං.අ,

නගර නිර්මාණ ශිල්පී එම්. එච්. පවිත්‍රා මදුෂානි- නගර නිර්මාණ ශිල්පී, නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා. සං.අ,

නගර නිර්මාණ ශිල්පි ඩබ්. වී.කේ. ගුණපාල - නගර නිර්මාණ ශිල්පි , නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා. සං.අ,

වයි. ඒ. ඒ. චාන්දනී මිය- බලාත්මක නිලධාරි , නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා. සං.අ,

ඩබ්. බී.එම්.ඩී. හංසමාලා- සහකාර සැලසුම් නිලධාරී ,නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා.සං.අ

සියලුම කාර්ය මණ්ඩලය - නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය- නා.සං.අ

සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය

- උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ (අධීක්ෂණය, නියාමය සහ ගැසට් කිරීම)
- පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ (PORS,DRR, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)
- භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය හා තොරතුරු දත් සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)
- පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අ.(නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම)

ප්‍රණාමය

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022-2032 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ නුවර එළිය දිස්ත්‍රික් කාර්යාලය මූලික අධීක්ෂණය යටතේ සිදු විය. "මිහිඳුම් කඳුකරයේ පාරාදීසය" යන දැක්ම සහිතව නුවරඑළියට අවේනික පාරිසරික හා ඉදිකිරීම් පරිසරය ආරක්ෂා කර ගනිමින් තිරසාර සංවර්ධන අවශ්‍යතා සපුරගනිමින් සියළු පාර්ශවයන්ට උපරිම උපයෝගිතාවයෙන් යුක්තව ජීවත් වීමට, සංචරණයට සුදුසු ප්‍රදේශයක් ලෙස පත් කිරීම මෙම සැලැස්මේ අරමුණයි. විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022-2032 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම " ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පණත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ නුවර එළිය සංවර්ධන සැලැස්ම 2022-2032 සඳහා අනුමැතිය ලබාදීම සිදු කර ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා හට අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමි. තවද මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදුන් එම අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත අපේ ස්තුතිය පුදකොට සිටිමි.

නුවර එළිය මහා නගර සභාවේ ගරු නගරාධිපති, නුවර එළිය ප්‍රාදේශීය සභාවෙහි ගරු සභාපති, මන්ත්‍රීවරුන් හා නිලධාරීන්, නුවර එළිය ප්‍රාදේශීය ලේකම් හා එම කාර්යාලයේ සියළුම නිලධාරීන්ටත් මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමි.

තවද, මෙම සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත, වෙනත්, අනෙකුත් සහය සහ උපදෙස් ලබා දුන් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සියලුම රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මෙන්ම තනි පුද්ගල සම්පත් දායකයින් ද නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් විශේෂ ඇගයීමට ලක් වේ

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති මේජර් ජෙනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර මහතාට, අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර මහතාට , අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ගෘහ නිර්මාණ ශිල්පි,නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානආරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්) කලාප I, නගර නිර්මාණ ශිල්පී, එම්.පී.රණතුංග මහතාට මධ්‍යම පළාත් අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී බී.එච්.එම්. රංජිත් බණ්ඩාර මහතාට, නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ සී. ජයවර්ධන මහත්මියට හා උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමි.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූදර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ. කළුපහන මහත්මියට හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂක, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියළුම නිලධාරින් ඇතුළු නන් අයුරින් සහයෝගය දැක්වූ සියළුම නිලධාරින්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුද කරමි.

ගරු අමාත්‍යතුමන්ගේ පෙරවදන

"නුවර එළිය" නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව "ගම සහ නගරය පිළිබඳ වෙනසක් නැති සැමට අවශ්‍ය සියළු පහසුකම් , සෑම තැන්හිම පවතින ආකාරයට අපේ රටේ භෞතික අවකාශය ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ සඳහා නව ප්‍රතිනාගරීකරණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයය" .

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් නගර 26 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. විසල් නුවර එළිය නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

විසල් නුවර එළිය නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ නුවර එළිය නගරයෙන් හා අවට කලාපය තුලින් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනිමට මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුලින් විසල් නුවර එළිය සංවර්ධන සැලසුම (2022-2032) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී අධිකාරිය පිහිටුවන ලද්දේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය සහ නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලැසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිවය.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ II අ කොටස 8 අ(1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන විසල් නුවර එළිය සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් විසල් නුවර එළිය සංවර්ධන සැලැස්ම 2022-2032 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. විසල් නුවර එළිය සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු විසදීමටත්, ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමටත් උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම අනුගමනය කර එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන් ගෙන් සහ මහජනතාව ගෙන් ඉල්ලා සිටිමි.

මෙම සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මේජර් ජනරාල්(විශ්‍රාමික) උදය නානායක්කාර

සභාපති

නාගරික සංවර්ධන අධිකාරිය.

නුවරඑළිය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය

නුවරඑළිය යනු ස්වභාවික සෞන්දර්යය හා සලකා බලන කල අගනා ස්ථානයක් ගන්නා ආකර්ශනීය ප්‍රදේශයකි. මධ්‍යම කඳුකරයේ මධ්‍යගතව පිහිටි මෙම ප්‍රදේශය තමන්ටම අවේනික වූ පාරිසරික සුවිශේෂී හා දේශගුණ තත්වයන්ගෙන් අනූන වේ. නුවරඑළිය නගරය අනෙකුත් නගර හා සසඳන විට එහි ඇති වැදගත්කම වන්නේ ඉහල උන්නතාංශයකින් සහ සිසිල් දේශගුණික තත්ත්වයකින් හෙබි බ්‍රිතාන්‍ය පාලනයේ දීර්ඝ ඉතිහාසයක් සහිතව බොහෝ දුරට සංවර්ධනය වී තිබීමය

තවද නුවරඑළිය යනු වනාන්තර ගහනයෙන් යුක්ත ඉහළ උන්නතාංශයකින් හෙබි සුන්දර කඳුපන්තින්ගෙන් වටවූ සුන්දර ප්‍රදේශයකි. මෙම ආවේණික දේශගුණික තත්වයන් නිසාවෙන්ම අනන්‍ය වූ උඩරට එළවළු වගාව ප්‍රදේශය පුරාම වගා කරන බව දක්නට ලැබේ. එසේම වර්ණවත් වූ නෙත් සිත් පැහැර ගන්නා ලක්ෂණවලින් හෙබි විසිතුරු මල් වර්ගයන්ද ප්‍රදේශයට එක් කරනුයේ මනා සුන්දරත්වයයි.

උක්ත අනන්‍ය වූ කාරණා හේතුකොට ගනිමින් සංචාරක ආකර්ශණීය ස්ථානයන් අතරින් ප්‍රමුඛස්ථානයක් නිතැතින්ම හිමිකර ගැනීමට නුවරඑළිය සමත් වී ඇත. එබැවින් වර්තමානය වන විට සංචාරක ක්ෂේත්‍රය තුලින් ආර්ථික සංවර්ධනයක් මෙන්ම ඒ හා සමානව පාරිසරික හා සමාජීය මට්ටමේ දියුණුවක්ද දක්නට ලැබේ. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්යේ ප්‍රධාන පරිපාලන නගරය ලෙස ක්‍රියාකරන අතර වාණිජමය අංශයේද ප්‍රමුඛ කාර්යය භාරයක් උසුලන නගරයක් ලෙස හඳුනා දිය හැකිය.

එබැවින් උක්ත මා සඳහන් කල සියළු කාරණා හා විභවතායන් සැලකිල්ලට ගැනීමෙන් නාගරික සංවර්ධන, සහ නිවාස අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරි වර්ෂ 10ක් සඳහා විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම නමින් නුවරඑළිය නගරය හා ඒ අවට කලාපයට සංවර්ධන සැලැස්ම සකස් කිරීම ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා ලෙස ඉතා සතුටට පත්වන බව පවසමි.

මෙම සංවර්ධන සැලැස්ම පිළිබඳව මා මාගේ විශේෂ අවධානයට යොමු කොට ඒ සම්බන්ධව අධ්‍යයනය කල බව දන්වන අතර ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, පාරිසරික සංචාරක හා අදාල සියලුම අංශයන්ගෙන් සංවර්ධනය විධිමත් හා ප්‍රවර්ධනය කිරීමේ අභිලාසය සහිතව මෙම සැලැස්ම සකස් කර ඇති බවද දක්නට ලැබේ. ඒතුලින් ඉදිරි දසවසරක කාලය තුලදී නුවරඑළිය නගරය සියළුම පාර්ශවයන්ට සේවා සපයන සෞභාග්‍යමත් ශීත කඳුකරයේ පාරාදීසයක් වන බව නොඅනුමානය. එබැවින් මෙම සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වේවායි එකසිතින් ප්‍රාර්ථනා කරන අතර නුවරඑළිය මහ නගර සභාව ලෙස අප පූර්ණ දායකත්වය හා අවශ්‍ය සියලුම සහයෝගය ලබා දීමට බලාපොරොත්තු වන වන බවද තව දුරටත් දන්වා සිටිනු කැමැත්තෙමි.

දේශමාන්‍ය චන්දන ලාල් කරුණාරත්න ,
ගරු නගරාධිපති
නුවරඑළිය මහ නගර සභාව

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය

නුවරඑළිය ප්‍රදේශය ස්වභාවික සෞන්දර්යෙන් අනූන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් ප්‍රදේශයකි. මධ්‍යම කඳුකරයේ මධ්‍යගතව පිහිටි මෙම ප්‍රදේශය තමන්ටම අවේනික වූ පාරිසරික සුවිශේෂතා හා දේශගුණික ලක්ෂණයන්ගෙන් සමන්විත වේ.
ඉහළ උන්නතාංශයකින් යුක්තව පිහිටීම වැඩි භූමි ප්‍රදේශයක් වනාන්තර ගහනයෙන් යුක්තව පිහිටීම, උඩරට තේ වගාව මෙන්ම උඩරට එළවළු වගාව සහිතව අනන්‍ය භූමි පරිභෝජන රටාවක් ප්‍රදේශයේ පෙන්නුම් කරයි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ දි හඳුනාගන්නා ලද නුවරඑළිය කලාපය ජනාකීර්ණය වීම ආරම්භ වීමත් සමඟ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනයක් ඇති වූ අතර උඩරට තේ වගාව ආශ්‍රිතව ගොඩනගන ලද වතු ආර්ථිකය හා එහි ජන ජීවන රටාව තවදුරටත් නුවරඑළිය ප්‍රදේශය වර්ණවත් කරයි. එහෙයින් වර්තමානය වන විට ආර්ථික, පාරිසරික, සාමාජීය වශයෙන් වැඩි දියුණුවක් ප්‍රදේශය අපෙක්ෂා කරයි. එසේම පරිපාලනමය කේන්ද්‍රස්ථානයක් වශයෙන්ද නුවරඑළිය නගරය වැදගත් කාර්යයක් සිදුකරනු ලබයි.
මේ හෙයින් මෙම කටයුතු සැලකිල්ලට ගෙන ඉදිරියේදි ඇති වන ප්‍රවණතාවන් පිළිබඳව අධ්‍යනය කර නාගරික, සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරි වසර 10 සඳහා සකස් කරනු ලබන විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සඳහා නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ සභාපති ලෙස මා සතුටට පත් වෙමි.

මෙම සැලැස්ම පිළිබඳව අප විසින් අධ්‍යනය කරන ලද අතර ඒ තුළින් ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය, පාරිසරික හා සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනයක් සිදු වෙතැයි බලාපොරොත්තු වෙමි.

ඉදිරි දස වසර තුලදි නුවරඑළිය ප්‍රදේශය ශිත කඳුකරයේ පාරාදීසය බවට පත්වීමට හැකියාව ඇති අතර මෙම සැලැස්ම සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා එකසිතින් ප්‍රාර්ථනා කරන අතර නුවරඑළිය ප්‍රාදේශිය සභාව ලෙස ඒ සඳහා පූර්ණ දායකත්වය ලබා දෙන බවද තවදුරටත් දන්වා සිටිමි.

වේළු යෝගරාජ්
ගරු සභාපති - නුවරඑළිය ප්‍රාදේශිය සභාව

පූර්විකාව

නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ඉදිරි වසර 10 ක කාලය සඳහා ග්‍රාම නිලධාරී වසම් 21 කින් සමන්විත මෙම සංවර්ධන සැලැස්ම නිම කර ඇත. නුවරඑළිය දිස්ත්‍රික්කයේ අගනුවර වන නුවරඑළිය මුහුදු මට්ටමේ සිට අඩි 6000 ට මදක් ඉහළින් බාදනය වූ සානුවක් සහිත ලක්ෂණ වලින් හෙබි කලාපයක පිහිටා ඇත. පටු කඳු බෑවුම්, පහත් වටකුරු කඳු, ලාංඡන; පාද කඳු, විච්ඡේදනය කරන ලද සානු සහ නිම්නයන හේතුවෙන් නගරය තුළ සහ අවට අද්විතීය භූ දර්ශනයක් ඇති කරයි, ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය සහ හරිතභාවය මෙම භූගෝලීය රටාවේ සුන්දරත්වය වැඩි කරයි. මෙකී සියලු කරුණු හේතුවෙන් නුවර එළිය කලාපය ඉහල සංචාරක ආකර්ෂණීය නගරය බවට පත්ව ඇති බව කිව හැක.

දැනට නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ජනගහනය 35,000ක් පමණ වන අතර විසල් නුවරඑළිය සැලසුම් ප්‍රදේශහි එයම ජනගහනය 52,000ක් පමණවේ. වසරකට දේශීය සංචාරකයින්ගෙන් 950,000 ක් පැමිණෙන අතර විදේශීය සංචාරකයින් 135,000 ක් පමණ පැමිණේ. ආර්ථිකය ප්‍රධාන වශයෙන් සංචාරක හා කෘෂිකාර්මික අංශ මත පදනම් වේ. තේ වතු අංශය ද ආර්ථික සංවර්ධනයට යම් දායකත්වයක් සපයයි.

නාගරික සංවරධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නුවරඑළිය සංචාරක ප්‍රදේශය සඳහා සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්මක් සකස් කර ඇත. මෙම සැලැස්ම නුවරඑළිය සංවර්ධන සැලැස්මේ සැලසුම් සීමාවෙන් ඔබ්බට යන මුළු නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය කරයි. නුවරඑළිය සංවර්ධන සැලැස්ම සැකසීමට සමගාමීව ඒ හරහා වන බලපෑම් සලකා බලා නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදු කරන ලද අතර නුවරඑළිය සංවර්ධන සැලැස්මේ සීමාවට අයත් නුවරඑළිය යෝජනා සම්පූර්ණයෙන්ම සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ඇත.

මීට අමතරව ප්‍රධාන වශයෙන් වර්තමානයේ රජය විසින් ගෙන යනු ලබන දැක්ම හා අනුකූල වෙමින් ඒ හා සබැඳි සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අරමුණ සහිතව නුවර එළිය සංවර්ධන සැලැස්ම පිළියෙළ කර ඇත. එකී දැක්මේ සඳහන් පරිදි චතුර්විද අරමුණු වන ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, ගුණ ගරුක සමාජයක් හා සෞභාගවත් දේශයක් ජය ගැනීම උදෙසා දස ප්‍රතිපත්ති ඔස්සේ සියල්ලන්ම ගමන් කල යුතු බව දක්වා ඇත.

එබැවින් මෙකී සැලැස්මෙහි පොදු පරමාර්ථය වන්නේ එකී අරමුණු හා ළඟා විය හැකි පරිදි නාගරික සංවර්ධනය ඇති කිරීමයි. එසේම දස ප්‍රතිපත්තින්හි ඵලදායී පුරවැසියෙක්- සශ්‍රික මානව සම්පතක්, ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්, තාක්ෂණය මත පදනම් වන සමාජයක්, භෞතික සම්පත් සංවර්ධනය තිරසාර පරිසර කළමනාකරණය යනාදී කරුණු මූලික කරගත් තිරසාර සංවර්ධිත ප්‍රදේශයක් ඇති කිරිම මෙතුලින් අපේක්ෂිතය.

නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ප්‍රසන්න රණතුංග (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2022 ..දෙසැම්බර්..... මස ..01... වන දින.

.

ගැසට් නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2291/07 - 2022 අගෝස්තු මස 01 වැනි සඳුදා - 2022.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අගෝස්තු මස 01 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල,
සුහුරුපාය,
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 37150 — 44 (2022/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2A I කොටස : (I) ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2022.08.01

නුවරඑළිය මහ නගර සභාව හා නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීම.

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද නුවරඑළිය මහ නගර සභාව හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් අන්තර්ගත වන්නා වූ, නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2022 ක් වූ අගෝස්තු මස 01 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, උක්ත පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාවට මෙයින් දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 අගෝස්තු මස 01 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල,
සුහුරුපාය,
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවර- එළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වූ නුවරඑළිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් ඔහුවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත් (විශ්‍රාමික) [illegible],
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2022 අගෝස්තු මස 01 වැනි දින.

EOG 08 - 0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පටුන

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම 2022-2032 ii

ප්‍රණාමය iv

ගරු අමාත්‍යතුමන්ගේ පෙරවදන v

සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය vi

නුවරඑළිය මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය vii

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය viii

පූර්විකාව ix

ගැසට් නිවේදනය xi

පටුන xiii

01. පරිච්ඡේදය ....

සංවර්ධන සැලැස්ම සැකසීමේ පසුබිම ....

2.2.1. ඓතිහාසික පරිණාමය 9

2.2.3. ජාතික සහ කලාපීය සම්බන්ධතා 20

2.2.4. භූගෝලීය සහ භූගෝලීය තත්ත්වය 26

2.2.6. ඉඩම් පරිහරණ රටාව 30

2.2.7. ජල මූලාශ්‍ර 32

2.2.8. ජනගහනය ආශ්‍රිත ලක්ෂණ 34

2.2.9. නිවාස ආශ්‍රිත ලක්ෂණ 38

2.2.10. ශ්‍රම බලකායක් 40

2.2.11. අධ්‍යාපනය ආශ්‍රිත ලක්ෂණ 42

2.2.12. යටිතල පහසුකම් 44

2.2.13. සංචාරක ගමනාන්තයක් ලෙස නුවරඑළිය 45

2.2.14. නවාතැන් පහසුකම් 54

2.2.15. නුවරඑළියේ ආකර්ෂණීය ස්ථාන 55

3. 3.1. මතුවෙමින් පවතින අනපේක්ෂිත සංවර්ධනයත් සමඟ අවේනිකව උරුම වූ නගර ප්‍රතිරූපය ක්‍රමයෙන් අඩුවීම 72

3.3.2 ආරක්ෂිත පානීය සහ වායු පරිසරයට ප්‍රවේශ වීමේ අඩු සහතිකයක් ඇති ජල මතුපිට සහ පානීය ජල මූලාශ්‍රවල ගුණාත්මක හා ප්‍රමාණාත්මක ගැටළු 86

3.3.3. අඩු පහසුකම් සහිත නිවාස, මුඩුක්කු සහ පැල්පත් 95

3.3.4. ප්‍රමිතියෙන් තොර මාර්ග තත්වයන්පැවතීම 99

3.3.5. ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් හේතුවෙන් සංචාරක ක්‍රියාකාරකම් වල සුමට ක්‍රියාකාරිත්වයට බාධා ඇතිවීම 100

4.4.පරමාර්ථ **(Objectives)** 112

5.1.1 ශක්තීන් 119
.6.1.2 දුබලතාවයන් 124
.5.1.3අවස්ථා 129
.5.2.1ශක්තීන් 131
.5.2.2දුබලතාවයන් 138
.5.2.3අවස්ථා 143
5.2. .4තර්ජන 144
.5.3.1ශක්තීන් 146
06. ආර්ථික අංශයෙන් පොහොසත් මහ නගර සභාවක් පැවතීම 146
.5.3.2දුර්වලතා 150
.5.3.3අවස්ථා 150
.5.3.4දුර්වලතා 152
සැලැස්ම 154
6.1. සංකල්පිත සැලැස්ම 155
6.1.1. හැදින්වීම 155
6.3.1. හැදින්වීම 160
6.3.2 නුවරඑළිය ප්‍රදේශය තුල සංචාරක ව්‍යාපාරයේ සහ අනෙකුත් ආර්ථික කටයුතුවල වර්තමාන තත්ත්වය 160
6.3.3) සංචාරක සංවර්ධනය 161
6.4.1.2. උපාය මාර්ග 173
6.4.2භූදර්ශන අලංකරණ සැලැස්ම 178
6.4.2.3ආපදා කළමනාකරණ සැලැස්ම 181
.6.5.1සේවා සැලැස්ම 185
6.5.1 (අ) නිවාස 185
6.5.1 (ආ) උපාය මාර්ග. 189
6.5.1 (ඇ). සෞඛ්‍ය සේවාව 190
6.5.2ප්‍රවාහනය 193
6.5.3පානීය ජල සැපයුම. 197
6.5.4විදුලි බල හා දුරකථන පහසුකම් 200
6.5.5ජලාපවාහන හා මලාපවාහන සැලැස්ම 201
.6.5**6** ඝන අපද්‍රව්‍ය හා අපජලය කළමනාකරණය 203
6.6.1හැදීන්වීම 204
6.6.2උපාය මාර්ග 207
6.7.1 ඓතිහාසික හා ගෘහ නිර්මාණාත්මක වටිනාකමක් ඇති ගොඩනැගිලි- නුවරඑළිය මහා නගර සභා සීමා ප්‍රදේශය 208
6.7.2.වීථි අනුව සංරක්ෂණය සඳහා හඳුනාගත් ගොඩනැගිලි ව්‍යාප්තිය 211
6.8.2.නුවරඑළිය තේමා උද්‍යානය 219

6.8.3.ලවර්ස්ලීප් ජලාශය ඉදිකිරීම- නුවරඑළිය 221
6.8.4.ඉහල උන්නතාංශ ක්‍රීඩාංගනය ,තුරඟ තරග පිටිය - නුවරඑළිය 223
6.8.5.බ්රැක්ප්ලෙන් ජලාශය ආශ්‍රිත විනෝදාත්මක කලාපය ඉදිකිරීම 225
6.8.6.නුවරඑළිය ග්ලෙන්ෆෝල් අතුරු පාර පුළුල් කිරීමේ ව්‍යාපෘතිය...........................227
6.8.7.නුවරඑළිය බස් නැවතුම්පොල සංවර්ධනය අදියර 02 229
6.8.9.නුවරඑළිය බඹරකැලේ PWD නිවාස සංවර්ධන 233
6.8.11.වනාන්තර මායිම් වල අඩි පාරවල් ඇති කිරීම 237
7.2.1. ආකෘති පත්‍රය 01 -කලාප සඳහා අවසර ලත් අවසරලත් ගෙබිම් අනුපාත වගුව 245
7.2.2."ආ "පෝරමය - මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන්.................................247
7.2.3."ඇ "පෝරමය - විවෘත අවකාශයන් 248
7.3.1 . නුවරඑළිය ප්‍රදේශයට අවේනික ගෘහ නිර්මාණ ප්‍රමිතින් සහ පිරිවිතර.......................255
7.3.2. රෝපනය සඳහා සුදුසු නුවරඑළියට ආවේනික ශාක විශේෂ.......................................256
පරිච්ඡේද 08- විශේෂ *කලාප* සඳහා වන කලාපකරණ නියමතා 258
8.1.1. කලාපීකරණ නියමතා.. 260(
8.1.2. අනුමත භාවිතය 261
8.2.1.කලාපීකරණ නියමතා...266
8.3.1.කලාපීකරණ නියමතා...267
8.4.1. කලාපීකරණ නියමතා..273
8.6.1. කලාපීකරණ නියමතා..285
8.6.2. අනුමත භාවිතයන් 287
8.7.1. කලාපීකරණ නියමතා..289
8.7.2. අනුමත භාවිතයන් 289
8.8.1. කලාපීකරණ නියමතා..290
8.8.2. අනුමත භාවිතයන් 291
8.9.2. අනුමත භාවිතයන් 292
8.10.1. කලාපීකරණ නියමතා..293
8.10.2. අනුමත භාවිතයන් 293
8.11.1. කලාපීකරණ නියමතා..294
8.11.2. අනුමත භාවිතයන් 294
8.13.1. කලාපීකරණ නියමතා..296
8.13.2. අනුමත භාවිතයන් 296
8.14.1. කලාපීකරණ නියමතා..297
8.14.2. අනුමත භාවිතයන් 297
8.15.1. කලාපීකරණ නියමතා..298
8.15.2. අනුමත භාවිතයන් 298
8.17.1. කලාපීකරණ නියමතා..300

පරිච්ඡේදය 09- මාර්ග පළල, ගොඩනැගිලි සීමා / මාර්ග රක්ෂිත සීමා..302

ඇමුණුම් 01..ii

ඇමුණුම් 02- කලාපීකරණ සැලැස්ම සඳහා වන විශ්ලේෂණය iv

ඇමුණුම 03 -කලාපීකරණ මායිම් හා ඛණ්ඩාංක...x

I කොටස

01. පරිච්ඡේදය

සංවර්ධන සැලැස්ම සැකසීමේ පසුබිම

1.1 හැඳින්වීම

නාගරික ප්‍රදේශයක් තුල ඉදිරි කාලය සඳහා නව සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී එහි සමාජීය ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, පාරිසරික හා භෞතික තත්වයන් කෙරෙහි මූලික අවධානය යොමු කල යුතුයි. එසේම යථෝක්ත නගරයන්හි පැවැත්ම, එහි ආකෘතිය හා ක්‍රියාවලියේ තීව්‍රතාවය මෙම අංශයන් කෙරෙහි ඇති ප්‍රභලතාවයන් අවකාශයන්, දුබලතාවයන් මෙන්ම අභියෝගයන් වල තීව්‍රතාවයේ අඩු වැඩි භාවය මත රඳා පවතී.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන හා ඒ ආශ්‍රිත සංවර්ධනයන් හා ප්‍රධානතම නියාමන ආයතනය වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත හැකිය. නාගරික සංවර්ධන අධිකාරියට ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම්කරණය සඳහා වූ බලතල 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා ඒ යටතේ සකස් කරන ලද 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ හඳුනා ගන්නා ලද සීමා සඳහා සැලසුම් සකස් කිරීම හා බලාත්මක කිරීම සඳහා බලතල ලැබී ඇත.

මෙම නීතිමය රාමුව තුළ නාගරික සංවර්ධන අධිකාරිය මගින් යම් නාගරික ප්‍රදේශයක් සඳහා උක්ත සඳහන් කල සමාජීය ආර්ථික, දේශපාලනික, සංස්කෘතික, පාරිසරික හා භෞතික තත්වයන් පිළිබඳ අධ්‍යයනය කර එම ප්‍රදේශයේ ඇති නව ප්‍රවණතාවයන් හා විභවතාවයන් හඳුනාගනිමින් පවත්නා දුර්වලතාවයන් හා අභියෝග නිසි කළමනාකරණය කර ඉදිරි නිශ්චිත කාල සීමාව සඳහා නිසි දැක්මක් යටතේ මෙම සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ. මෙම සැලසුම් ප්‍රදේශයේ ජනතාවට, සංක්‍රමනික ජනතාවට මෙන්ම සියලු පාර්ශවයන්ගේ ඉදිරි සංවර්ධණයට රුකුලක් වන ආකාරයට සකස් කරනු ලැබේ.

මේ අතර 1978 නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව 1979 ජුනි 01 වන දින අංක 38/16 යටතේ නුවරඑළිය මහ නගර සභා සීමාව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස නම් කර ඇති අතර 1998.09.08 දිනැති අංක 1546/04 දරණ ගැසට් පත්‍රය මගින් නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාවද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස නම් කර ඇත.

ඒ අනුව නුවරඑළිය මහ නගර සභා සීමාව සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2004 වසරේදී නව සංවර්ධන සැලැස්ම සකස් කරන ලද අතර 2022 වසරේදී එය කල් ඉකුත් වනු ලැබේ. ඒ අනුව නව සංවර්ධන සැලැස්මක් නුවරඑළිය මහ නගර සීමාව හා ඒ ආශ්‍රිත නුවරඑළිය ප්‍රාදේශිය සභා සීමාවට අයත් ග්‍රාම සේවා වසම් 05ක් ඇතුලත් වන පරිදි නව විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම ඉදිරි අවුරුදු 10 සඳහා මෙමගින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම සංවර්ධන සැලැස්ම මගින් නව සංවර්ධන උපාය මාර්ග හා රෙගුලාසි හා නියමයන් හඳුන්වා දී ඇත.

1.2 සංවර්ධන සැලැස්මෙහි පාර්ශවකරුවන්

1.2.1. ප්‍රධාන උපදේශන ආයතන

01.නුවරඑළිය මහ නගර සභාව **2.** නුවරඑළිය ප්‍රාදේශීය සභාව

1.2.2.අනෙකුත් පාර්ශවයන්

1. පාර්ශව ආයතන	
1. සියලුම ආගමික නායකයින්	2. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය- නුවරඑළිය ඩිපෝව
3. මධ්‍යම පරිසර අධිකාරිය	4. පළාත් මගී ප්‍රවාහන අධිකාරිය
5. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	6. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
7. මාර්ග සංවර්ධන අධිකාරිය	8. රාජ්‍ය නොවන සංවිධාන
9. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	10. නුවරඑළිය සංචාරක හෝටල් සංගමය
11. නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	12. නුවරඑළිය සංචාරක මාර්ගෝපදේශක සංගමය
13. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	14. නුවරඑළිය මෝටර් රේසිං සංගමය
15. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය	**16.** නුවරඑළිය ඒකාබද්ධ වෙළඳ සංගමය
17. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	18. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
19. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව	20. ලංකා විදුලි බල මණ්ඩලය
21. වාරිමාර්ග දෙපාර්තමේන්තුව	22. ශ්‍රී ලංකා ටෙලිකොම්
23. දුම්රිය දෙපාර්තමේන්තුව	24. නුවරඑළිය ලැගුම්හල් හිමියන්ගේ සංගමය
25. අද්‍යාපන දෙපාර්තමේන්තුව	**26.** නුවරඑළිය 4 x 4 මෝටර් රථ සංගමය
27. සෞඛ්‍යය දෙපාර්තමේන්තුව	28. නුවරඑළිය ක්‍රීඩා සමාජය

1.3. සංවර්ධන සැලැස්මෙහි විෂය පථය

නුවරඑළිය, ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටි සුවිශේෂී නගරයකි. මෙම නගරය ශ්‍රීලංකාවේ අනෙකුත් නගර හා සැසඳීමේදී සාපේක්ෂව භෞතික හා පාරිසරික විවිධාංගිකරණයකින් යුක්ත වේ. අධි සංවේදී පාරිසරික කලාපයන්ගේ හා අනන්‍යවූ සුවිශේෂ දේශගුණික ලක්ෂණයන්ගෙන් සමන්විත මෙම කලාපය දිවයිනේ ප්‍රධාන ගංගා පෝෂණය කරනු ලබන ප්‍රධාන ජල පෝෂක කලාපයක් ලෙස හඳුනා ගත හැකිය. මෙම පාරිසරික තත්ත්වය මත ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ජාතික සැලැස්ම යටතේ නුවරඑළිය ප්‍රදේශය අධි සංවේදි පරිසර පද්ධතියක් ලෙස නම් කර ඇති අතර, මේ ආශ්‍රිත ප්‍රදේශය පරිසර හිතකාමී සංචාරක ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

2050 ජාතික භෞතික සැලසුමට අනුව මධ්‍යම අධිසංවේදී කලාපයට නුවරඑළිය කලාපය අයත්වන අතර එහි 2050 වන විට ජනගහන 100, 000ක සීමා කිරීමක් සැකිල්ලට ගනිමින් මෙම විසල් නිවුරඑළිය කලාපයෙහි පවතින සංවේදිතාව හා ඉපුලුම් ධාරිතාවය සලකා 2030 වන විට ජනගහනය 59,000ක් ලෙස පුරෝකථනය කර ඇත.

එසේම 2004.04.23 දින අංක 1337/16 යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගැසට් කරන ලද 2004-2017 නුවරඑළිය සංවර්ධන සැලැස්මේ හඳුනාගැනීම් හා අඩුපාඩු මගහරවා ගනිමින්ද මෙම සංවර්ධන සැලැස්ම පත්කර ඇත

විශේෂයෙන් 1937 අංක 2 දරණ වන හා වෘක්ෂලතා අඥා පනත හා ඊට ආනුසාංගික පසුකලක සංශෝධනයන් අනුව නීතිගත වූ වන හා වෘක්ෂ ලතා පනත අනුව දැඩි රක්ෂිත භූමියක් ලෙස නම්කරන ලද හග්ගල රක්ෂිත භූමියහි මායිම් මෙම සංවර්ධන සැලැස්මට මායිම් වන බැවින් එහි ඇති සීමා මියිම් හා නීති තත්වයන් සලකා බලන ලදි. එසේම 2017.12.14 දින අන 1527/22 ගැසට් පත්‍රය මගින් ගැසට් කරන ලද පිදුරුතලාගල සංරක්ෂිත වන කලාපයත්ල අංක 1559/12 හා 2018.07.22 ගැසට් කරන ලද කඳපොල, සීතාඑළිය සංරක්ෂිත වන කලාපයක් මෙන්ම 2009 අංක 65 දරණ වන රක්ෂිත (සංශෝධන) පනත මගින් ආවරණය වන කිකිලියාමාන සිංගල් ට්‍රී වන සීමාවක් සඳහා වන සීමාවන්, නීතිරිතී, රෙගුලාස් පිළිබඳව සලකා බලන ලදි.

එසේම 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ අංක 1487/10 හා 2007 මාර්තු මස 05 දින ගැසට් කරන ලද ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ සඳහා වන නිතිරීති සීමා පිළිබඳව සලකා බලන ලදි.

එසේම වන හා වෘක්ෂලතා ආඥාපනත යටතේ 2006 මැයි මස 18 දින අන 1405/18 යටතේ ගැසට් කරන ලද ගැල්වේස් ලැන්ඩ් ජාතික අභයභූමිය සඳහා වන නීතිරීති සීමා මායිම් පිළිබඳව සලකා බලන ලදි.

පුරා වස්තු ආඥා පනත අනුව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් අංක 1486 යටතේ 2007.02.23 දින ගැසට් පත්‍රය මගින් නම් කරන ලද නුවරඑළිය නගරයේ පිහිටි සංරක්ෂණය කල යුතු ගොඩනැගිලි සඳහා වූ නියමයන් රෙගුලාසි මෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගැසට් කරන ලද 2004 -2017 සංවර්ධන සැලැස්මෙහි හඳුනාගෙන ඇති නුවරඑළිය ආවේනික වූ ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ පෙන්නුම් කරන ගොඩනැගිලි සඳහා වූ නියමන් කෙරෙහිද සලකා බලන ලදි.

ඒ අනුව යමින් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්මද පාරිසරික සංවේදිතාවය පිළිබඳව අවධානය යොමු කරමින් පාරිසරික සංචාරක සංවර්ධනයට අවශ්‍ය ප්‍රතිපාදන මෙන්ම මනා කළමනාකරණයෙන් යුත් ආර්ථික, සමාජීය හා පරිසර සංවර්ධන ඉලක්ක කර ගත් මෙම සැලැස්ම ඉදිරිපත් කෙරේ.

1.4 සැලැසුම ක්‍රියාවලිය

මූලික අධ්‍යයනය	දත්ත එක්රැස් කිරීම (මූලික හා ද්විතියික එකතු කිරීම සමීක්ෂණ මගින් රජයේ කාර්යාල මගින්, අන්තර්ජාලයෙන්, ගූගල් සිතියම් මගින්, නිබන්ධන හා වාර්තා මගින්, සම්මුඛ පරීක්ෂණ මගින් සිදුකරනු ලැබේ.
විෂය පථය	පවත්නා තත්වය පිළිබඳව අධ්‍යනය කිරීම හා සීමාවන් හා ප්‍රමාණයන් හඳුනා ගැනීම (මේ සඳහා **MS Excel, GIS, Drone Survey** භාවිතා කරන ලදී.)
ගැටළු හා විභවතා හඳුනාගැනීම	ප්‍රදේශයේ පවත්නා ගැටළු හා ඒවායේ සංදර්භය, වැදගත්කම හා ප්‍රමාණත්වය පිළිබඳව සැලකිල්ලට ගැනීම හා ප්‍රදේශයේ ඇති විභවතායන් හා ඒවායේ තීව්‍රතාවය හඳුනා ගැනීම
දැක්ම/ඉලක්ක/අරමුණු	පවත්නා ගැටළු අවම කිරීමටත් ප්‍රදේශයේ ඇති විභවත්වයන් වලින් උපරිම ඵල ගැනීමටත් අරහයා ඉදිරි වසර 10 තුළ සාමාජීය, ආර්ථික හා භෞතික වශයෙන් තුලනාත්මක සංවර්ධනයක් සඳහා වන දැක්මක් හඳුනා ගැනීම ඒ යටතේ ඉලක්ක හා අරමුණු හඳුනා ගැනීම
විස්තරාත්මක අධ්‍යයනය	හඳුනා ගන්නා ලද දැක්ම කරා ලගා වීමට ඉලක්ක හා අරමුණු පිළිබද විස්තරාත්මක අධ්‍යයනය (**SWOT** අධ්‍යයනය, සංවේදිතා අධ්‍යනය)
සැලසුම් හා උපාය මාර්ග	ප්‍රදේශයේ ආර්ථික සමාජීය, භෞතික හා පාරිසරික තත්වයන් පිළිබඳව විස්තාරත්මක අධ්‍යනය කිරීම ඒ තුළින් සංවර්ධන ප්‍රදේශයක් ලෙස වැඩි දියුණු කිරීම
රෙගුලාසි	හඳුනාගන්නා ලද ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සැලැසුම් හා ගොඩනැගිලි, රෙගුලාසි හඳුන්වා දීම
අදහස් විමසීම	දළ සංවර්ධන සැලැස්ම මහජන අදහස් සඳහා යොමු කිරීම
අනුමැතීන්	දළ සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
ප්‍රසිද්ධ කිරීම	නියමිත නීතිරීති පටිපාටියට අනුව සංවර්ධන සැලැස්ම ගැසට් කර නීතිගත කිරීම

පරිච්ඡේද 02

මූලික අධ්‍යයනය

02

2.1 අධ්‍යයන කලාපය

1. නුවරඑළිය නගරය ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ මධ්‍යයේ පිහිටි සුවිශේෂ දේශගුණ හා භූදර්ශනයකින් සමන්විත වූ ප්‍රදේශයකි. පිදුරුතලාගල කඳු වැටියත් කිකිළියාමාන හා සිංගල් ට්‍රී කඳු වැටියත් හග්ගල කඳු වැටියත් මූලික කරගත් මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා වල ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. මහවැලි ගගේ ප්‍රධාන අතු ගංගාව වන කොත්මලා ඔයත් උමා ඔයෙත් පෝෂක ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

2. 1948 දී මහ නගර සභාවක් ලෙස නුවරඑළිය මහ නගර සභාව පත් කර ඇති අතර, 1979.06.01 දින අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස පත් කර ඇත. එසේම නුවරඑළිය ප්‍රදේශීය සභා සීමාවද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස 1998.09.01 දින ගැසට් අංක 154614 මගින් නම් කර ඇත.

3. ඒ අනුව විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සඳහා අධ්‍යන ප්‍රදේශ වශයෙන් නුවරඑළිය මහ නගර සභා සීමාවද, නුවරඑළිය ප්‍රදේශීය සභා සිමාවෙන් කොටසක් ද යටත් කර ගන්නා ලදි. ඒ අනුව නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 12ද නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාව තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 18ක් වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 30ක අධ්‍යන භූමි ප්‍රමාණය අධ්‍යන ප්‍රදේශ වශයෙන් හඳුනාගනු ලැබේ. (වගු අංක 2.1 /සිතියම් අංක 2.1) මෙම සමස්ථ]

*වගු අංක **2 1 :** අධ්‍යයන ප්‍රදේශය*

	ග්‍රාම නිලධාරි කොට්ඨාශ	කොට්ඨාශ අංකය		ග්‍රාම නිලධාරි කොට්ඨාශ	කොට්ඨාශ අංකය
1	බඹරකැලේ	**535K**	16	කැලේගාල	**535C**
2	බංගලාහත	**476C**	17	මාගස්තොට	**535A**
3	බුලුඇල	**535I**	19	මීපිලිමාන	**476H**
4	කොන්කෝඩියා	**534F**	19	මිහිඳුපුර	**476G**
5	ගල්පාලම	**534A**	20	නුවරඑළිය	**535**
6	ගොරඩිහෙල	**478**	21	නුවරඑළිය මධ්‍යම	**535D**
7	හාවාඑළිය නැගෙනහිර	**535H**	22	නුවරඑළිය බටහිර	**535L**
8	හාවාඑළිය උතුර	**535G**	23	පාර්ක්	**534P**
9	හාවාඑළිය බටහිර	**535F**	24	පීඩෘ	**534H**
10	ජයලංකා	**534B**	25	රුවන් එළිය	**476D**
11	කලපුර	**535N**	26	සඳතැන්න	**535E**
12	කලුකැලේ	**535B**	27	සීතාඑළිය	**478A**
13	කනදපොල	**534**	28	ශාන්තිපුර	**535M**
14	කඳපොල මධ්‍යම	**534C**	29	ටොප්පාස්	**535J**
15	කදපොල E	**534D**	30	වින්ඩිකෝනර්	**476E**

සිතියම 2.1: අධ්‍යයන ප්‍රදේශය



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

2.2. සැලසුම් හා තත්ත්ව සංදර්භය

2.2.1. ඓතිහාසික පරිණාමය

නුවරඑළියේ පුරාණ ඉතිහාසය

10 වැනි සියවසට අයත් පැරණි 'ගල් අකුරක්' තලඟ ඔයෙන් හමු වීම නිසා නුවරඑළිය ඉතිහාසය 10 වැනි සියවසෙන් ඔබ්බට දිව යන බව විශ්වාස කෙරේ. නුවරඑළිය ඉතිහාසය ලංකාවේ පැරණිතම ජනාවාස යුගය දක්වා පැවතෙන බව ජනප්‍රවාදයේ පවතිජනප් .රවාදයට හා ඉන්දියාවේ රචිත රාමායනයට අනුව ශ්‍රී ලංකාවේ රජකල රාවණා රජු විසින් සිතා දේවිය ඉන්දියාවෙන් පැහැරගෙන විත් සගවා තබා ගෙන ඇත්තේ නුවරඑළියට ආසන්න ප්‍රදේශයකයිඒ අනුව රාවණා රජු විසින් නුවරඑළිය . සිතා දේවි සගවා තිබු .හා ඒ ආශ්‍රිතව වාසය කර ඇති බවත් මතවාද පවතිස්ථානය සිතාඑළිය මෙන්ම එහි ඇති සිතා කෝවිලද මෙම ජනප්‍රවාද වලට සාක්ෂි සපයයි .

සීතා බේරා ගැනීමට වඳුරු සේනාවක් පැමිණි නමුත් රාවණා රජු හමුදා නායකයා වූ හනුමාන්ට ඔහුගේ වලිගය ගිනි තබා දඬුවම් කළ බව වීර කාව්‍යය දිගටම සඳහන් කර ඇත. රාවණා රජුගේ යුගයේ අගනුවර වූ මුළු නුවරඑළිය නගරයම හනුමාන් විසින් ගිනිබත් කළ බව පැවසේ. නුවරඑළියේ ඉහළ තට්ටුව සෑදී ඇති කළු පස, හනුමාන් විසින් පුළුස්සා දැමූ රාවණා නගරයේ අළුවලින් සෑදී ඇති බවට විශ්වාස කෙරේ

නුවරඑළිය නගරය හා පැටලී ඇති තවත් පුරාවෘත්තයක් අනුරාධපුර යුගය දක්වා දිව යයි, එහිදී රුහුණු රජ කළ කාවන්තිස්ස රජුගේ පුත් ගැමුණු කුමරු එළාර රජුට එරෙහිව හමුදා පිහිටුවීමට සරණ ගියහ. කෙසේ වෙතත්, ජනප්‍රවාද නිහඬ වන අතර මහනුවර යුගය දක්වා මෙම ප්‍රදේශය ගැන අසන්නට ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි.

ඉතිහාසය තව දුරටත් ඇවිස්සීමේදී, දිවයින පාලනය කළ පැරණි රජවරුන් නුවරඑළියේ ආර්ථික වටිනාකම ගැන නොදැන සිටි නමුත් එය පිරිසිදු ජලය ගලා යන ස්ථානය ලෙස සැලකූ බව සටහන් වේ. මේ අනුව, එහි ස්වභාවික සුන්දරත්වය එලෙසම තබා ගැනීමට බොහෝ සැලකිල්ලෙන් එය නිධන් කර ඇත. මේ හේතුව නිසා ඔවුන් නගරයේ රාජධානි හෝ මාලිගා ඉදි නොකළේය.

*රූප සටහන **2.1:** නුවරඑළිය යටත් විජිත සමය*



නුවරඑළියේ නූතන ඉතිහාසය **1818** දී බ්‍රිතාන්‍ය ශල්‍ය වෛද්‍ය ජෝන් ඩේවි විසින් එංගලන්තයට සමාන දේශගුණයක් සහිත මෙම සුවිශේෂී ප්‍රදේශය වන සතුන්ගෙන් සහ දඩයම් කිරීම සඳහා විශාල වන සතුන්ගෙන් පිරුණු ප්‍රදේශය නැවත සොයා ගැනීමත් සමඟ ප්‍රබෝධමත් වූ බව කියනු ලැබේ. අද ඔලිෆන්ට් වතුයාය ලෙස හඳුන්වනු ලබන්නේ අලි ඇතුන් විශාල ප්‍රමාණයක් ජීවත් වූ පැරණි 'අලි ප්ලේන්' ය

1824-1831 කාලයේ ලංකාවේ ආණ්ඩුකාර ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස් නුවරඑළියේ මාර්ග සහ නවාතැන් ඉදිකරන ලදී. නුවරඑළියේ පිහිටි ඔහුගේ නිවාඩු නිවහන වන 'බාන්ස් හෝල්' අද ඉතා ප්‍රසිද්ධ ග්‍රෑන්ඩ් හෝටලය ලෙස ප්‍රකටය. ශාන්ත ඇන්ඩෲස් හෝටලය, කීනා හෝටලය සහ කාල්ටන් හෝටලය ඔහුගේ යුගයේ සිදුවූ තවත් ඉදිකිරීම් කිහිපයකි. සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයක් වන කඳුකරය වෙරළ තීරයට යා කරන මාර්ග ජාලය ඉදිකළ ඔහු දිවයිනේ රෝපණ ව්‍යවසායයේ සාර්ථකත්වයට ද හේතු විය. ලංකාවේ ආණ්ඩුකාරවරයා ලෙස ඔහුගේ භූමිකාව නොතකා, බාන්ස් කෝපි කර්මාන්තය කෙරෙහි පෞද්ගලික උනන්දුවක් දැක්වූ නමුත් පසුව උද්භිද වෛරස් සමඟ අසාර්ථක විය.

1831 සිට **1837** දක්වා ශ්‍රීමත් විලියම් හෝටේන් ආණ්ඩුකාරවරයා 'කලම්බු ජර්නල්' පුවත්පතේ කර්තෘවරයා විය. නුවරඑළිය පුවත්පතට ඔහු විසින් ලියන ලද ලිපිවලින් මෙම සුන්දර වටපිටාව පිළිබඳ ඔහු තුළ තිබූ උනන්දුව නිරූපණය වේ.
ශ්‍රීමත් හෝටන්ගේ පාලන සමයේදී ශ්‍රීමත් සැමුවෙල් බේකර් ලංකාවට පැමිණීම විශේෂත්වයකි. ඔහු නුවරඑළියේ ගොවිපළක් සකස් කළේ ඉංග්‍රීසි ජනපදවාසීන් ගෙන්වා එහි වැඩ කිරීමටය. ඔහු නුවරඑළියට හඳුන්වා දුන් සමහර ඉංග්‍රීසි එළවළු වර්ග අදටත් රට පුරා ජනප්‍රියයි. ඔහු මෙම සුන්දර දිවයිනට බෙහෙවින් ඇලුම් කළ අතර එය සම කළ හැක්කේ පැරණි එංගලන්තය කෙරෙහි ඇති ඔහුගේ ආදරයෙන් පමණක් බව පැහැදිලි කළේය. සැමුවෙල් බේකර් සිය " ලංකාවේ ගෙවූ අට වසරක කාලය " පොතේ නුවරඑළිය ගැන ලියා ඇති අතර එය ඔහුගේ ආදරණීය උද්යෝගය පෙන්නුම් කරයි.

නුවරඑළිය දියුණු කිරීම සඳහා ඔහු කළ දැවැන්ත දායකත්වය අතර නුවරඑළිය ප්‍රදේශයට ගමන් කරමින් සිටියදී අභාවප්‍රාප්ත වූ තම සොහොයුරන් සිහිකර නුවරඑළිය මූලික රෝහලේ ඉදිකළ 'බේකර්ස් වාට්ටුව' සංවේදී සංකේතයකි. ඔහු මේ දිවයිනේ කළ බොහෝ අත්හදා බැලීම් අසාර්ථක වුවද ලංකා ඉතිහාසයේ කීර්තිමත් චරිතයක් බව පැවසේ. ඔහුගේ නම අද දක්වාම පවතී.

1872 (1872-1877) ආණ්ඩුකාරවරයා බවට පත් වූ ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි නුවරඑළිය ශ්‍රී ලංකාවේ අගනුවර බවට පත්කිරීමේ දැක්ම විය. ඔහු නුවරඑළිය සංවර්ධනයට යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත. ඔහු වගුරු බිමක් ජලය බැස එය වැවක් බවට පත් කළේ නානුඔය හරහා වේල්ලක් සාදා එය අද 'ග්‍රෙගරි වැව' ලෙස හඳුන්වන නගරයේ ප්‍රධාන ආකර්ෂණයකි. සුබෝපබෝගී සිසිල් දේශගුණයක්, වගාවට හා සත්ත්ව ගොවිතැන් සඳහා කදිම ඉඩම් සහ නිධන් මැණික් සහිත ඉඩම් සහිත මෙම අද්විතීය නගරය කෙරෙහි ඔහු තුළ තිබූ උද්යෝගය නිසා ඔහුට විදේශීය වෙළඳුන් සැලකිය යුතු පිරිසක් නගරයට ආකර්ෂණය විය.

*රූප සටහන **2.1**: පැරණි නුවර එළිය*

1877 දී ශ්‍රීමත් රොබට් ලන්ඩන් ආණ්ඩුකාරවරයා බවට පත් විය. ශ්‍රීමත් විලියම් ග්‍රෙගරි මහතාගේ උපදෙස් මත ඔහු පේරාදෙණියේ සිට නාවලපිටිය දක්වාත් එතැන් සිට හැටන් සහ නානුඔය දක්වාත් දුම්රිය මාර්ගය ඉදිකිරීමට සම්බන්ධ විය.

මුල් වසරවලදී, නගරයේ වඩාත් සුන්දර ස්ථානවල පදිංචි වීමට යුරෝපීයයන් එකිනෙකා සමඟ තරඟ කළ බැවින් නගර ජනගහනය බොහෝ දුරට බ්‍රිතාන්‍යයන් විය. කෙසේ වෙතත්, මුදල් නොමැති සහ සාමාන්‍යයෙන් එහි සීතල දේශගුණයට එකඟ නොවූ දේශීය ජනගහනය එවැනි වටපිටාවෙන් සැනසීමක් ලබා ගත්තේ නැත. මේ හේතුව නිසා නුවරඑළිය නගරයේ වාසය කළේ සිංහල, දෙමළ සහ මුවර්ස් සුළු පිරිසක් පමණි. එසේ වුවද, වැවිලි හා වාණිජ කටයුතු සඳහා ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස නගරය වර්ධනය වීම වඩාත් විවිධාකාර ජනගහනයක් ආකර්ෂණය කර ගත්තේය. බ්‍රිතාන්‍ය යුගයේ පසු කාලීනව වඩාත් නිශ්චිතව කිවහොත් **1918** පළමු ලෝක යුද්ධය අවසන් වන විට තවත් ශ්‍රී ලාංකිකයන් නුවරඑළියේ ඉඩම් මිලදී ගෙන නිවාස තනා ගත් බව ද පැවසේ.

යටත් විජිතකරණය වූ ලංකාව සිහිපත් කරන විට, දිවයිනේ නිදහසට පෙර අවසන් ජනපදිකයා වූ මහා බ්‍රිතාන්‍යයේ බලපෑම වඩාත් කැපී පෙනේ. බ්‍රිතාන්‍ය යුගයේ රාජ්‍ය මැදිහත්වීම් සහ ආර්ථික ප්‍රසාරණය හරහා ශ්‍රී ලාංකීය සමාජය තුළ සිදු වූ විශාල පරිවර්තනය විශිෂ්ටයි. වැවිලි හා කෘෂිකර්මාන්තයෙන් බලපෑම වාසිදායක හෝ අවාසිදායක යැයි තර්ක කළ හැකි ප්‍රවාහනය, පරිපාලනය, අධ්‍යාපන ක්‍රමය ආදී සෑම අංශයකටම පාහේ ව්‍යාප්ත විය. කෙසේ වෙතත්, බොහෝ ශ්‍රී ලාංකිකයන් තවමත් බ්‍රිතාන්‍ය චාරිත්‍ර වාරිත්‍ර යම් ප්‍රමාණයකට ජීවත් වන අතර එය පිළිපදින්නේ සමාජයෙන් සහමුලින්ම තුරන් කළ නොහැකි තරම් එකී බැඳීම තවමත් ප්‍රබල වීම නිසා විය හැකිය එකල ඉදිකරන ලද ගොඩනැගිලි 129ක් නුවරඑළියේ සංරක්ෂිත ගොඩනැඟිලි ලෙස හඳුනාගෙන **2004 - 2022** කාලසීමාව සඳහා සකස් කළ සංවර්ධන සැලැස්මටඇතුළත් කර ඇත.

නුවරඑළියේ සමකාලීන ඉතිහාසය

නිදහසින් පසු නුවරඑළිය ප්‍රදේශයට සංක්‍රමණය වීම ක්‍රමයෙන් වැඩි වූ අතර ප්‍රදේශයේ ජනාවාස සංවර්ධනය ද සිදු විය. 20 වැනි සියවසේ මුල් භාගයේ ප්‍රදේශයේ උඩරට එළවළු වගාව සහ පෙයාර්ස් වගා ප්‍රදේශ දක්නට ලැබේ. 1969 වසරේ නුවරඑළිය ප්‍රදේශයෙන් අර්තාපල් වගාව ආරම්භ කරන ලදී. ප්‍රදේශයේ නැරඹුම් ස්ථානවල හෝටල් ඉදිකිරීම හේතුවෙන් 20 වැනි සියවසේ අග භාගයේදී නුවරඑළිය ක්‍රමයෙන් දියුණුවට පත් විය.

නුවරඑළිය සංවර්ධයට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ 1970 සහ 1980 දශක දෙකක වගාබිම් ආශ්‍රිත පවුල් පදිංචි කිරීමත්, 1983 සිවිල් කෝලාහලයෙන් පසු නගර මධ්‍ය ප්‍රදේශයේ දේපළ විනාශ වීමෙන් පසු ඉඩම් සංවර්ධනයත් සිදු වීමයි.

2.2.2. නුවරඑළිය තුල සැලසුම්මය කාර්යභාරය

ජාතික භෞතික සැලැස්ම 2015-2030

මෙකී සැලැස්මට අනුව නුවරඑළිය මහාමාර්ග හා දුම්රිය ජාලය සම්බන්ධ කරන දිස්ත්‍රික්කයේ අගනුවරක් ලෙස හඳුනාගෙන ඇත. 2030 සඳහා නුවරඑළියේ ඉලක්කගත ජනගහනය දළ වශයෙන් 47,000 කි. නගරය 'මධ්‍යම පරිසර සංවේදී කලාපය' යටතේ වර්ගීකරණය කරන ලද අතර එමඟින් ප්‍රදේශයේ ඉදිරි සංවර්ධන කටයුතු සීමා කර ඇත. රටේ ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම සඳහා යෝජිත ආරක්ෂිත ප්‍රදේශ ජාලය යටතේ නගරය තවදුරටත් 'මධ්‍යම සංවේදී කලාපයට' ඇතුළත් කරන ලදී. මෙමගින් නුවරඑළිය දීර්ඝ පැවැත්මක් සඳහා එහි සංවර්ධනය හා ව්‍යාප්තිය පාලනයට හා සීමා කිරීමට සිදු විය. නගරය පාරිසරික සංචාරක ප්‍රදේශයක් සහ විභව පුරාවිද්‍යා සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙසද හඳුනාගෙන ඇත.

නුවරඑළියට බලපෑම් කිරීමට නියමිත ජාතික ව්‍යාපෘති අතරට හෝටල්, ප්‍රවේශ මාර්ග, තොරතුරු මධ්‍යස්ථාන ඇතුළු පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම මෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නුවරඑළිය ප්‍රදේශයේ 60% ට වැඩි බෑවුම් සහිත කලාප වල දැනට වගා කර ඇති ප්‍රදේශයන්හි (හෙක්ටයාර් 15870) වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාමාර්ගද බලපෑමක් කරන බව දක්නට ලැබේ. සුළං බලාගාරයක් සහ තොරතුරු තාක්ෂණ උද්‍යානයක් නගරයේ ස්ථාපිත කිරීමට ද යෝජනා වී ඇත.

ජාතික භෞතික සැලැස්ම 2050

සංශෝධිත ජාතික භෞතික සැලැස්ම 2050 සම්බන්ධයෙන් ගත් කල, නුවරඑළිය 'මධ්‍යම අධි සංවේදී ප්‍රදේශය' යටතේ හඳුනාගෙන ඇත එය නායයෑම්වලට බෙහෙවින් ගොදුරු විය හැකි සහ ජල සම්පත පවත්වා ගැනීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන සංවේදී ස්වභාවික පරිසර පද්ධති සහිත ඉඩම්වලින් සමන්විත භූගෝලීය කලාපයකි.

තවද, නුවරඑළිය ආර්ථික ක්‍රියාකාරකම්, නාගරික පහසුකම් සහ නේවාසික ජනගහනයෙන් සාපේක්ෂ වශයෙන් ඉතා ඉහල තත්ත්වයක් පෙන්නුම්කරන 'ප්‍රධාන නගරයක්' ලෙස හඳුනාගෙන ඇති අතර සාධාරණ ලෙස විශාල භූමි ප්‍රදේශයකට ඉහළ පෙළේ සේවා මධ්‍යස්ථානය ලෙස සේවය කරයි. මෙම ප්‍රතිපත්තිය තුළ, 'ප්‍රධාන නගරයක්' ලෙස අර්ථ දක්වන්නේ අවම වශයෙන් 100,000 ජනගහනයක් සහිත ප්‍රදේශයක් සහ වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 100 - 500 අතර ශුද්ධ නේවාසික ජනගහන ඝනත්වයකි. . එහෙයින්, නුවරඑළිය ස්වාධීන මධ්‍ය පරිමාණ නාගරික පහසුකම් සහිත ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත වන අතර ජනගහනය 100,000-200,000 අතර වෙනස් වේ. කෙසේ වෙතත්, හඳුනාගෙන ඇති 'ප්‍රධාන නගර' අතරින් නුවරඑළිය එහි පවතින සංවේදී පාරිසරික තත්ත්වයන් හේතුවෙන් අනාගතයේදී එහි වැඩි ජනගහනය වෙනත් ස්ථානයකට යොමු කිරීමට අවශ්‍ය විය හැකි බව සැලැස්ම අවධාරණය කරයි.

නුවරඑළිය ඉතා පාරිසරික සංවේදී ප්‍රදේශයකට උරුමකම් කියන බැවින් යම් සීමාසහිත සංවර්ධනයක් සහිතව පාරිසරික සංචාරක සංකල්ප මත ප්‍රවර්ධනය කළ යුතු සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංචාරක සංවර්ධන උපාය මාර්ග හරහා හඳුනාගෙන ඇත

*රූප සටහන **2.3:** ජාතික භෞතික ව්‍යුහ සැලැස්ම **2030***



*රූප සටහන**2.4:** ජාතික භෞතික ව්‍යුහ සැලැස්ම **2050***



*රූප සටහන **2.5:** සංචාරක ප්‍රදේශ-ජාතික භෞතික ව්‍යුහ සැලැස්ම – **2050***



ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම 2017-2020

මෙකි සැලැස්ම හරහා හඳුනාගෙන ඇති දකුණු කොරිඩෝවෙන් කොළඹ, ගාල්ල, මිරිස්ස සහ යාල යා කරන ප්‍රධානම සංචාරක මාර්ගයේ එක් ගමනාන්තයක් ලෙස නුවරඑළිය හඳුනාගෙන ඇති අතර ඉන් අනතුරුව හෝටන් තැන්න, පොළොන්නරුව සහ සීගිරිය දක්වා විහිදේ එය විහිදෙනු ඇත

*රූප සටහන **2.6:** ශ්‍රී ලංකාවේ සංචාරක මංපෙත්*



සංචාරක ආකර්ශණයක් සමග නැගී එන සංචාරක මධ්‍යස්ථානයක් ලෙඅ මෙන්ම ජීවත් වන්නන් හට හා පැමිණෙන්නන් හට නේවාසික පුරවරයක් ලෙස සංවර්ධනය වන කේන්ද්‍රස්ථානයක්' ලෙස නුවරඑළිය වර්ගීකරණය කර ඇත. තවද සහාය සේවා සඳහා මහනුවර ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස සලකා සංචාරක මාර්ග හරහා සම්බන්ධතා පවත්වා ගැනීමට ද අපේක්ෂා කෙරේ.

සංචාරක මධ්‍යස්ථාන වෙත සීඝ්‍රගාමී සුඛෝපභෝගී දුම්රිය සේවා ආරම්භ කිරීම සඳහා පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ද යෝජනා කර ඇත. නුවරඑළිය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.

*රූප සටහන **2.7:** සංචාරක සිතියම- ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම*



නුවරඑළිය මහ නගර සභාවේ මායිම් සහ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව නුවරඑළිය මහ නගර සභාවේ ග්‍රාම නිලධාරී වසම් 12ක් සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ග්‍රාම නිලධාරී වසම් 18ක් සැලැස්මට අනුව සලකා බලනු ලැබේ

සැලැස්මේ දැක්ම වන්නේ නගරයට ආවේණික සහ පාරම්පරික පරිසරය ආරක්ෂා කරමින් එය නිසි නේවාසික ප්‍රදේශයක් සහ සංචාරක ගමනාන්තයක් බවට පත් කරන අතරම තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ප්‍රමුඛත්වය දීමයි. ඒ අනුව ඉලක්ක වන්නේ;

- ස්වභාවික පරිසරය සුරැකීම සහ නගරයේ ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම
- නගරයේ ප්‍රතිරූපය ආරක්ෂා කිරීම සඳහා ආවේණික සහ උරුම ලක්ෂණ වැඩි දියුණු කිරීම
- ආර්ථිකයෙන් පරිපූරණ සමෘද්ධිමත් කලාපයක් නිර්මාණය කිරීම

නියමිත දැක්ම කරා යොමු කිරීම සඳහා යටිතල පහසුකම්, ආර්ථික සහ පරිසරය යටතේ බොහෝ උපාය මාර්ග යෝජනා කර ඇත.

නුවරඑළිය සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්ම - 2032

නුවරඑළිය සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්ම (TDMP) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා සිදු කරන ලද උපදේශන පැවරුමක කොටසක් ලෙස සකස් කර ඇත.

නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කිරීමට සමගාමීව නුවරඑළිය සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සිදු කරන ලද්දේ ඒවායේ සිදුවන බලපෑම් සැලකිල්ලට ගෙනය. නුවරඑළිය හි සැලසුම් මායිම නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දක්වා විහිදී යයි.

නුවරඑළිය සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්මෙහි සංකල්ප සැලැස්ම

ප්‍රදේශයේ භූගෝලීය සැකැස්ම සහ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන සලකා බලා නුවරඑළිය මෙහි සංකල්ප සැලැස්ම සකස් කර ඇත.

*රූප සටහන **2.8:** ප්‍රදේශයේ භූගෝලීය සැකසුම*



*රූප සටහන **2.9 :** ප්‍රදේශයේ භූගෝලීය සැකසුම*



නුවරඑළිය නගර මධ්‍ය යනු පිදුරුතගල, කඳපොල, හග්ගල කන්ද, කොන්සිකල් හිල් සහ තනි ගස් කන්ද යන කඳු පරාසයකින් වට වූ මුහුදු මට්ටමේ සිට අඩි 150 උසින් පිහිටි ද්‍රෝණි නගරයකි.

මෙම සැලැස්ම ප්‍රකාරව පහත සිතියමේ දැක්වෙන පරිදි සම්පූර්ණ නුවරඑළිය ප්‍රදේශය කොරිඩෝ/පොකුරු 5කට බෙදා ඇත.

*රූප සටහන **2. 10:** සංචාරක සැලැස්මේ සංකල්පය*



*වගු අංක **2.2:** : සංචාරක සංවර්ධන සැලැස්මේ සංකල්පය*

කලාපය	ප්‍රධාන ලක්ෂණ	ආවරණය වන ප්‍රදේශය
කලාප 1 - නුවරඑළිය මධ්‍යම සංචාරක ප්‍රදේශය	මෙම ප්‍රදේශය ප්‍රධාන වශයෙන් ග්‍රෙගරි වැව, වික්ටෝරියා උද්‍යානය, තුරඟ පිටිය සහ නගර ප්‍රදේශය පදනම් කරගෙන මධ්‍යම නගර ප්‍රදේශය ආවරණය කරයි. මෙම ප්‍රදේශය නවාතැන්, වාණිජ සහ සංචාරක සේවා ක්‍රියාකාරකම් සහිත මධ්‍යම සංචාරක පහසුකම් ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇත. මීට අමතරව, ග්‍රෙගරි වැව, වික්ටෝරියා උද්‍යානය ආශ්‍රිත ප්‍රදේශය විනෝදාත්මක ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත..	ග්‍රෙගරි වැව , වික්ටෝරිය උද්‍යානය , නගර මධ්‍යය අයත්ය. මෙම ප්‍රදේශයේ මායිම වන්නේ නගර මධ්‍යය වටා ඇති උස් කඳු වැටියයි.
කලාප 2 - තේ සංචාරක පොකුරු කලාපය	හැටන්, තලවාකැලේ, ආගරපතන ප්‍රදේශයේ කොටසක තේ වතු මෙම කලාපය සඳහා ගනු ලැබේ. මෙම ප්‍රදේශ සාපේක්ෂව මධ්‍යම මට්ටමේ මානව පරිමාණ කඳු වැටි ඇති අතර තේ වතු ලෙස භාවිතා වේ. මෙම පොකුර හැටන් - නුවරඑළිය මාර්ගය පදනම් කර ගෙන ඇත.	හැටන්, තලවාකැලේ, ආගරපතන ප්‍රදේශයේ කොටසක සිට තේ වතු.
කලාප 3 - හග්ගල මල් සහ එළවළු කොරිඩෝව	මෙම පොකුර නුවරඑළිය - වැලිමඩ මාර්ගය දෙපස පිහිටා ඇත. මෙම පොකුර නුවරඑළිය නගර මධ්‍ය ප්‍රදේශයට සාපේක්ෂව පහත වැටීමේ උන්නතාංශයක් ඇත. මෙම ප්‍රදේශ බොහෝ දුරට එළවළු, පලතුරු සහ මල් වගාව සඳහා යොදාගෙන ඇත. හග්ගල උද්‍යානය මෙම ප්‍රදේශයේ පිහිටි සුප්‍රසිද්ධ සංචාරක ආකර්ෂණයකි	සීතඑළිය, හග්ගල සහ සඳ තැන්න
කලාප 4 - දිනපොත සහ පලතුරු රාමු කරන ප්‍රදේශය	නුවරඑළිය හෝර්ටන් තැන්න මාර්ගය මුල්කරගෙන මෙම පොකුර පිහිටා ඇති අතර එයටම ආවේණික මනරම් දර්ශන ඇත. මෙම ප්‍රදේශය බොහෝ ආකර්ශනීය ස්ථාන සහ විවිධ භූ දර්ශන ලක්ෂණ ඇත. මෙම පොකුර අවසන් වන විට වැඩිම ඉල්ලුමක් ඇති ලෝක ප්‍රසිද්ධ හෝර්ටන් තැන්න හමුවෙයි. එමෙන්ම අඹේවෙල, පට්ටිපොල සහ ඔහිය යන ප්‍රසිද්ධ දුම්රිය ස්ථාන ද ඇත. කන්දේ ඇල ජලාශය සහ කළු තටාක වැව ප්‍රදේශය ද මෙම ප්‍රදේශයේ ප්‍රධාන ආකර්ෂණයන් වේ. සුප්‍රසිද්ධ කිරි ආශ්‍රිත ගොවිපල සහ ස්ට්‍රෝබෙරි ගොවිපල පැවතීම හේතුවෙන් මෙම පොකුර වැඩිපුරම සංචාරය කරන ප්‍රදේශයකි.	මීපිලිමාන, කන්දේ ඇල, අඹේවෙල, පට්ටිපොල
කලාප 5 - හෝටන් තැන්න	ඉහළ සංවේදීතාව, විශේෂ ස්වභාවය සහ ඉහළ සංචාරක ආකර්ෂණය හේතුවෙන් හෝර්ටන් තැන්න වෙනම පොකුරක් ලෙස සැලකේ.	හෝර්ටන් තැන්න, ඔහිය

නුවරඑළිය සංචාරක සංවර්ධන ප්‍රධාන සැලැස්ම පොකුරු සහ සංචාරක මංපෙත් දෙකක් මත සංවර්ධනය කර ඇත;

- **දියඇලි සංචාර මංපෙත - නුවරඑළිය මෙම සැලසුම් ප්‍රදේශයේ සහ ඒ අවට පිහිටි දිය ඇලි 20 කට වැඩි සංඛ්‍යාවක් පිහිටා ඇති ස්ථාන පදනම් කරගෙන දිය ඇලි සංචාරක මංපෙත යෝජනා කර ඇත. මෙම සම්පූර්ණ දිය ඇලි අතරින් දිය ඇලි කිහිපයක් නුවරඑළිය සංවර්ධන සැලසුම් කලාපයට අයත් වේ.**
- **දුම්රිය චාරිකා මාර්ගය - නානුඔය, අඹේවෙල, පට්ටිපොල සහ ඔහිය දුම්රිය ස්ථාන සම්බන්ධ කරමින් දුම්රිය සංචාර මාර්ගයක් යෝජනා කර ඇත. මෙම දුම්රිය ස්ථාන කිසිවක් නුවරඑළිය සංවර්ධන සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා නොතිබුණද, මෙම දුම්රිය ස්ථාන නගර මධ්‍යය සමඟ සම්බන්ධ කිරීමේදී එය බලපෑමක් ඇති කරයි.**

2.2.3. ජාතික සහ කලාපීය සම්බන්ධතා

සම්බන්ධතාවය හෝ ප්‍රවේශ්‍යතාව යනු දේශීය මට්ටම සමඟ ගෝලීය මට්ටම හා සම්බන්ධ වීමට ඉඩ සලසන ඕනෑම ගමනාන්තයක මූලික වේ. අවකාශීය සැලසුම්කරණයේදී සාමාන්‍යයෙන් සැලකිලිමත් වන්නේ ඉතා ඉහල සම්බන්ධිත ප්‍රවේශ්‍යතාව තුලින් සංවර්ධනයට ඇති හැකියාව වැඩි බවයි. ඒ අනුව, විවිධ ප්‍රවාහන ක්‍රම හරහා නුවරඑළිය සම්බන්ධ කිරීම ගැන සලකා බලන විට, දුම්රිය හා මාර්ග ජාල ප්‍රවාහන සම්බන්ධතා ඇගයීමේදී මධ්‍යස්ථ සම්බන්ධතා මට්ටමක් පෙනේ.

*රූප සටහන **2.0.11:** ජාතික මට්ටමෙහි පවතින සම්බන්ධතාවය*



මෙම භූමිය පදනම් කරගත් ප්‍රවාහන ජාල හැරුණු විට, දැනට ජලය පදනම් කරගත් ගුවන් යානා සංසරණයට ද හැකියාවක් පවතී. දැනට හැටන් කාසල්රී ජලාශය සහ ග්‍රෙගරි වැව 'සී ප්ලේන්' ක්‍රියාකාරකම් සඳහා යොදාගනු ලබන අතරම නුවරඑළිය මැද බැරැක් ප්ලේන් සහ කන්දේ ඇළ වැනි ජලාශවල ද එම හැකියාව පවතිනබව දක්නට ලැබේ.

දුම්රිය ප්‍රවාහන සම්බන්ධතා

මහනුවර සිට ඇල්ල දක්වා ආරම්භ වන සුප්‍රසිද්ධ උඩරට දුම්රිය ගමන නුවරඑළියට ආසන්නතම දුම්රිය ගමනාන්තය ලෙස සැලකෙන නානුඔය දුම්රිය ස්ථානය හරහා ගමන් කරයි. කොළඹ - මඩකලපුව (A7) මහා මාර්ගය ඔස්සේ නානුඔය දුම්රිය ස්ථානයේ සිට නුවරඑළිය නගරයට ගමන් දුර ආසන්න වශයෙන් කිලෝමීටර් 9 කි. වත්මන් දුම්රිය ජාලය නානුඔය හරහා ඇල්ල දෙසට දිව යන මාර්ගය තුල පට්ටිපොල දුම්රිය ස්ථානය ඒ අතර පිහිටි උසම දුම්රිය ස්ථානය (අඩි 6204) ලෙස සැලකේ. උඩරට වගා කරන වැවිලි නිෂ්පාදන ගමනාගමන හා ප්‍රවාහන අවශ්‍යතා සඳහා මෙම මාර්ගය මුලින් ඉදිකරන ලදී.

බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ශ්‍රීමත් වෙස්ට් රිජ්වේ විසින් යෝජනා කරන ලද නානුඔය සහ උඩුපුස්සැල්ලාව අතර සම්බන්ධක මාර්ගය 1900 වර්ෂයේදී ඉදිකරන ලද අතර එහි පළමු අදියර 1903 දී ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර එය නානුඔයෙන් ආරම්භ වී නුවරඑළිය දක්වා දිවෙයි. 1940 ගණන් වලදී බ්‍රිතාන්‍ය කළමනාකාරිත්වය විසින් මෙම දුම්රිය මාර්ගය සම්පූර්ණයෙන්ම වසා දමා ඇති අතර මෙතෙක් එය නොසලකා හරින ලද සම්බන්ධතාවයක් ලෙස යම් යම් ශේෂ වූ ලක්ෂණ සහිතව දක්නට ලැබේ.

එසේම, තම විවේකි කාලයන්හි සංචරය කරන නානුඔය පසු කර යන දේශීය හා විදේශීය සංචාරකයන් හට පහසුවක් වීම පිණිස නියමිත් කාලයන් දැක්වෙන දුම්රිය කාලසටහනක් නානුඔය සුම්රිය ස්ථානයේ සක්නට ඇති අතර එය පහත පරිදි වේ.

*වගු අංක **2.3:** නානුඔය හරහා දිවෙන දුම්රිය කාලසටහන්*

කොළඹ කොටුවේ සිට නානුඔය දක්වා			
	පිටත් වීම	පැමිණීම(නානුඔයට)	ගමන් වාර
පොඩි මැණිකේ - අධිවේගී (දුම්රිය #: 1005)	05:55	12:56	දිනපතා
දෙනුවර මැණිකේ - නගරාන්තර **(දුම්රිය #: 1001)**	06:45	12:17	දිනපතා
උඩරට මැණිකේ – අධිවේගී (දුම්රිය #: 1015)	08:30	14:45	දිනපතා
(දුම්රිය #: 1007)- අධිවේගී	09:45	15:59	දිනපතා
රාත්‍රී තැපැල (දුම්රිය #: 1045)	20.00	03:03	
බදුල්ල සිට නානුඔය දක්වා			
උඩරට මැණිකේ – අධිවේගී **(දුම්රිය #: 1016)**	06:40	09:16	දිනපතා
(දුම්රිය #: 1001) - විශේෂ	08:16	10:38	පාසල් නිවාඩුව විශේෂයි
පොඩි මැණිකේ - එක්ස්ප්‍රස් **(දුම්රිය #: 1006)**	09:24	11:58	දිනපතා
(දුම්රිය #: 1008) - අධිවේගී	11:57	14:35	දිනපතා
රාත්‍රී තැපැල් - අධිවේගී (දුම්රිය #: 1046)	18:51	22:08	දිනපතා
(දුම්රිය #: 2007) - විශේෂ	20:46	23:01	අගෝස්තු පාසල් නිවාඩුව විශේෂයි
මහනුවර සිට නානුඔය දක්වා			
(දුම්රිය #: 1126)	03:30	09:02	දිනපතා
පොඩි මැණිකේ - අධිවේගී **(දුම්රිය #: 1005)**	09:05	12:56	දිනපතා
උඩරට මැණිකේ – අධිවේගී (දුම්රිය #: 1015)	11:10	14:45	දිනපතා

*රූප සටහන **2. 12:** දුම්රිය ප්‍රවාහන සම්බන්ධතා*



මාර්ග ප්‍රවාහන සම්බන්ධතා

දිවයිනේ මධ්‍යයේ පිහිටා ඇති නුවරඑළිය, උතුරේ මහනුවර සිට (A5), ඊසාන දෙසින් කඳපොල සිට (B332), වැලිමඩ සිට නැගෙනහිරින් රේන්දපොල හරහා (A5), දකුණේ සිට ඔහිය (අඹේවෙල පාර) ලෙස දිශාවන් පහකින් පහසුවෙන් ළඟා විය හැකිය. සහ බටහිර සිට හැටන් (B381). උතුරු හා බස්නාහිර සම්බන්ධතා නුවරඑළිය දෙසට වඩාත් ජනප්‍රිය මාර්ග ප්‍රවේශය ලෙස සැලකේ. A5 මාර්ගය හරහා මහනුවර හා සම්බන්ධ වන උතුරු සම්බන්ධතාවය පේරාදෙණිය, ගම්පොල සහ රම්බොඩ හරහා ගමන් කරයි. මෙම සම්බන්ධතාවයේ කිලෝමීටර 76 ක දුරක් ගමන් කිරීමට පැය 2 විනාඩි 30 ක් ගතවේ. නාවලපිටියේ සිට කොත්මලේ හරහා දිවෙන මාර්ගය තවලන්තැන්නේදී මෙම A5 මාර්ගය හා සම්බන්ධ වේ. කොළඹ සිට අවිස්සාවේල්ල හරහා හැටන් මාර්ගය **(A7)** දක්වා දිවෙන දෙවන සුප්‍රසිද්ධ සම්බන්ධතාවය හැටන් - නුවරඑළිය මාර්ගයට **(B831)** සම්බන්ධ වන අතර මෙම කිලෝමීටර **175** දුර ගමන් කිරීමට ආසන්න වශයෙන් පැය **5** ක් ගතවේ.

දැනට පවතින මාර්ග ජාලය කලාපීය සහ ප්‍රාදේශීය සන්දර්භය තුළ පොදු ප්‍රවාහන බස් සේවා සඳහා පහසුකම් සපයයි. ඒ අනුව, නුවරඑළිය ඍජුව සම්බන්ධිත ප්‍රාදේශීය බස් මාර්ග 8 කින්, ප්‍රාදේශීය බස් මාර්ග හරහා ගමන් කරන මාර්ග 4 කින් සහ දේශීයව සම්බන්ධ බස් මාර්ග 8 කින් සමන්විත වේ.

*රූප සටහන **2.13:** නුවරඑළියට ප්‍රධාන මාර්ග සම්බන්ධතාව*



- ගුවන් ප්‍රවාහන සම්බන්ධතා

අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය රටේ ප්‍රවණතා ගමන් කරන ආකාරය පෙන්නුම් කෙරේ. මෙම ප්‍රවණතාවයට පහසුකම් සැලසීම සඳහා සැලකිය යුතු ගමනාන්තයක ක්‍රියාත්මක වන බොහෝ අභ්‍යන්තර ගුවන් තොටුපලවල් සහ මුහුදු ගුවන් යානා රට තුළ ප්‍රධා වශයෙන් පහසුකම් සලසා ඇත. අභ්‍යන්තර ප්‍රවාහනය, සංචාරක ව්‍යාපාරය සහ මිනිසුන්ගේ ගමනගමනයන් සක්‍රීය කිරීම සඳහා අවධානය යොමු කර ඇති අභ්‍යන්තර ගුවන් තොටුපල සහ මගී පර්යන්ත සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා ඉදිරිපත් කර ඇති යෝජනාවට අනාගතයේදී එය තවදුරටත් ප්‍රයෝජනවත් වනු ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සේවය කොළඹ සිට නගර කිහිපයකට සහ අනෙක් අතට දිනපතා විශේෂ එයාර් ටැක්සි සේවා සපයයි. මෙම නියමිත ගුවන් ගමන් පුද්ගලික කේත බෙදාගැනීමේ හවුල්කරුවෙකු විසින් මෙහෙයවනු ලබන අතර ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් කාර්යාල හරහා පිරිනමන නියමිත ගුවන් ගමන් සඳහා වෙන්කරවා ගත හැක. එයාර් ටැක්සි කොළඹ සිට නුවරඑළිය දක්වා දිනකට දෙවරක් පියාසර කරයි. මාර්ග හා දුම්රිය ගමනාගමනයට සාපේක්ෂව ගුවන් හුවමාරුව **85%** ක කාලයක් ඉතිරි කරන බැවින් එය ප්‍රවාහනය සඳහා කදිම විකල්පයකි. එපමනක් නොව, මෙය මනස්කාන්ත දර්ශන සහ දර්ශන සහිත අද්විතීය හා ආකර්ෂණීය ගමනක් නිර්මාණය කරයි.

හැටන් කාසල්රී නුවරඑළියට ආසන්නතම අභ්‍යන්තර මුහුදු තොටුපළ ලෙස ක්‍රියාකර ප්‍රවාහන සේවා පහසු කළද නුවරඑළිය මැද පිහිටි බැරැක් ප්ලේන් සහ කන්දේ ඇළ ජලාශවලද සී ප්ලේන් සංසරණයට හැකියාවක් පවතින් බව සඳහන් කලහැක. මෙම යෝජනාවේ හැකියාව අවසන්

වාර්තාවෙන් තවදුරටත් සාකච්ඡා කෙරේ. රට තුළ අභ්‍යන්තර ගුවන් තොටුපළ සහ මුහුදු වරාය ගොඩබෑමේ ස්ථාන සපයන ගුවන් කුලී රථ සේවා රූප සටහන මගින් නිරූපණය කෙරේ.

ගමනාන්ත කිහිපයක් සඳහා ගමන් කාලසීමාව සංකල්පනය කිරීමේදී පැහැදිලිවම පැහැදිලි වන්නේ ගමනාන්තයන් තුළ ගමන් කිරීමට වඩාත්ම කාලය කාර්යක්ෂම මාර්ගය ගුවන් පාදක ප්‍රවාහනයයි. එබැවින් ගමනාන්තය වීමට ඉලක්ක කරන සංචාරකයින් අතර ඔවුන්ගේ ගමනේ කාලය ගත කිරීම වෙනුවට මාදිලිය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව ඇත.

රූප සටහන **2. 14:** *සංචාරක ගමනාන්ත කිහිපයක් සඳහා ගමන් කාලය*

වගු අංක **2.4:** *ගමන් කාල සීමාවන්*

	Nuwara Eliya		Kandy		Sigiriya		Bentota		Koggala		Dikwella		Mattala	
From Colombo	6 hrs	25 mnts	4 hrs	22 mnts	5 hrs	35 mnts	2 hrs	25 mnts	3 hrs	35 mnts	6 hrs	40 mnts	7 hrs	45 mnts
From Kandy							6 hrs	30 mnts	6 hrs	35 mnts	7 hrs	40 mnts	7 hrs	40 mnts
	Arugam Bay		Trincomalee		Jaffna		Vavuniya		Kalpitiya		Battaramulla			
From Colombo	9 hrs	50 mnts	7 hrs	50 mnts	11 hrs	65 mnts	6 hrs	45 mnts	4 hrs	25 mnts	1 hr	10 mnts		
From Kandy											5 hrs	25 mnts		

2.2.4. භූගෝලීය සහ භූගෝලීය තත්ත්වය

නුවරඑළිය නගරය භූගෝලීය වශයෙන් ඉතා විචල්‍ය භූමි ඒකක සහ භූ විෂමතාවයේ එකතුවක් ඇති රටේ උසම අර්ධද්වීපයේ පිහිටා ඇත. එය ස්කන්ධ, කඳු වැටි, සානු, ද්‍රෝණි, නිම්න සහ කඳු මුදුන් සංකීර්ණයකි. නගරය පිහිටා ඇත්තේ කඳු වලින් වට වූ පැතලි සැකැස්මක් සහිත ඒක කේන්ද්‍රීය නිම්නයක ය. මේ අනුව, නුවරඑළිය චරිතයට භූමි ආකෘතිය ප්‍රධාන දායකත්වයක් සපයයි. එය දර්ශනීය හා දර්ශනීය භූ දර්ශනයක් සපයයි. ඒවා දෘශ්‍ය නිර්වචන පරාසයන්හි ප්‍රධාන අංගය වේ.

නුවරඑළියේ අර්ධද්වීපයේ දකුණු මායිම බටහිරින් ශ්‍රී පාදය (මීටර් **2,443**) සිට කිලෝමීටර් **80** කට වඩා විහිදෙන අතර හෝර්ටන් තැන්නෙන් අඩි **1.000** සිට අඩි **5,000** දක්වා ඉහළ යයි. දකුණු මායිමේ මධ්‍යයේ සිට කිරිගල්පොත්ත (මීටර් **2,395**) සිට පිදුරුතලාගල (මීටර් **2.527**) දක්වා විහිදෙන උසම සානු කලාප සහ උස් තැනිතලා උතුරු දෙසට දිව යයි.

අවට කඳුකරය හරහා නුවරඑළිය තැනිතලාවට පිවිසීමට මාර්ග හතරක් ඇත. ඊසාන-නැගෙනහිර පරතරය කොත්මලේ මිටියාවතටත්, ගිනිකොන-නැගෙනහිර පරතරය ඌව ද්‍රෝණියටත්, බටහිර පරතරය දිඹුල නිම්නයටත්, නැගෙනහිර පරතරය කඳපොළ සහ උඩපුස්සැල්ලාවටත් යොමු කරයි. නුවරඑළිය අවට තවත් සමහර වැදගත් කඳු සහ ස්ථාන නම් කිකිලිමන (මීටර් **2.239**) නුවරඑළියට වයඹ දෙසින් කිලෝමීටර් **1.6** ක් දුරින්, කුඩුගල (මීටර් **2,319**), තොටුපොළ (මීටර් **2,361**), කිරිගල්පොත්ත (මීටර් **2.387**), ලවරස් ලීප් (මීටර් **2.163**) මෙන්ම . නුවරඑළියට නැගෙනහිරින් කිලෝමීටර් **3.2** ක් දුරින් සහ නුවරඑළියට දකුණින් කිලෝමීටර් **1.6** ක් දුරින් තනි ගස් කන්ද (මීටර් **2.104**) යන ඒවා වේ.

රටේ ප්‍රධාන ගංගා සහ බහු වාර්ෂික දිය පහරවල් බොහොමයක් මෙම මධ්‍යම කඳුකරයේ ජල පෝෂක ප්‍රදේශයෙන් ආරම්භ වී පිටතට ගලා යයි. වර්තමානයේ මෙම සියලු ජලධාරා ජල සම්පාදන මූලාශ්‍රයක් ලෙස හෝ කෘෂිකාර්මික ඉඩම්වලට ජලය සැපයීම සඳහා යොදා ගනී.

2012 ජනලේඛන දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ දත්ත වලට අනුව, වනාන්තර ප්‍රමාණයෙන් **55%** ක් වර්ග කිලෝමීටර් **138** ක මුළු භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර් **76** ක් ආවරණය වන බව අනාවරණය වේ. පිදුරුතලාගල, කිකිළියමාන, තනි ගස සහ හග්ගල කඳු වැටිය ආශ්‍රිත මායිම් සීමාව තුළ ඇති අධ්‍යයන ප්‍රදේශය සලකන විට, ප්‍රදේශයේ උසම ස්ථානය මධ්‍ය දර්ශණ මට්ටමින් මීටර් **2400** ක් වන අතර පහළම මට්ටම මධ්‍ය දර්ශණ මට්ටමින් පමණක් මීටර් **1500** කි

*රූප සටහන **2.15:** නුවරඑළිය සැලසුම් ප්‍රදේශය සහ ඒ අවට භූගෝලීය සැකැස්ම*



සිතියම් අංක 2.2: භූවිෂමතා තත්ත්වය



භූ විෂමතාවය (මීටර් 20) විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම	නාගරික සංවර්ධන අධිකාරිය නුවර එළිය කාර්යාලය අගෝස්තු 2017

නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032) *සකස් කිරීම: නුවර එළිය කාර්යාලය,*

*සිතියම් අංක **2.3:** කඳු වැටි කලාපය*



භූ විෂමතාවය (මීටර් 20) විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම	නාගරික සංවර්ධන අධිකාරිය නුවර එළිය කාර්යාලය අගෝස්තු 2017
නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)	*සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං .අධි*

2.2.5. දේශගුණික තත්ත්වයන්

සෞම්‍ය උෂ්ණත්වයෙන් සැරසුණු 'පුංචි එංගලන්තය' වසර පුරා සංචාරකයන් කැඳවන්නේ එහි හිතකර උෂ්ණත්වයෙනි. උණුසුම්ම මාස වන මාර්තු සිට මැයි දක්වා සපුෂ්පක සමය එහි සුන්දරත්වයෙන් වැඩි වැඩියෙන් සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා අතර නොවැම්බර් සිට පෙබරවාරි දක්වා ශීත මාස සිසිල් වීමට වැඩි ආකර්ෂණයක් ලබා දෙයි. මෙම කඳුකරයේ සැලකිය යුතු ප්‍රදේශයක් තෙත් දේශගුණ කලාපය තුළ පිහිටා ඇති අතර කුඩා කොටසක් අතරමැදි කලාපයට අයත් වේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැදගත්කම වන්නේ දිවයිනේ වැඩිම වර්ෂාපතනය සහ අඩුම උෂ්ණත්වය වාර්තා කිරීමය. සෑම වසරකම වාගේ වැඩිම වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 5,588 ඉක්මවන්නේ වටවල ප්‍රදේශයටය. නුවරඑළිය සාමාන්‍යයෙන් අවම උෂ්ණත්වය 7.2 °C (පෙබරවාරි) පමණ අත්විඳින අතර ඉඳහිට හිමාංකයට (0 0C) පහළට වැටේ. වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් 20 ක් පමණ වන අතර ඉහළ උෂ්ණත්වය සෙල්සියස් 21 දක්වා ඉහළ යයි (ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසවලදී) දෙසැම්බර් මාසයේ උෂ්ණත්වය සෙල්සියස් 9 දක්වා අඩු වේ.

උෂ්ණත්ව රටාව

නුවරඑළියේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය මුහුදු මට්ටමේ සිට 15.9 C0 පමණ වන අතර 2018 වර්ෂය සඳහා සාමාන්‍ය උපරිම උෂ්ණත්වය අප්‍රේල් මාසයේ (ඉහළම) 23.1 0C ලෙස සටහන් වන අතර සාමාන්‍ය අවම උෂ්ණත්වය පෙබරවාරි මාසයේදී 10.3 0C ලෙස නැවත සටහන් විය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිහිටුවා ඇති නුවරඑළිය නිරීක්ෂණ මධ්‍යස්ථානවල වාර්තාවලට අනුව 2018 වර්ෂයේ මාසික සාමාන්‍ය අවම සහ උපරිම වායු උෂ්ණත්ව විචලනය රූපයේ දැක්වේ.

සාමාන්‍යයෙන් දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා මාස ශීතල මාස ලෙසද මාර්තු සිට මැයි දක්වා මාස උණුසුම් මාස ලෙසද සැලකේ. මෙම සුවිශේෂී ලක්ෂණය නගරය සංචාරක ආකර්ෂණයක් බවට පත් කිරීමට එක් ප්‍රධාන ආකර්ෂණයකි

ප්‍රස්තාර අංක 2..1: නුවරඑළියේ මාසික වායු උෂ්ණත්ව විචලනයන්



වර්ෂාපතන රටාව

නුවරඑළියේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය හෝ වර්ෂාපතනය මිලිමීටර් **1,900 (1968-2012** වර්ෂයන්හි දත්ත) වන අතර එය මිලිමීටර් **70-225** අතර මාසික වර්ෂාපතන පරාසයක් දක්වයි. **2018** වර්ෂයේ නුවරඑළියේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් **2,173**ක් ලෙස වාර්තා වේ. සාමාන්‍යයෙන් උපරිම වර්ෂාපතනය ඔක්තෝබර් මාසයේ ද අවම වර්ෂාපතනය මාර්තු මාසයේ ද වාර්තා වේ. ගිනිගත්හේන (මි.මී. **3,267),** වටවල (මි.මී. **3,252)** සහ නෝටන් (මි.මී. **3,121)** වැනි ප්‍රදේශ අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව උපරිම අගයන් කරා ළඟා වන බැවින් වාර්ෂිකව ලැබෙන වැඩිම වර්ෂාපතනය නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද වාර්තා වේ. ජනවාරි - අප්‍රේල් මාසවල වියළි දේශගුණයක් දැකිය හැක.

ප්‍රස්තාර අංක 2..2: නුවරඑළියේ මාසික වර්ෂාපතන විචලනය - 2018



මූලාශ්‍රය : https://www.worldweatheronline.com/nuwara-eliya-weather-averages/central/lk.aspx

වැසි සමයේ දෛනික ධාරිතාව ඝන මීටර් **18773** කි. වියළි කාලවලදී එය ඝන මීටර් **3830** දක්වා පහත වැටේ. ජල සම්පත පරිමාව ඝන මීටර් **19673** සිට ඝන මීටර් **4730** දක්වා වෙනස් වේ.

2. සාපේක්ෂ ආර්ද්‍රතාවය

වසරේ වියළි මාසවලදී සාමාන්‍ය සාපේක්ෂ ආර්ද්‍රතාවය අඩුය. (ජනවාරි, පෙබරවාරි සහ මාර්තු) අනෙකුත් මාසවල එය 90% ක් තරම් ඉහළ අගයක් ගනී, සූර්යාලෝකය සහිත කාලගුණය තුළ එළිමහනේ වැඩ කරන / ගමන් කරන අයට අපහසුතා සහ අධික දහඩිය ඇති කරයි. වසර තුළ එහි සාපේක්ෂ ආර්ද්‍රතාවය 65%-87% අතර වේ.

3. සූර්ය විකිරණ

සාමාන්‍යයෙන්, නගර දෙකෙහිම පවතින අව් රශ්මිය නිසා, නුවරඑළියේ පෙබරවාරි සහ මාර්තු මාසවල සූර්ය විකිරණ කොළඹට සමාන වේ. කෙසේ වෙතත්, අප්‍රේල් සිට ජනවාරි දක්වා මාස සඳහා කොළඹට වඩා නුවරඑළියේ වලාකුළු ආවරණය වැඩිය. මෙම අංගයන් සම්බන්ධයෙන් ගත් කල, නුවරඑළිය ලොව පුරා නරඹන්නන් ආකර්ෂණය කරන අද්විතීය නගරයක් ලෙස හැඳින්වේ.

2.2.6. ඉඩම් පරිහරණ රටාව

සැලසුම් ප්‍රදේශය විවිධ ඉඩම් පරිහරණයන්ගෙන් සමන්විත වන අතර මේ සියලු භාවිතයන් පාහේ ගොඩනැගී ඇත්තේ වැවිලි, කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය සහ මිනිසාගේ එදිනෙදා ජීවිතය සඳහා පහසුකම් සැලසීමේ සන්දර්භයකින් සමන්විතව වේ. ඉඩම් පරිහරණ රටාවෙහි සංයුතියට අනුව, ස්වාභාවික වනාන්තර, තේ සහ අනෙකුත් වැවිලි ඉඩම් පරිහරණ ව්‍යාප්තිය ඉහළ ප්‍රමාණය වාර්තා කරයි.ඉඩම් පරිහරණ ව්‍යාප්තිය ප්‍රතිශතයක් ලෙස පහත වගුවේ දක්වා ඇති අතර එය පහත සිතියමේ පෙන්වා ඇත.

*වගු අංක **2.5:** ඉඩම් පරිහරණ රටාව*

භාවිතය	ප්‍රමාණය (ව.කි.මී)	ප්‍රතිශතය %
කෘෂිකාර්මික	8.542094	16.14
ගෘහස්ථ කෘෂිකාර්මික	0.435727	..82
තෘණ භූමි	0.536586	1.01
විවෘතභූමි	0.001245	-
ලඳු කැලෑ	0.61077	1.15
වෙනත්	13.323327	25.17
වනාන්තර	18.303947	34.58
හිස්භූමි	.051038	0.1
ජලාශ,ගංගා ,ඇලමාර්ග	.570771	1.08
සුසාන භූමි	0.014599	.03
මාර්ග	1.118242	2.11
ගෙවතු	5.419658	10.24
නේවාසික	0.809755	1.58
සංචාරක	0.513177	1
වතු නිවාස	0.396977	0.75
වානිජ	0.171573	0.32
අධ්‍යාපන	0.155151	0.29
කර්මාන්ත	0.149338	0.28
ආයතන	0.151008	0.29
ක්‍රීඩා භූමි	0.372297	0.7
සෞඛ්‍ය	0.025226	0.05
රජයේ නිවාස	0.11222	0.02
ආගමික ස්ථාන	0.045664	0.09
උද්‍යාන	0.236061	0.44
එකතුව	**52.06**	**100**

2.2.7. ජල මූලාශ්‍ර

රූප සටහන ***2.16 :*** *ජල මූලාශ්‍ර*



එසේම ප්‍රධාන කඳුපන්තීන් හා වනාන්තර පද්ධතියට සමගාමීව ජල මූලාශ්‍ර පද්ධත්දතියද විශේෂත්වයක් ගනී. ප්‍රධාන ජල මාර්ග ලෙස නානුඔය ඇල හා ඒහි අතුරු ඇල මාර්ග , බැරැක්ප්ලේන් ඇල,කටුමාන ඇල හදුනාගත හැකිවේ.ඒසේම ග්‍රෙගරි වැව,බැරැක් ප්ලේන් වැව.කටුමාන වැව් ද පිහිටා ඇත.මෙම සියළුම ජල මූලිශ්‍ර මහවැලි ගඟේ ජල පෝෂක මූලාශ්‍ර වේ.විසල් සංවර්ධන සැලසුම් කලාපය තුල හෙක්ටයාර 55.5 ප්‍රමාණයක් එනම් මුළු භූමි ප්‍රමානයෙන් 1.08% ක් ජලයේ වැසී ඇත.ප්‍රධාන ජල මාර්ගය වන නානු ඔය ඇල කි.මී.8 පමන දිගින් සමන්විත වන අතර ග්‍රෙගරි වැව හෙක්.90ක් පමණ හා බැරැක් ප්ලේන් ජලාශය හෙක්.40 පමණ වේ.

සිතියම් අංක ***2.4:*** *ඉඩම් පරිහරණ රටාව*



2.2.8. ජනගහනය ආශ්‍රිත ලක්ෂණ

4. ජනගහන වියප්තිය හා ජනගහන වර්ධනය වෙනස්කම්

නුවරඑළිය නගරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයේ වන මෙන්ම පරිපාලන නගරය වන අතර ජාත්‍යන්තර වශයෙන් සංචාරක කේන්ද්‍රස්ථානයක් වශයෙන් ද සංවේදි පරිසර පද්ධතියක් හිමි ජාතික වැදගත්කමකින් යුත් ප්‍රදේශයකි.නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ ජනගහනය සම්බන්ධව අධ්‍යනය කිරීමේදි පැරණිම දත්ත ලෙස **1881** දි ජනගහනය **1791** ක් ලෙස නිවාස **264** ලෙස ද වාර්තාවේ. නුවරඑළිය මහ නගර සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය වගු අංක 3.3 මගින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් විසල් නුවරඑළිය අධ්‍යන සීමාව සඳහා අයත් වන සමස්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහන ව්‍යාප්තිය හා ජනගහන වර්ධනය වෙනස් වීම් වගු මගින් පෙන්නුම් කෙරේ

*වගු අංක **2.6:** නුවරඑළිය මහ නගර සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය*

වසර	ජනගහනය	ජනගහනය වර්ධනය	ජනගහන ඝනත්වය	වසර	ජනගහනය	ජනගහනය වර්ධනය	ජනගහන ඝනත්වය
1871	1291	-	-	1931	7823	.4	5
1881	1791	1.5	1	1946	10823	2.5	7
1891	2726	5.2	2	1953	14405	4.7	10
1901	5026	8.4	3	1963	15482	.7	10
1911	7406	4.7	5	1971	17880	1.5	11
1921	7525	.76	5	1981	20471	1.8	14

*මූලාශ්‍රය - **2004-2018** නුවරඑළිය නගර සංවර්ධන සැලැස්ම*

ඒ අනුව පැහැදිලිව පෙනි යනු ලබන්නේ නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ සමස්තයක් ලෙස ජනගහන වර්ධනය **2002** ට සාපෙක්ෂව **2012** දි ඍණ අගයක් ගන්නා අතර **2017** දි එම අගය තරමක් දුරට **(-0.035)** දක්වා අඩු වී ඇත.

වගු අංක 2.7- අධ්‍යයන සීමාවේ ජනගහනයේ ප්‍රසාරණය

	පළාත් පාලන බල ප්‍රදේශය	ග්‍රාම නිලධාරී කොට්ඨාශ	කොට්ඨාශ අංකය	ජනගහනය (2002)	ජනගහනය (2012)	2012 ජනගහන වර්ධනය 2002ට සාපේක්ෂව	ජනගහනය (2017)	2017ජනගහන වර්ධනය 2002ට සාපේක්ෂව
1	නුවරඑළිය මහ	බඹරකැලේ	**535K**	3557	**3143**	-1.23	3340	-0.42
2		හාවාඑළිය නැගෙනහිර	**535H**	2337	**2273**	-0.24	2416	0.24
3		හාවාඑළිය උතුර	**535G**	2686	**2216**	-1.94	2355	-0.88
4		හාවාඑළිය බටහිර	**535F**	1888	**2072**	0.93	2202	1.03
5		කලුකැලේ	**535B**	1131	**1093**	-0.35	1162	0.18
6		කැලේගාල	**535C**	1874	**1829**	-0.25	1944	0.24
7		මාගස්තොට	**535A**	1578	**1408**	-0.75	1496	-0.10
8		නුවරඑළිය	**535**	1878	**1290**	-3.69	1371	-2.08
9		නුවරඑළිය මධ්‍යම	**535D**	4712	**4292**	-0.93	4561	-0.22
10		නුවරඑළිය බටහිර	**535L**	4540	**2481**	-0.24	4637	0.24
11		සඳතැන්න	**535E**	2803	**2816**	0	2993	0.43
12		කලාපුර	**535N**	3210	**3465**	0.77	3682	0.92
13	නුවරඑළිය ප්‍රාදේශීය සභා	බංගලාහත	**476C**	3166	**3333**	0.5	3542	0.75
14		බුලුඇල	**535I**	1674	**1751**	0.4	18691	0.70
15		කොන්කෝඩියා	**534F**	3552	**3758**	0.56	3994	0.78
16		ගල්පාලම	**534A**	1223	**1272**	0.39	1299	0.04
17		ගොරඩිහෙල	**478**	1409	**1352**	-0.42	1432	0.13
18		ජයලංකා	**534B**	1428	**1431**	0.02	1521	0.42
19		කනදපොල	**534**	1619	**1426**	-1.27	1515	-0.45
20		කදපොල මධ්‍යම	**534C**	2546	**2853**	1.14	3032	1.17
21		කදපොල E	**534D**	956	**887**	-.75	943	-0.10
22		මීපිලිමාන	**476H**	1895	**2012**	0.6	2138	0.80
23		මිහිඳුපුර	**476G**	1237	**1226**	-0.09	2303	0.35
24		පාර්ක්	**534P**	4485	**4463**	-0.05	4743	0.37
25		පීඩෘ	**534H**	3110	**3316**	.0.64	3524	0.82
26		රුවන් එළිය	**476D**	2676	**2972**	1.05	3158	1.11
27		සීතාඑළිය	**478A**	1534	**1815**	1.69	1929	1.53
28		ශාන්තිපුර	**535M**	1319	**1408**	0.65	1496	0.84
29		ටොප්පාස්	**535J**	2567	**2757**	0.71	2930	
30		වින්ඩිකෝනර්	**476E**	1613	**1667**	0.33	1672	1.62
		එකතුව		77364	98467		102451	

විශේෂයෙන් බඹරකැලේ (-1.23) හාවාඑළිය බටහිර (-1.91) හා නුවරඑළිය (-3.65) යන ග්‍රාම නිලධාරී වසම් වල කැපී පෙනෙන ලෙස ජනගහන වර්ධනය සෘණ අගයක් 2012 දි 2002ට සාපෙක්ෂව පෙන්නුම් කරයි. කෙසේ සමස්ත සෘණ ජනගහන වර්ධන වේගය 2017 දි තරමක් දුරට සමනය විම සිදුවි ඇති අතර හාවාඑළිය නැගෙනහිර, හාවාඑළිය බටහිර, කලාපුර, කළුකැලේ, කැලේගාල, නුවරඑළිය බටහිර හා සදතැන්න යන ග්‍රාම නිලධාරි වසම් වල ජනගහන වර්ධන වේගය ධන අගයක් බවට පත් වී ඇත. නමුත් හාවාඑළිය නැගෙනහිර, නුවරඑළිය, බඹරකැලේ, නුවරඑළිය මධ්‍යම යන වසම් වල තවදුරටත් ජනගහන වර්ධන වේගය සෘණ අගයක් ලෙස 2017 දි පෙන්නුම් කරයි. විශේෂයෙන් මෙම ප්‍රදේශ වල ඉඩම් නේවාසික භාවිතයන් සංචාරක හා වාණිජ භාවිතයන් සඳහා වෙනස් වීම මෙම තත්වයට බලපා ඇත. සමස්තයක් ගත් කල නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ 2012 ට සාපෙක්ෂව 2017 දි ජනගහන වර්ධනය සෘණ අගය 0.0353 දක්වා අඩු වී ඇත.

කෙසේ වෙතත් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා පාදක කරගනු ලබන නුවරඑළිය ප්‍රදේශිය සභා සීමාව තුල වු ග්‍රාම නිලධාරී වසම් 17 පිළිබඳ සැලකීමේදි මීට වඩා වෙනස් තත්වයක් පෙන්නුම් කරයි. 2002ට සාපෙක්ෂව 2012 දි එම ග්‍රාම නිලධාරී වසම් වලට සැලකිය යුතු ජනගහන වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර, සමස්ත ජනගහන වර්ධනය 0.3388ක් වන අතර 2017 දි 0.5955 ලෙස වර්ධනය වී ඇත. 2012 දි මීහිදුපුර, ගොරඩිහෙල, කදපොල, කදපොල නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් වල ජනගහන වර්ධනය සෘන අගයක් ගන්නා අතර අනෙක් ග්‍රාම නිලධාරී වසම් වල ධන අගයක් පෙන්නුම් කරයි. ඒ අතරින් සිතාඑළිය (1.69) කදපොල මධ්‍යම (1.14) රුවන්එළිය (1.05) කැපි පෙනේ. 2017 දි 2002ට සාපෙක්ෂව ජනගහනය සෘණ අගයක් වන්නේ කදපොල හා කදපොල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම් වල පමණයි.

තවදුරටත් අධ්‍යනය කිරිමේදි පෙනි යන්නේ නුවරඑළිය මහ නගර සභා සීමාවට යාබදව පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල ජනගහන වර්ධනය ධන අගයක් පෙන්නුම් කරන බවයි. නගර සීමාව තුළ නේවාසික වර්ධනය හීන වීමත් යාබද ප්‍රාදේශිය සභා සීමාව තුළ ජනගහන වර්ධනයක් පෙන්නුම් කිරීමත් පෙනී යන්නේ නගරය තුළ සංචාරක හ [illegible]

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ප්‍රදේශයන් සඳහා නේවාසික ඉල්ලීමක් ඇති බවයි. එසේම අධ්‍යන සඳහා තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරී වසම් 30 තුළ මුළු ජනගහනය 2017 වසරේදි 72294ක් ලෙස වාර්තා වන අතර එය නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රෙදශයේ මුළු ජනගහනයෙන් 10%ක ආසන්න ප්‍රමාණයක් වේ.අධ්‍යන ප්‍රදේශය

ජනගහන ඝණත්වය

ජනගහන ඝණත්වය පිළිබඳව සැලකීමේදී ඉහළ ජන ඝණත්වයක් එනම් හෙක්. 1000කට වැඩි ග්‍රාම නිලධාරී වසම් වශයෙන් බඹරකැලේ, ශාන්තිපුර, හාවාඑළිය උතුර හාවාඑළිය, නැගෙනහිර, කදපොල, කළුකැලේ, හා කදපොල මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් වන අතර ඉතා අඩු එනම් හෙක්. 400ට අඩු ජනගහනයක් කදපොල නැගෙනහිර, ටොප්පාස්, පීඩෘ, ජයලංකා, ගොරඩිහෙල යන ග්‍රාම නිලධාරී වසම් පෙන්නුම් කෙරේ. (සිතියම් අංක 2.6)

සිතියම් අංක 2.5: ජන සනත්වය - 2012



මූලාශ්‍රය- ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

ජාතීන් අනුව ජනගහනය

තුළ ජනගහනය 46% ප්‍රමාණයක් සිංහල ද 41% ප්‍රමාණයක් ද්‍රවිඩ ද 6% ප්‍රමාණයක් මුස්ලිම් ද වෙනත් ජාතීන් ලෙස 6% වන අතර මුළු ජනගහනයෙන් 40% ආසන්න ප්‍රමාණයක් වතු ජනතාවද වේ.

දත්ත සටහන ***2.0.1:*** *ජාතීන් අනුව ජනගහනය*



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාව 2012

2.2.9. නිවාස ආශ්‍රිත ලක්ෂණ

පවතින දත්ත වලට අනුව 2012 වර්ෂයේ නිවාස ඒකක 10784 ක ජනගහනය 11008 ක් ජීවත් වන බව පෙනී යයි. ඒ අනුව 2012 වර්ෂයේ නිවාස ඒකක 224 ක් තිබූ බව පෙන්නුම් කරයි. මෙයට බලපානු ලැබූ ප්‍රධාන කරුණ වනුයේ ගනණය කරන ලැබූ නිවස ඒකක ආශ්‍රිතව ඉහළ ජනගහනයක් වර්තා වීම වෙ. මෙයින් 20% ප්‍රමණයක් ජීවත් වනුයේ ලයින් නිවාස ආශ්‍රිතව වන බව නිරීක්ෂණය වේ. තවද, එයින් පැල්පත් ලක්ෂණ සහිත නිවාස 144 ඇත.

*වගු අංක **2.8:** නිවාස වල තත්ත්වය*

ග්‍රාම නිලධාරි කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	නිවාස සංඛ්‍යාව	නිවාස හිඟය	තනි මහල් නිවාස	මහල් 2 නිවාස	මහල් 2ට වඩා වැඩි නිවාස	ඒකාබද්ධ නිවාස	මහල් නිවාස	පැල නිවාස	පේළි නිවාස	පැල්පත්
බඹරකැලේ	**787**	**773**	**14**	**445**	**78**	**17**	**32**	**1**	**15**	**175**	**10**
බංගලාහත	**816**	**799**	**17**	**285**	**50**	**8**	**17**	**0**	**24**	**412**	**3**
බුලුඇල	**429**	**415**	**14**	**326**	**37**	**1**	**27**	**0**	**2**	**21**	**1**
හාවාඑළිය නැගෙ.	**580**	**561**	**19**	**439**	**51**	**1**	**15**	**0**	**1**	**51**	**3**
හාවාඑළිය උතුර	**542**	**537**	**5**	**365**	**58**	**5**	**59**	**0**	**28**	**19**	**3**
හාවාඑළිය බටහිර	**490**	**488**	**2**	**322**	**67**	**4**	**34**	**4**	**0**	**57**	**0**
කලපුර	**840**	**832**	**8**	**380**	**5**	**0**	**24**	**0**	**13**	**407**	**3**
කලුකැලේ	**289**	**287**	**2**	**265**	**13**	**1**	**0**	**0**	**3**	**0**	**5**
කැලේගාල	**453**	**442**	**11**	**231**	**39**	**4**	**19**	**0**	**64**	**85**	**0**
මාගස්තොට	**377**	**373**	**4**	**320**	**28**	**2**	**0**	**4**	**10**	**4**	**5**
මීපිලිමාන	**537**	**523**	**14**	**498**	**15**	**1**	**7**	**0**	**0**	**2**	**0**
මිහිඳුපුර	**319**	**312**	**7**	**292**	**17**	**0**	**3**	**0**	**0**	**0**	**0**
නුවරඑළිය	**272**	**264**	**8**	**109**	**54**	**0**	**16**	**5**	**12**	**68**	**0**
නුවරඑළිය මධ්‍යම	**1017**	**993**	**24**	**625**	**123**	**6**	**63**	**0**	**17**	**137**	**22**
නුවරඑළිය බටහිර	**578**	**569**	**9**	**198**	**51**	**11**	**57**	**1**	**8**	**232**	**11**
රුවන් එළිය	**733**	**714**	**19**	**360**	**20**	**0**	**40**	**4**	**22**	**267**	**1**
සඳතැන්න	**683**	**668**	**15**	**318**	**34**	**1**	**3**	**0**	**10**	**230**	**72**
සීතාඑළිය	**469**	**453**	**16**	**384**	**28**	**9**	**20**	**0**	**2**	**6**	**4**
ශාන්තිපුර	**357**	**351**	**6**	**335**	**7**	**0**	**9**	**0**	**0**	**0**	**0**
වින්ඩිකෝනර්	**440**	**430**	**10**	**364**	**16**	**0**	**38**	**0**	**0**	**11**	**1**
එකතුව	**11008**	**10784**	**224**	**6861**	**791**	**71**	**483**	**19**	**231**	**2184**	**144**
පවත්නා නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			2.1	63.6	7.3	0.7	4.5	0.2	2.1	20.3	1.3

නිවාස සනත්වය පිළිබඳව සැලකීමේදී ද නුවර එළිය මහ නගර සීමාවේ සනත්වය ඉහල අගයක් ගන්නා බව සිතියම මගින් පෙන්නුම් කෙරේ.

සිතියම් අංක ***2.6 : නිවාස සනත්වය 2012***



නිවාස සනත්වය - 2012
විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

මූලාශ්‍රය - ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාව 2012

නාගරික සංවර්ධන අධිකාරිය
නුවර එළිය කාර්යාලය
අගෝස්තු 2017

නවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)

සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං.. අ

2.2.10. ශ්‍රම බලකායක්

ජනගහනය පිරිමිඩය අනුව වගු අංක2.6 මගින් පෙන්වා ඇති පරිදි 73%ක ආසන්න ශ්‍රම බලකායක් ප්‍රදේශයේ ඇත. කාන්තා ශ්‍රම බලකායට වඩා පිරිමි ශ්‍රම බලකායක් ඇති බව පෙනෙන අතර, එය මුළු පිරිමි ජනගහනයෙන් 78%ක් වන අතර කාන්තා ප්‍රතිශතය 67%ක් වේ

. *ප්‍රස්තාර අංක* ***2.0.3: ජනගහන පිරිමීඩය***



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ප්‍රදේශයේ ශ්‍රම බලකාය අනුයුක්තව ඇති කටයුතු පිළිබඳව සැලකීමේදී 56%ක ප්‍රමාණයක් රැකියා නියුක්ත වන අතර 3%ක ප්‍රමාණයක් රැකියාවියුක්ත තත්වයක පවතී. එමෙන්ම 41%ක ප්‍රමාණයක් ඵලදායි ආර්ථික කටයුත්තක නොයෙදෙන්නන් ලෙස 2012 ජන හා සංඛ්‍යා ලේඛන දත්ත අනුව පෙන්වා ඇත.

ප්‍රස්තාර අංක 2.4: සේවා නියුක්තිය - 2012



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 2012

එසේම ශ්‍රම බලකාය නියුක්ත ආර්ථික කාර්යයන් පිළිබඳව සැලකීමේදී බංගලාහත, කලාපුර, මීපිළිමාන, සඳතැන්න, රුවන්එළිය, සීතාඑළිය යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල 40%ක ආසන්න සේවා නියුක්තියක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේදී නුවරඑළිය මධ්‍යම නුවරඑළිය නැගෙනහිර, නුවරඑළිය බටහිර, හාවාඑළිය බටහිර, හාවාඑළිය නැගෙනහිර හා බඹරකැලේ යන ග්‍රාම නිලධාරී වසම් වල වැඩි සේවා නියුක්තියක් සංචාරක හා මූල්‍ය සේවා අංශයේද නියුක්ත බව පෙන්නුම් කෙරේ. සමස්තයක් ලෙස නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක හා සේවා අංශ වල රැකියා නියුක්තියක් ඇති අතර නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් වල වැඩි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා නියුක්තියක් පෙන්නුම් කෙරේ. සමස්තයක් ලෙස 25% ආසන්න ප්‍රමාණයක් කෘෂි කර්මාන්තයෙන් ද 18%ක ප්‍රමාණයක් හා 14%ක ප්‍රමාණයක සේවා නියුක්තියක් සංචාරක හා සේවා අංශයේ ඇති බව පෙනේ.

2012 වාර්තාවලට අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ යැපෙන්නන් සහ යැපෙන්නන් නොවන අය අතර අනුපාතය **16** සිට **09** දක්වා විය. සැළසුම් ප්‍රදේශය තුළ ආර්ථික උත්පාදනය සඳහා ක්‍රියාකාරීව සහභාගී විය හැකි ඉහළ ජනගහනයක් සිටින බව අදහස් වේ. නුවරඑළිය සමස්ත දිස්ත්‍රික්කයක් ලෙස රාජ්‍ය අංශයේ වැඩකරන ජනගහනයෙන් සියයට **53.5** කින් සමන්විත වන අතර ඔවුන් වතුකරයේ කෘෂිකාර්මික අංශයේ කටයුතු සඳහා ආර්ථික වශයෙන් සෘජුව දායක වේ.

දිවයිනේ ප්‍රධාන තේ වතු සහ උඩරට එළවළු වගා කරන දිස්ත්‍රික්කයක් ලෙස සැළසුම් ප්‍රදේශය කෘෂිකාර්මික අංශයේ සේවකයින් බහුතරයකින් සමන්විත වන අතර එය සමස්ත සේවකයින්ගෙන් **25%**ක් ලෙස සටහන් වේ. දෙවන ආර්ථික දායකත්වය සපයන අංශය ලෙස සංචාරක ව්‍යාපාරය සැලසුම් කරන ප්‍රදේශය තුළ සමස්ත සේවකයින්ගෙන් **18%** කින් සමන්විත වන අතර එය ප්‍රධාන ආර්ථික ස්ථම්භයන්හි එක ප්‍රධාන කොටසක් ලෙස සටහන් වේ.

ප්‍රස්තාර අංක ***2.5:*** *සේවා නියුක්තිය අංශයන් අනුව* ***2012***



මූලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 2012

2.2.11. අධ්‍යාපනය ආශ්‍රිත ලක්ෂණ

අධ්‍යාපන තත්වය පිලිබඳ සැලකීමේදී අනෙක් ප්‍රදේශන් වලට සාපෙක්ෂව සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් ප්‍රතිශතය අඩු අගයක් ගනී.අ.පො.ස සා.පෙළ ප්‍රතිඵල වල සාමාන්‍යය- වර්ධනයක් පෙන්නුම් කරත් සමත්වීමේ සාමාන්‍ය 50% පමණ වේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුල ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන මට්ටම දිස්ත්‍රික්කයේ අනෙක් කලාප සමග සංසන්දය කිරීමේදී පහල අගයක් ගනී. 2016 වසරේදී ජාතික වශයෙන් අ.පො.ස (සාපෙළ) සමත් ප්‍රතිශතය 71%ක් ලෙස හා උසස්පෙළ සමත් ප්‍රතිශතය 70%ක් ලෙස පැවතියද මෙම කලාපයේ එය පිලිවෙලින් 53% ක් හා 35% අගයක් ගනී. මෙම කලාපයේ පාසල් **14** පවතින අතර ලමුන් **8600**පමණ අධ්‍යාපනය ලබයි අ.ොපා.ස(සා.උ.පෙළ) .

වගු අංක9: අධ්‍යාපන තත්ත්වය, අ.පො.ස (ස.පෙළ)

අ.ොපාස.සා.ොපළ ප්‍රතිඵල වල සාමාන්‍යය						
ප්‍රතිඵළ සාමාන්‍යය	2011	2012	2013	2014	2015	2016
සිංහල මාධ්‍ය	42	34	40	45	51	54
ද්‍රවිඩ මාධ්‍ය	34	25	16	56	32	52
මාධ්‍ය දෙකේම සාමාන්‍යය	38	30	28	51	42	53

වගු අංක **2.10** *: අධ්‍යාපන තත්ත්වය අ.පො.ස (උ.පෙළ)*

අ.ොපාස.උ.ොපළ ප්‍රතිඵල වල සාමාන්‍යය					
විස්තරය	වර්ෂය				
ප්‍රතිඵළ සාමාන්‍යය	2012	2013	2014	2015	2016
සිංහල මාධ්‍ය	33	27	34	35	38
ද්‍රවිඩ මාධ්‍ය	62	42	50	36	32
මාධ්‍ය දෙකේම සාමාන්‍යය	48	34	42	36	35

මූලාශ්‍රය - කලාප අධ්‍යාපන කාර්යාලය ,නුවරඑළිය 2017

ප්‍රස්තාර අංක **2.0.6** *: අ.පොස.උ.පෙළ ප්‍රතිඵල වල සාමාන්‍යය*



මූලාශ්‍රය - කලාප අධ්‍යාපන කාර්යාලය ,නුවරඑළිය

2.2.12. යටිතල පහසුකම්

5. **පානීය ජලය බෙදා හැරීම**

නුවරඑළිය මහ නගර සීමාවේදී පානිය ජලය බෙදා හැරීම නුවරඑළිය මහ නගර සභාව මගින් සිදුකරනු ලැබේ. ජල සම්බන්ධතා 6977ක් (නේවාසික හා වාණිජ) මුළු ජනගහනයේ 35000ක් පමණ පානිය ජලය බෙදාහරිනු ලබයි. නේවාසික ඒකක 3950, වාණිජ 411 ගෘහ නොවන 950 ක ආයතන හා වෙනස් ලෙස 245 ලෙස සමබන්ධතා ලබා දී ඇත. දෛනික ඝන මීටර් 4500ක පමණ අවශ්‍යතාවයක් පවතිනන අතර ඉන් 72% නේවාසිකද 18% වාණිජ හා සංචාරක බැවින්ද රජයේ හා පෞද්ගලික ආයතන හා සදහා 10%ක් ලෙසද සපයනු ලබයි.

මෙම සියලු ජල සැපයුම් ජල පෝෂක ලෙස ස්වභාවකි ජල බැල්පත් 9ක් මගින් ජලය ලබා ගන්නා අතර එම ජලය ගබඩා ජලාශ 15ක් මගින් කලාප 7ක් මගින් ආවරණය කර බෙදා හරිනු ලැබේ. එසේම වියලි කාළගුණ තත්වය යටතේ ඇතිවන ජල හිගය සදහා නළ ළිං 9ක් මගින් අමතර ජල අවශ්‍යතාවය ආවරණය කරනු ලබයි. වියලි සමයේදී ප්‍රධාන ජල මුලාශ්‍ර මගින් සපයනු ලබන්නේ ඝණ මීටර් 3500ක ප්‍රමාණයක් බැවින් නල ළිං මගින් අමතර ජල අවශ්‍යතාවය වන ඝණ මීටර් 1000ක සැපයුමක් සපයනු ලබයි.

මින් සම්පුර්ණ ජල අවශ්‍යතාවය 70%ක් පමණ හැඩන්හිල් කලාප වන අතර ප්‍රධාන ජල මුලාශ්‍ර වශයෙන් පීඩෘ හා ටොප්පාස් ජල උල්පත් කටයුතු කරනු ලැබේ. නගරයේ ප්‍රධාන නේවාසික/සංචාරක හා වාණිජ කලාප මෙමගින් ආවරණය කරනු ලබන අතර ප්‍රධාන ගබඩා ටැංකි 5කින් යුක්ත වේ.

එසේම ලවස්ලිප් හා ලෝවර් ඒරියා කලාප මගින් හාවාඑළිය මගින්ද රෝහල අවට ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර දිනකට ඝන මීටර් 1750ක් පමණ සපයනු ලබයි.
ප්‍රධාන නේවාසික හා වැසි ජන ගණත්වයක් ඇති හා ප්‍රධාන රෝහල පිහිටා ඇති කලාපය සදහා මෙම ජල පෝෂකය මගින් සපයනු කරනු ලැබේ.

කෙසේ වෙතත් මෙම කලාප වියලි සමයේදී එනම් ජනවාරි - අප්‍රේල් කාලවලදී ධාරිතාව පමන 900 අඩු වන බැවින් **H1, H2, H3, H4** නල ළිං මගින්ද ජලය ලබා ගෙන බෙදා හැරේ.

කෙසේ වෙතත් වියලි කාල සීමාවලදී එනම් දෙසැම්බර් - අප්‍රේල් කාල සීමාවලදී ජල මුලාශ්‍රවල ධාරිතා දෛනිකව 3500ක් දක්වා අඩුවන අතර දෛනික ජල ඉල්ලුම 5500ක් පමණ දක්වා වැඩි වේ. මේ සදහා දෙසැම්බර් සහ අප්‍රේල් මාස වල සංචාරක ආගමනය වැඩි වීමත් සමග ඇති වන ඉල්ලුමද මේ තත්ත්වයට බලපානු ලබයි.

නුවරඑළිය ප්‍රාදේශිය සභාවට අයත්වන රුවන්පුර, මීපිලිමාන, කටුමාන හා බ්ලැක්පුල්, ශාන්තිපුර ප්‍රදේශය සදහා වෙන වෙනම ප්‍රාදේශිය හා ග්‍රාමීය ජල සැපයුම් පද්ධති ක්‍රියාත්මක වන අතර ඒ සදහා නුවරඑළිය ප්‍රාදේශිය සභාව මගින් විධිමත්ව මැදිහත්වීමක් නොමැත

සිතියම් අංක 2.7: පානීය ජල මූලාශ්‍ර



පානීය ජල මූලාශ්‍ර - 2012
විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

මූලාශය - ජන හා සංඛ්‍යා ලේඛන වාර්තාව 2012

නාගරික සංවර්ධන අධිකාරිය
නුවර එළිය කාර්යාලය
අගෝස්තු 2017

නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)

සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං.. අ

2.2.13. සංචාරක ගමනාන්තයක් ලෙස නුවරඑළිය

නුවරඑළියේ උරුමය 1800 ගණන්වල සිට බ්‍රිතාන්‍ය ආන්ඩුවේ බලපෑමෙන් ස්ථාපිත වූ එහි යටත් විජිත යුගයේ සිට ඉදිරියට දිව යයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිවයිනේ ඇති සුවිශේෂී දේශගුණය මෙන්ම කීර්තිමත් බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ පැවතීම හේතුවෙන් නුවරඑළිය නගරය දේශීය මෙන්ම විදේශීය අමුත්තන් සඳහා අද්විතීය පාරාදීසයක් බවට පත් කර ඇත. සංරක්ෂණ අරමුණු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලැයිස්තුගත කර ඇති ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සිය ගණනකට වඩා වැඩි ප්‍රමාණයක් පවතින අතරම එවැනි වූ ගොඩනැගිලි නවීන තත්ත්වයන්ට පත් කිරීමේදී පවා දෙසට පරිණාමය වීමේදී පවා නගරයට උරුම වූ රූප විද්‍යාව ආරක්ෂා කිරීමේ කර්තව්‍යය ඉතා විශිෂ්ට ලෙස ඉටු කර ඇත.

නුවරඑළිය දේශීය සංචාරකයින් අතර වඩාත් ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් බවට පත්ව ඇත්තේ කෙටි ගමනක් තුළ භූගෝලීය සහ දේශගුණික විචලනයන් දැනීමේ හැකියාව නිසාය. තවද , ප්‍රදේශයේ සහ අවට පවතින සැලකිය යුතු ආකර්ශනීය ස්ථාන ගණනාවක් සඳහා සත්කාරක ගමනාන්තයක් ලෙස ක්‍රියා කිරීම හේතුවේ එය උඩරට කලාපයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරන ප්‍රදේශයක් බවට පත්ව ඇත එසේ වුවද, නුවරඑළියට පැමිණෙන අමුත්තන් අතර ප්‍රවර්ධනය කළ හැකි ප්‍රයෝජනයට නොගත් තවත් විභවයන් ඇති බව පෙනේ. එවැනි හැකියාවන් ඉදිරි පරිච්ඡේදවල තවදුරටත් සාකච්ඡා කරනු ඇත. නුවරඑළිය නැරඹීමට වසරේ හොඳම කාලය මාර්තු සිට මැයි දක්වා වාර්තා වන එහි මල් පිපෙන කාලය

6. සංචාරක සමය ලෙස සැලකේ. වසරක මෙම අදියර උණුසුම් සමය ලෙස උපකල්පනය කරන අතර එය කලාපයේ මුළු වෘක්ෂලතා ප්‍රජාවම නැවුම් වන අතර විශාල පිපෙන මල් වලින් සරසා ඇත. මෙම වර්ෂා රහිත වියළි මාස තුළ එවැනි විස්මිත පරිසරයක් ප්‍රදේශයට වැඩිම නරඹන්නන් ප්‍රමාණයක් ආකර්ෂණය වන අතර සංචාරක ව්‍යාපාරයේ උච්චතම කාල පරිච්ඡේදය ලෙස සලකනු ලැබේ.

අප්‍රේල් මාසයේ උපරිම කාලය තුළ නුවරඑළිය නගරය අධික ලෙස කාර්යබහුල වේ. මෙම විශේෂ සමය නිදහස කාලයෙන් පසු එහි වර්තමාන විධිමත්භාවය දක්වා ක්‍රමයෙන් පරිණාමය වී ඇත. මුලදී නුවරඑළියට පැමිණියේ බ්‍රිතාන්‍යයන් සහ එකී කලාපයේ වාසය කරන්නන් වුවද , වසර ගණනාවක් පුරා මෙම ගමනාන්තය වඩාත් දියුනුතත්ත්වයට පත් වෙමින් සමාජය තුල සැහැල්ලු නිදහස් ගමනාන්තයක් ලෙස ප්‍රචලිත වී ඇත. මේ අනුව, මෙම ප්‍රසන්න දේශගුණය, සිසිල් රාත්‍රීන් සහ අලංකාර වෘක්ෂලතා වින්දනයට ප්‍රිය වූ ඕනෑම අයෙකු එය භුක්ති විඳීමට ළඟා වනු දක්නට ඇත.

මෙකී සංචාරක සමයේදී, නගරය දහස් ගණනක් නිවාඩු ගත කරන්නන් අපේක්ෂා කරයි. එය සංචාරක ක්ෂේත්‍රයේ මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවගේ සහ ප්‍රාදේශීය ප්‍රජාවගේ ඉපැයීම් නංවාලමින් නගරයේ ආර්ථිකයට ප්‍රතිලාභ අත්කර දෙයි. ප්‍රමුඛ පෙළේ තරු පන්තියේ හෝටල්, ආගන්තුකාගාර, පෞද්ගලික බංගලා සහ අනෙකුත් නිවාඩු නිකේතන මෙම සමය තුළ දේශීය හා විදේශීය අමුත්තන් විසින් සම්පූර්ණයෙන්ම පිරී ඉතිරී යයි. මෙම කාලය තුළ විවිධ පාර්ශ්ව විසින් කානිවල්, උද්‍යාන තරඟ, චිත්‍ර ප්‍රදර්ශනය, සම්භාව්‍ය මෝටර් රථ රැළිය, රදැල්ල කඳු නැගීම, ටෙනිස් තරඟාවලිය, විවෘත වේදිකාවේ සංගීත සංදර්ශන, ගොල්ෆ් තරඟාවලි, තුරඟ තරඟ, විලාසිතා දැක්ම, 4 x 4 තරඟ, ඇතුළු සමාජීය වැඩසටහන් රාශියක් සංවිධානය කරයි. මල් සංදර්ශන, චිත්‍රපට උත්සව, බැඩ්මින්ටන් තරඟාවලි, මෝටර් රථ ධාවන තරඟ, වේදිකා නාට්‍ය සහ අවුරුදු උත්සව ආදියද අත්දැකිය හැක. .එපමනක් නොව, නැවුම් එළවලු සහ පලතුරු වගා කරන ලද භූමි සහ සිත් ඇදගන්නාසුළු මල් පිපුණු කලාප දක්නට ලැබීම තුලින් සිත් ඇදගන්නා සුළු ආකර්ෂණීය බවක් නගරයට ඇති කරයි.

වසරේ ඉතිරි කාලය තුළ රාත්‍රී කාලයන්හි මද වශයෙන් ක්‍රියාකාරකම් දක්නට ලැබුවද , නුවරඑළිය ඍතුවේ සැණකෙළි වාතාවරණයක් තුළ රාත්‍රී කටයුතු හා විවිධ ක්‍රියාකාරකම් ජීවමාන වේ. මේ අනුව, එය උපරිමයෙන් භුක්ති විඳීමට පැමිණෙන්නන් හට අවස්ථාව උදා වී ඇත.

*රූප සටහන **2. 17:** සංචාරක සමය තුල වන ක්‍රියාකාරකම්*

වගු අංක ***2.11 :*** *වසන්ත සමයෙහි වැඩසටහන් දිනදර්ශනය*

අප්‍රේල් :01
සෘතුමය වැඩසටහන විවෘත කිරීම
චිත්‍ර ප්‍රදර්ශන

අප්‍රේල් :02
චිත්‍ර ප්‍රදර්ශනය සහ තරඟය - වික්ටෝරියා ශාලාව

අප්‍රේල් :03
නු.එ.ම.න.ස විසින් උද්‍යාන තරඟ පැවැත්වීම
චිත්‍ර ප්‍රදර්ශනය සහ තරඟය - වික්ටෝරියා ශාලාව

අප්‍රේල් :04

අප්‍රේල් :05
නු.එ.ම.න.ස විසින් උද්‍යාන තරඟ පැවැත්වීම
සෞඛ්‍ය ළදරු තරඟය:නු.එ.ම.න.ස
පැරණි කාර් රථ රැලිය: CMSC විසින් පැවැත්වි

අප්‍රේල්:06
මාගස්තොට කඳු නැඟීම: මෝටර් රථ ධාවන සමාජය
ශ්‍රී ලංකාවේ එවරස්ට්ං ජාත්‍යන්තර පාපැදි ඉසව්ව-
රදැල්ල පැරණි මෝටර් රථ ප්‍රදර්ශනය -ග්‍රෙගරි වැව IV අදියර: SMSC මගින්
නගරාධිපති කුසලාන පාපන්දු තරඟය

අප්‍රේල්:07

අප්‍රේල් :08
SLKC ජංගම කාර්ටින් ධාවන පථය- ග්‍රෙගරි වැව අදියර IV හි
ධ හමුදා ආහාර සැල - ග්‍රෙගරි වැව අදියර IV හි
රදැල්ල කඳු නැඟීම

අප්‍රේල් :09
සැණකෙළිය- නගරසභා ක්‍රීඩා පිටිය
ටෙනිස්: "හිල් සමාජය" හෝටල් පරිශ්‍රය

අප්‍රේල් :10
ටෙනිස්: "හිල් සමාජය" හෝටල් පරිශ්‍රය

අප්‍රේල්:11
සැණකෙළිය- නගරසභා ක්‍රීඩා
විවෘත වේදිකා සංගීත සංදර්ශන- නා.ස.අ පිටියේ

අප්‍රේල්:12
සුපර් ක්‍රොස්

අප්‍රේල් :13
සැණකෙළි
ටෙනිස්: "හිල් සමාජය" හෝටල් පරිශ්‍රය
SLKC ජංගම කාර්ටින් ධාවන පථය
සංගීත සංදර්ශනය

අප්‍රේල් :14
සැණකෙළිය
ටෙනිස්: "හිල් සමාජය" හෝටල් පරිශ්‍රය
ජනාධිපති ත්‍යාගය : ගොල්ෆ් තරගය

අප්‍රේල්:15
සැණකෙළි
අශ්ව රේස්
සුපර් ක්‍රොස්
සැණකෙළිය- නගරසභා ක්‍රීඩා පිටිය
SLKC ජංගම කාර්ටින් ධාවන පථය
විවෘත වේදිකා සංගීත සංදර්ශන- නා.ස.අ පිටියේ
විශාලතම අර්තාපල් හල්වා දිවා ආහාරය -ග්‍රෑන්ඩ් හෝටලය
යුධ හමුදා ආහාර සැල

අප්‍රේල් :16
සැණකෙළි
සුපර් ක්‍රොස්
සංගීත සංදර්ශනය

අප්‍රේල් :17
සැණකෙළි
SLKC ජංගම කාර්ටින් ධාවන පථය
විශාලතම අර්තාපල් හල්වා දිවා ආහාරය
ආහාර අලෙවිසැල්
සංගීත සංදර්ශනය

අප්‍රේල්:18
සැණකෙළිය
විශාලතම අර්තාපල් හල්වා දිවා ආහාරය
මල් ප්‍රදර්ශන -වික්ටෝරිය උද්‍යානය

අප්‍රේල් :19
සැණකෙළිය
SLKC ජංගම කාර්ටින් ධාවන පථය
තේරු පෙරහැර

අප්‍රේල් :20
සැණකෙළිය
යුධ හමුදා ආහාර සැල
අර්තාපල් හල්වා දිවා ආහාරය
සංගීත සංදර්ශනය
මල් ප්‍රදර්ශන
යුධ හමුදා ආහාර සැල

අප්‍රේල් :21
සැණකෙළිය
ආහාර අලෙවිසැල්
මල් ප්‍රදර්ශන
සිනමා උළෙල
SLKC ජංගම කාර්ටින් ධාවන පථය

අප්‍රේල්:22

අප්‍රේල්:23
නු'එළිය කඳු නැඟීම

අප්‍රේල්:24

අශ්ව රේස්

අප්‍රේල් :25
සංගීත සංදර්ශනය



බැඩ්මින්ටන් තරඟාවලිය-ගෘහස්ථ ක්‍රීඩාංගනය: C P බැඩ්මින්ටන් සංගමය විසින් පැවැත්වීම

අප්‍රේල් :26
අවුරුදු උත්සවය- නු.එ.ම.න.ස

අප්‍රේල් :27
පෙරහැර- නු.එ.ම.න.ස
මාර්ග ධාවන තරඟ
මාසික පදක්කම: ගොල්ෆ් තරගය

අප්‍රේල් :28
මාර්ග ධාවන තරඟ
වේදිකා නාට්‍යය- නව නගර ශාලාව

අප්‍රේල් :29
බැඩ්මින්ටන් තරඟාවලිය-ගෘහස්ථ ක්‍රීඩාංගනය
වේදිකා නාට්‍යය- නව නගර ශාලාව

අප්‍රේල් :30
නු.එ. මහා නගර සභාව
ලංකා මෝටර් රථ කීඩා සමාජය

උත්සව සමය තුළ කැපී පෙනෙන ලෙස නුවරඑළියේ විශාල දේශීය නරඹන්නන් ප්‍රමාණයක් වාර්තා කළේය. නුවරඑළිය මහා නගර සභා වාර්තාවලට අනුව අප්‍රේල් 10 සිට 20 දක්වා දෛනික දේශීය සංචාරක පැමිණීම 100,000 - 150,000 පමණ වේ. එවැනි සංචාරක ව්‍යාපාරයේ උච්චතම අවස්ථාව වන විට විශාල ජනගහනයක් සඳහා පහසුකම් සැපයීමටමෙම ප්‍රදේශයේ අවශ්‍ය වන පහසුකම් ධාරිතාවයක් නොතිබීම අදාළ බලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් මුහුණ දෙන තාවකාලික ගැටලුවකි.

*ප්‍රස්තාර අංක **2.7**: ප්‍රමුඛ ආකර්ෂණ ස්ථානවල සටහන් වූ දේශීය සංචාරකයන්*

*නු'එළිය මහ නගර සභාව/ සංවර්ධන සැලැස්ම **2030** (නා.සං.අ - නුවරඑළිය)*

7. සංචාරක කටයුතු වල දක්නට ඇති විවිධ ස්වභාවයන්

වසන්ත සමයෙහි ක්‍රියාකාරකම් හැරුණු විට, ශ්‍රී ලංකාවේ සුන්දරම කඳුකරය ලෙස හඳුනාගන්නා නුවරඑළිය ආශ්‍රිතව ස්වභාව සෞන්දර්යයෙන් හෙබි ඉහළ ආකර්ෂණ ස්ථාන, පුරාණ විහාරස්ථාන, ප්‍රියජනක ආහාර පිසීම් සහ තවත් බොහෝ ආකර්ශනීය විස්මයන් සහිත කටයුතු හා ක්‍රියාකාරකම් දක්නට ලැබේ. ස්වභාවික පරිසරය හා සබැඳි නැරඹිය යුතු ස්ථාන හා එහා ආශ්‍රිත සිදුවීම් මෙන්ම මිනිසුන් තුළින් හෝ රස පිනවන ආහාර තුළින් සංචාරකයින් මෙම ස්ථානයට ආකර්ෂණය කර ගැනීම සඳහා නුවරඑළිය සෑම අංශයකින්ම ප්‍රමාණවත් විවිධත්වයක් සපයා ඇති බව නිරීක්ෂණය වේ.

*රූප සටහන **2. 18 :** සංචාරක කටයුතු වල දක්නට ඇති විවිධ ස්වභාවයන්*

නුවරඑළිය වෙත සංචාරකයින්ගේ පැමිණීම

මින් පෙර කොටසෙහි සදහන් කල පරිදි, සංචාරක ආකර්ෂණ ස්ථාන විශාල පරාසයක් තුල පැවැතිමත් සමඟ නුවරඑළිය සංචාරක කටයුතු සිදුවන ක්‍රියාකාරී ප්‍රදේශය පුළුල් භූගෝලීය කලාපයක් පුරා ව්‍යාප්ත වේ. ඉතා සැපදායි හා හිතකර දේශගුණය මෙන්ම දර්ශනීය ස්වභාවික කලාපය සංචාරකයින් ප්‍රදේශයට ආකර්ෂණය කර ගැනීමට මහ පැදී ඇත.පරිසර සංවේදී කලාපයේ පිහිටා තිබීම පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට ද හේතු වී ඇත.

*වගු අංක **2. 12:** ශ්‍රී ලංකාවේ මුළු විදේශීය සංචාරක පැමිණීම*

වර්ෂය	මුළු විදේශීය සංචාරක පැමිණීම	උඩරට කලාපයට පැමිණෙන්නන් (මුළු ප්‍රමාණයෙන් 6%)
2014	**1527,153**	**91,630**
2015	**1798,380**	**107,900**
2016	**2,050,832**	**123,050**
2017	**2,116,407**	**126,985**

මූලාශ්‍රය : ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විශ්ලේෂණය

*වගු අංක **2. 13:** නුවරඑළියේ ප්‍රසිද්ධ ස්ථාන වෙත සංචාරකයින් පැමිණීම*

	2012	2013	2014	2015	2016
Foreign Tourists					
Hakgala Garden	12,489	14,713	18,071	24,188	29,192
Hortain plains	39,123	34,065	69,979	87,962	131,670
Galway's forest	82	29	84	49	198
Gregory Park					61,622
Victoria Park					47,294
Moon Plains					8,673
Local Tourists					
Hakgala Garden	587,749	511,879	578,825	742,133	956,815
Hortain plains	184,744	46,511	198,374	228,858	319,999
Galway's forest	1,521	1,084	1,669	2,047	3,345
Gregory Park					721,495
Victoria Park					643,725

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය **(2019)***

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංචාරක සංඛ්‍යාලේඛන වාර්තාවේ වාර්තා වන පරිදි දිවයිනට පැමිණෙන මුළු සංචාරකයන්ගෙන් සියයට හයක් (6%) නුවරඑළිය, ඇල්ල, මහනුවර ආදී ප්‍රධාන සංචාරක ගමනාන්තයන් වන උඩරටට පැමිණෙන බව පැවසේ. උක්ත වගුවේ ඇති සංඛ්‍යාලේඛන මගින් ශ්‍රී ලංකාවට සහ උඩරට සංචාරකයින්ගේ පැමිණීමේ සාමාන්‍ය ප්‍රමාණය වෙන වෙනම නියෝජනය කරයි.

කෙසේ වෙතත්, නුවරඑළියේ දේශීය හා විදේශීය සංචාරකයින් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත වාර්තාවක් නොමැති බැවින්, වැඩිදුර ගණනය කිරීම් සඳහා වඩාත් ජනප්‍රිය සංචාරක ආකර්ෂණ ස්ථාන ඇතුළත් දත්ත සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව, හක්ගල උද්‍යානය, හෝර්ටන් තැන්න, ග්‍රෙගරි වැව උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය සහ ගැල්වේස් උද්‍යානය යන ස්ථානවලට නරඹන්නන්ගේ පැමිණීමේ දත්ත පසුගිය වසර

කිහිපයක සිට සලකා බලනු ලැබේ. උක්ත වගුවෙහි නිරූපණය කර ඇති පරිදි විදේශීය සංචාරකයින්ගෙන් බහුතරයක් හෝර්ටන් තැන්න වෙත පැමිණෙන බව දැක ගත හැකි අතර එහිදී දේශීය සංචාරකයින් වැඩි පිරිසක් හක්ගල උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන බව නිරීක්ෂණය වේ. එබැවින් සෑම දේශීය සංචරකයෙකුම පාහේ හක්ගල උද්‍යානයට පැමිණෙන අතර සියලුම විදේශිය සංචරකයෙකුම හෝර්ටන් තැන්න නැරඹීමට පැමිණෙන බවට උපකල්පනය කරන පරිදි වාර්ෂිකව දළ වශයෙන් විදේශිකයන් 132,000 ක් සහ දේශීය ජනතාව මිලියන 1 ක් නුවරඑළියට පැමිණෙන බව ගණනය කල හැකි වේ.

දේශීය හා විදේශීය කාණ්ඩ, නුවරඑළියට පැමිණීමේ ප්‍රවණතාවයේ ධනාත්මක නිත්‍ය වර්ධනයක් සංඛ්‍යාලේඛන නියෝජනය කරයි. එයින් අදහස් වන්නේ නුවරඑළිය දැනටමත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස ස්ථාපිත වී ඇති බවයි. එහෙයින් වසර දෙකක කාලය තුළ ත්‍රස්තවාදී ප්‍රහාර හා ගෝලීය වශයෙන් අඩු ආරක්ෂිත තත්ත්වයන් (වසංගත තත්ත්වය- කොවිඩ් 19)වැනි පොදු තර්ජනයක් ඇති නොවන්නේ නම් හැර ශ්‍රී ලංකාවේ කඳුකරයේ නිර්මාණය වූ මෙම විශිෂ්ට කලාපය සඳහා ගෝලීය සහ ජාතික සංචාරකයින්ගේ ඉල්ලුම ඉහළ යනු ඇති බවට සැකයක් නැත.

නුවරඑළියට සංචාරකයින් පැමිණීමේ දක්නට ලැබෙන අනාගත තත්ත්වය

2030 දක්වා කාලය සඳහා පහසුකම් සැලසීම විශේෂිත සැලැස්මේ අරමුණු බැවින් අමුත්තන්ගේ පැමිණීමේ අනාගත දර්ශනය පිළිබඳ හැඟීමක් ලබා ගැනීම අවශ්‍ය වන අතර ඒ අනුව, එය වගුවේ ඇති සංඛ්‍යාලේඛන භාවිතා කරමින් වාර්ෂිකව පැමිණෙන අමුත්තන් ප්‍රමාණය පුරෝකථනය කර ඇත. සිදු කරන ලද දත්ත ආශ්‍රිත ප්‍රවණතා විශ්ලේෂණයට අනුව, බාහිර ධනාත්මක හෝ සෘණාත්මක බලපෑමකින් තොරව එම තත්ත්වයම අනුගමනය කරමින් අනාගතයේදී නුවරඑළියට පැමිණීමේ වර්තමාන ප්‍රවණතාවය දීර්ඝ කාලයකට එලෙසම පැවතනු ඇති බවත් 2030 වර්ෂයේදී අපේක්ෂිත සංචාරකයන් දළ වශයෙන් 2,727,000 ක් සහ විදේශිකයන් 505,000 ක් ලෙස සටහන් වනු ඇත

*ප්‍රස්තාර අංක **2.0.8: 2030** වසර වනවිට නුවරඑළියට සංචාරකයින් පැමිණීමේ ප්‍රවණතාවය*



(සාමාන්‍ය තත්ත්වය මත ව්‍යාපාරය අනුව)

*වගු අංක Error! Use the Home tab to apply 0 to the text that you want to appear here.**14 :***

	Year	Locals	Foreigners
Precise count	2012	587,749	39,123
	2013	511,879	34,065
	2014	578,825	69,979
	2015	742,133	87,962
	2016	956,815	131,670
	2017	982,473	144,257
Projection	2018	1,148,114	178,209
	2019	1,294,990	204,242
	2020	1,416,130	232,998
	2021	1,531,599	257,067
	2022	1,684,775	287,478
	2023	1,808,053	313,408
	2024	1,935,581	340,882
	2025	2,069,911	367,999
	2026	2,204,316	395,947
	2027	2,330,831	422,601
	2028	2,464,028	450,203
	2029	2,596,282	477,500
	2030	2,726,814	504,827

(සාමාන්‍ය තත්ත්වය මත ව්‍යාපාරය අනුව)

8. නුවරඑළිය තුල රැඳී සිටින කාල පරාසය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්මට අනුව නුවරඑළියේ වැඩිපුරම රැඳී සිටින සාමාන්‍ය කාලය රාත්‍රී දෙකක් (02) ලෙස හඳුනාගෙන ඇති අතර හෝටල් හිමියන් සමඟ පවත්වන ලද සාමාන්‍ය සම්මුඛ සාකච්ඡාවලින් එය තවදුරටත් තහවුරු වී ඇත. දෙස් විදෙස් සංචාරකයින් නුවරඑළියේ රැඳී සිටින්නේ ස්වභාවික දර්ශනය හා ප්‍රසන්න දේශගුණය අත්විඳීම, වායුගෝලය සහ කඳු නැගීම, විවිධ ස්ථාන නැරඹීම, උද්භිද උද්‍යාන දැකබලාගැනීම තුලින් ප්‍රබෝධමත් වීම ග්‍රෙගරි වැවේ ජල ක්‍රීඩා කිරීම, ආගමික වතාවත් පැවැත්වීම හා ඒවාට සහභාගී වීම වැනි විශේෂ සංචාරක ක්‍රියාකාරකම් සහ උත්සව ආදියභුක්ති විඳීමේ අපේක්ෂාවෙනි.

9. සංචාරක කාණ්ඩයන්

වගුවේ වාර්තා කර ඇති දත්ත වලට අනුව, නුවරඑළියට පැමිණෙන සංචාරකයින්ගෙන් 10% ක් විදේශීය සංචාරකයින් වුවද එයින් 90% දේශීය සංචාරකයන් ලෙස සටහන් වන බවත් නිරීක්ෂණය වේ. දේශීය ප්‍රජාවගෙන් බහුතරයක් පවුල් වශයෙන් නුවරඑළියට පැමිණෙන්නේ එහි අද්විතීය දේශගුණය, ආකර්ශනීය දසුන් සහ මාර්තු සිට මැයි දක්වා සංචාරක ව්‍යාපාරයේ උච්චතම කාල පරිච්ඡේදය තුළ පැවැත්වෙන විශේෂ සිදුවීම් භුක්ති විඳීම සඳහාය. රට පුරා පාසල් විසින් සංවිධානය කරනු ලබන බොහෝ අධ්‍යාපන චාරිකා සඳහා තම ගමනාන්තය නුවරඑළිය ලෙස තෝරාගෙන පැමිණෙන ප්‍රවණතාවයක් හා ප්‍රසිද්ධියක් ලබා ඇති බව විශේෂයෙන් හඳුනාගත හැකිය.

එසේම විදේශීය සංචරකයනේ පැමිණෙන රටවල් සම්බන්ධව සලකා බැලූ කල , ඇමරිකා එක්සත් ජනපදයේ, යුරෝපයේ සහ මැද පෙරදිග ආදී හොඳම ආර්ථික රටවලින් සංචාරය කරන බහුතරයක් වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස එය සමස්ත විදේශීය සංචාරකයන්ගෙන් 83% කි. ඊට අමතරව, ආසියානු, ඕස්ට්‍රේලියානු සහ අප්‍රිකානු රටවල සංචාරකයන්ගේ මනාපය ද ඉහළ මට්ටමක පවතින බවට ශ්‍රේණිගත කර ඇත.

දත්ත සටහන 2 0.2: රටවල් අනුව නුවරඑළියට පැමිණෙන විදේශීය සංචරකයන්ගේ පැමිණීම



මූලාශ්‍රය: නුවරඑළිය සංචාරකයන්ගේ සමාජීය සහ ජනගහන ලක්ෂණ - හර්ෂනී (2019)

10. වයස් සීමාවන් අනුව සංචාරකයින් වර්ගීකරණය

නුවරඑළියට පැමිණෙන විදේශිකයන්ගේ වයස් කාණ්ඩයේ ඉහළම ස්ථානය වයස අවුරුදු 20 ත් 29 ත් අතර තරුණ සංචාරකයින් විසින් වාර්තා කර ඇත. එය සමස්ත සංයුතියෙන් 45% ක් පමණ වේ. වයස අවුරුදු 30 ත් 39 ත් අතර වයස් කාණ්ඩයට මුළු සංයුතියෙන් 36% ක් ඇතුළත් වන අතර මෙම කාණ්ඩය වැඩි වශයෙන් නුවරඑළියේ ස්වභාවය සහ එහි අත්දැකීම භුක්ති විඳීමට තම පවුල් සමඟ සංචාරය කරන බව පෙනේ. හෝටල් හිමියන්ගේ සංඛ්‍යාලේඛන සහ ඔවුන්ගේ අත්දැකීම් තුලින් ගම්‍ය වන නිගමන අනුව නුවරඑළිය ප්‍රදේශය දේශීය හා විදේශීය සන්දර්භය තුළ ඉතාමත් ප්‍රචලිතව ඇත්තේ මිතුරන් සහිත සමාජ කාණ්ඩ අතර බව කැපී පෙනේ.

11. නිරතවන රැකියාවන් අනුව සංචාරකයින් වර්ගීකරණය

නුවරඑළියට පැමිණෙන සංචාරකයින් නිරත වන රැකියා සම්බන්ධව සලකා බැලීමේදී පෙනී යන්නේ බොහෝ සංචාරකයින් ඉතා ඉහළ රැකියාවල නිරත වන බවයි. සංඛ්‍යාලේඛන ලෙස එය වාර්තා කරන්නේ බහුතරයක්, වෘත්තිකයන් (37%) වන අතර අනෙකුත් පැමිණෙන්නන් හා ඔවුන්ගේ රැකියාවන් සම්බන්ධව රූප සටහනේ පෙන්වා ඇති පරිදි ප්‍රතිශත කිහිපයකින් ඇතුළත් වේ.

*දත්ත සටහන **2.0.3:** නිරතවන රැකියාවන් අනුව සංචාරකයින් වර්ගීකරණය*



මූලාශ්‍රය: සංචාරකයන්ගේ සමාජීය සහ ජනගහන ලක්ෂණ නුවරඑළිය, හර්ෂනී (2019)

*ප්‍රස්තාර අංක **2.0.9:** නුවරඑළියට පැමිණෙන විදේශීය සංචාරකයන්ගේ වාර්ෂික ආදායම*



මූලාශ්‍රය: සංචාරකයන්ගේ සමාජීය සහ ජනගහන ලක්ෂණ නුවරඑළිය, හර්ෂනී (2019)

තවද, නුවරඑළියට පැමිණෙන විදේශීය අමුත්තන්ගෙන් **92%**ක් උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් වන අතර **70%**ක් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් **20,000** සිට **60,000** දක්වා ආදායමක් ලබන බව සොයාගෙන ඇත. එබැවින් නුවරඑළියට පැමිණෙන බොහෝ සංචාරකයින් කඳුකරයේ අනෙකුත් ගමනාන්තයන් හා සැසඳීමේදී ඉහළ අදායම් ලබන්නන් බව ගම්‍ය වේ.

2.2.14. නවාතැන් පහසුකම්

නුවරඑළිය සංචාරක සැලැස්මට අයත් වන ප්‍රදේශයේ මායිම් සීමාව තුළ සංචාරක නේවාසිකාගාර, නාගරික හෝටල්, ආගන්තුක නිවාස, පෞද්ගලික නිවාස, විලාස්, බංගලා, හෝම් ස්ටේජ් සහ යනාදී විවිධ ආකාරයේ නවාතැන් පහසුකම් ඇත. නුවරඑළිය සංචාරක සැලසුම් ප්‍රදේශයේ බොහෝ නවාතැන් පහසුකම් නුවරඑළිය මහ නගර සභා ප්‍රදේශයෙන් සහ නුවර එළිය මහා නගර සභා කලාපයට මඳක් ඔබ්බෙන් ආවරණය වන වර්ග කිලෝමීටර් 24 ප්‍රදේශයක් තුළ සංකේන්ද්‍රණය වී ඇති බව පෙනේ.

නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලැස්මේ (2022-2032) වාර්තාවලට අනුව, මෙකී ප්‍රදේශය තුල සංචාරක පහසුකම් සහිත නවාතැන් පහසුකම්, තරු හෝටල් ආදිය සඳහා කාමර සංඛ්‍යාව 1,800 ක් පමණ වේ.ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2019 පළමු කාර්තු වාර්තාවේ සංඛ්‍යාලේඛනවලට අනුව නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය ලබාගෙන ඇති හෝටල් ව්‍යාපෘති 09 ක් පමණක් වන අතර ප්‍රමිතිගත පහසුකම් සපයන කාමර 714 කින් නවාතැන් පහසුකම් සපයයි.

12. නවාතැන් පහසුකම් ලබා ගැනීම සම්බන්ධව සංචරකයින්ගේ තෝරාගැනීම්

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්තාවේ **(2019)** ගුවන්තොටුපොළ **"KIOSK"** ස්වයං සමීක්ෂණ සංඛ්‍යාලේඛනවලට අනුව සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගෙන් බහුතරයක් **(65%)** හෝටල්වල නවාතැන් ගැනීමට කැමැත්තක් දක්වයි. නුවරඑළියේ හෝටල් හිමියන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා වලට අනුව පෙනී යන්නේ විදේශීය අමුත්තන් සංචාරක හෝටල්වල නවාතැන් ගැනීමට කැමැත්තක් දක්වන අතර දේශීය අමුත්තන් බොහෝ සංචාරක බංගලා, කොටේජ් සහනිවාස ආශ්‍රිත සංචාරක නේවාසිකාගාර වල නවාතැන් ගැනීමට කැමැත්තක් දක්වන බවයි.

13. නවාතැන් පහසුකම්වල මිල පරාසය

සාමාන්‍යයෙන් නුවරඑළියේ නවාතැන් පහසුකම්වල මිල එකී පහසුකම් වල පන්තිය, පහසුකම්වල ප්‍රමිතීන්, ස්ථානය සහ දර්ශනය අනුව පරාසය රු . 2,000 සිට රු. 60,000 දක්වා වෙනස් වේ. හෝටල් හිමියන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලට අනුව, ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යන බැවින්, උපරිම සමයේදී නවාතැන් මිල ශීඝ්‍රයෙන් ඉහළ යන බව සඳහන් කරන ලදී. එපමණක් නොව, නගර මධ්‍යයේ සිට ඇති දුර අනුව නවාතැන් මිල ප්‍රතිලෝමව වෙනස් වන අතර එයින් අදහස් වන්නේ නගර ප්‍රදේශයේ නවාතැන් මිල දුරස්ථ ප්‍රදේශවල පිහිටා ඇති ඒවාට වඩා වැඩි බවයි.

14. ආහාර සහ ආපන ශාලා

මෙම ස්ථානයට දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා නුවරඑළිය සෑම අංශයකින්ම විශාල විවිධත්වයක් ඇත. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලාංකීය ආහාරවල සිට ඉතා සුප්‍රසිද්ධ ආහාර දක්වා සෑම දෙයක්ම පිරිනමමින් රටේ හොඳම භෝජන අත්දැකීමක් තෘප්තිමත් කිරීමට සහ සැපයීම සඳහා නුවරඑළියට යන මාර්ගයේ සහ ඇතුළත විශාල අවන්හල්, කැෆේ, බේකරි, භෝජන ශාලා, බාර් සහ විවේකාගාර සැලකිය යුතු ප්‍රමාණයක් පිහිටා ඇත . ඒ ඒ සංචාරකයන්ට අවශ්‍ය ආකාරයේ ආහාර බෝජන සම්බන්ධයෙන් පුද්ගලයෙකුට රුපියල් **500** සිට රුපියල් **3,500** දක්වා පරාසයක පවතින මුල පරාසයක් වැය වන බව පෙනේ.

බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත මුහුණත, ගෘහ භාණ්ඩ, සමස්ත අභ්‍යන්තර හා බාහිර අවකාශයන්හි විශිෂ්ට මෝස්තර මෙම ආහාර අවන්හල් ස්ථාන අද්විතීය හා ආකර්ෂණීය කරයි. උච්ච සමයේදී, ග්‍රෙගරි වැවේ නගර සීමාවේ සහ ඉවුරුවල පිහිටුවා ඇති තාවකාලික කුටි සංඛ්‍යාවක් එහි අමුත්තන්ට විවිධ ආහාර ද්‍රව්‍ය සපයයි. එසේ වුවද, එය මුළු දිස්ත්‍රික්කය තුළම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි අවන්හල් සංඛ්‍යාව **5**ක් ලෙස අඩුවෙන් වාර්තා වී ඇත. (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ **2019 -** පළමු කාර්තු වාර්තාව). මෙහිදී ප්‍රදේශය තුළ බෙදාහරින ආහාරවල ප්‍රමිතිය පිළිබඳවද අමුත්තන්ගේ ප්‍රතිපෝෂණය ඇතැම් විට සඳහන් කරන තැන් මෙන්ම මෙම මාතෘකාවේ පැන නගින ගැටලු විසඳීමටද අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කළ යුතු බවට සැකයක් නැත.

15. සාප්පු සවාරි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නගරය ලෙස ක්‍රියා කරන බැවින්, එය සෑම ආකාරයකම පාහේ රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන වලින් සමන්විත වේ. එබැවින්, මෙම ආයතනවල සේවය කරන්නන් හට පහසුකම් සැලසීම සඳහා එදිනෙදා අවශ්‍යතා සඳහා භාවිතා කළ හැකි හොඳින් ස්ථාපිත සිල්ලර වෙළඳපොළක් ඇත. මෙම තත්ත්වය දේශීය හා විදේශීය අමුත්තන් සඳහා ධනාත්මක ප්‍රතිලාභයක් ලබා දෙයි. එසේ වුවද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස එහි අමුත්තන්ට විශිෂ්ට සාප්පු සවාරි අත්දැකීමක් ලබා දීම සඳහා ගුණාත්මක සහ නව්‍ය අලෙවිකරණ උපාය මාර්ග වැඩිදියුණු කිරීමක් අවශ්‍ය වේ.

2.2.15. නුවරඑළියේ ආකර්ෂණීය ස්ථාන

නුවරඑළියේ වසන්ත උත්සව සමය ලෙස හඳුන්වනු ලබන අප්‍රේල් මාසයේදී සංවිධානය කරන ලද පවුලේ අයගේ හෝ මිතුරන්ගේ සැමරුම් සහ ක්‍රියාකාරකම් හැරුණු විට, වසර පුරා නරඹන්නන් සඳහා ස්වභාවිකව නිර්මාණය වූ විශ්මයජනක ස්ථාන රාශියක් විවෘතව පවතියි. යමෙක් සංචාරයට වර්ෂාව බාධාවක් කර නොගන්නා අයෙක් නම්, ඇත්ත වශයෙන්ම නුවරඑළිය සොබා දහම විසින් නිපදවා ඇති අසිරිමත් සුන්දරත්වය විඳීමට මිහිමත ඇති සුන්දර පාරාදීසයකි. ඔබට නුවරඑළියේ උරුම ගෘහ නිර්මාණ ශිල්පය එහි ලක්ෂණ භුක්ති විඳීමට අවශ්‍ය නම්, හොඳින් කළමනාකරණය කරන ලද තේ වතු ගවේෂණය කිරීමෙන් පසු උණුසුම් තේ කෝප්පයක් පානය කර එසේ නැතහොත් දිය ඇල්ල, ස්වභාවික වනාන්තරය වෙත උණුසුම් සංචාරයක් කර , කඳු මුදුනකට නැඟී එහි සුන්දරත්වය අත්විදිය හැක. කෙසේ වෙතත් සංචාරය සඳහා වැසි රහිත සමයක් තෝරා ගැනීම වඩා හොඳය.

කෙසේ වෙතත් ආගමික ස්ථාන වැඳ පුදාගැනීම , වගාබිම් නැරබීම කඳු තරණය, කඳු නැගීම, දිය ඇලි නරබීම යනාදී කාණ්ඩ යටතේ නුවරඑළිය නගරය සහ ඒ අවට සංචාරක ආකර්ෂණ ස්ථාන රාශියක් විසිරී ඇත. ඒ අනුව, නුවරඑළිය සත්කාරක ගමනාන්තයක් ලෙස තබා ගනිමින් ආකර්ශනීය ස්ථාන නැරඹීමේ හැකියාව සංකල්පනය කිරීමෙන්, ආකර්ශනීය ස්ථාන පහත දැක්වෙන පරිදි නුවරඑළිය සංචාරක ප්‍රදේශයේ වඩාත් ජනප්‍රිය සහ විභව ගමනාන්තයන් ලෙස හඳුනාගෙන ඇත.

*සිතියම් අංක **2.8:** නුවරඑළියේ ආකර්ෂණීය ස්ථාන*



ග්‍රෙගරි වැව

නුවරඑළිය නගර මධ්‍යයේ පිහිටුවා ඇති ග්‍රෙගරි වැව ප්‍රදේශය නගරයේ සෑම නරඹන්නෙකුම පාහේ ආකර්ෂණය කරයි. එය බොහෝ විනෝදාත්මක ක්‍රියාකාරකම් සහිත ජල උද්‍යානයකි. එය වටා ඇති සශ්‍රීක හරිතයන් සමඟ අමුත්තන්ට පැරණි බ්‍රිතාන්‍ය යුගයේ වැව ඉවුරේ විනෝද චාරිකා සම්ප්‍රදායක් මෙන්ම නවීන ක්‍රියාකාරකම් වන බෝට්ටු සවාරි, වෙරළ දිගේ පෝනි සවාරි, ජෙට් ස්කීස් වැනි ජල ක්‍රීඩා, වින්ඩ්සර්ෆිං සහ තවත් බොහෝ ක්‍රියාකාරකම් ආදිය අත්විඳිය හැක. මේ අනුව, මෙය විශිෂ්ට අත්දැකීමක් ලබා දෙන විනෝදයෙන් පිරුණු පවුල් හිතකාමී ස්ථානයකි.

*රූප සටහන**2.19:** ග්‍රෙගරි වැව*

ග්‍රෙගරි වැව බ්‍රිතාන්‍ය යුගයේදී විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා විසින් විදුලිය සැපයීමේ ප්‍රධාන අරමුණ සඳහා ඉදිකරන ලද්දකි. කෙසේ වෙතත්, එය ඉතිහාසය පුරා විවේක හා විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා භාවිතා කර ඇති අතර වර්තමානයේ නගරයේ වඩාත් ප්‍රමුඛ ආකර්ෂණයක් බවට පත්ව ඇත.

වික්ටෝරියා උද්‍යානය

1897 වසරේ වික්ටෝරියා රැජිනගේ **60** වැනි ජුබිලි රාජාභිෂේකය සැමරීම සඳහා නුවරඑළියේ වික්ටෝරියා රැජින උද්‍යානය නම් කර ඇති බව පැවසේ. අක්කර **27** ක විශාලත්වයකින් යුත් මෙම උද්‍යානය විදේශීය ගස් හා ශාක විශාල ප්‍රමාණයකින් සමන්විත වේ. ගස් විශේෂ. උද්‍යානය දිගේ ගලා බසින ඇළ එහි සුන්දරත්වය වැඩි කරයි.

නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ පිළිබඳ හඳුනා ගැනීමේදි වනාන්තර පද්ධතිය ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව ප්‍රදේශයේ ඇති ගැල්වේස්, පිදුරුතලාගල, හග්ගල ආශ්‍රිත වනාන්තර හරිත පැහැයෙන් යුත් අලංකරණයක් නගරයට ලබා දෙයි. ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයක් 34%ක් එනම් හෙක්.18 ප්‍රමාණයක් වන ගහනයෙන් යුක්ත වීම මේ අරමුණු සම්පූර්ණ කර ගැනීමට ඉවහල් වනු ඇත.

5. යටත් විජිත කාලයට අයත් වර්තමානයේ පවතින ගෘහ නිර්මාණාත්මක ගොඩනැගිලි

යටත්විජිත පාලන සමයේදී ඉදිකරණ ලද වික්ටොරියානු,ජෝජ්යානු හා බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ වලින් සමන් විත ගොනැගිලි නුවරඑළියේ අනන්‍යතාව විදහා දැක්වීමට දායක වන ප්‍රධාන සාධකයකි.එම ගොඩනැගිලි 129 පමන හදුනාගෙන ඇත.මෙය සංචාරක ආනර්ශණයට මහඟු අත්වැලකි.

රූප සටහන ***5.5:*** *තැපැල් කාර්යාලය*

තැපැල් කාර්යාලය - මෙය ප්‍රදේශයේ පවතින පැරණිතම ගොඩනැගිල්ලක් වන අතර එය පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇති සංරක්ෂිත ගොඩනැගිලි ලේඛනයට ද ඇතුලත්ව ඇත.

රූප සටහන ***5. 6:*** *පැරණි ගොඩනැගිලි*

ග්‍රෑන්ඩ් හෝටලය - මෙහි මුලිකම ගොඩනැගිල්ල තනි මහලකින් යුක්ත වූ අතර එය "බාන්ස් හෝල්" නමින් 05 වන ආණ්ඩුකාර වූ සර් එඩ්වඩ් බාන්ස්ගේ නිවාඩු නිකේතනය ලෙස පාවිච්චි විය.

ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

7

රූප සටහන ***5.7:*** *හිල් ක්ලබ්*

හිල් ක්ලබ් - නුවරඑළියෙහි ඉතා අගනා හරිත පැහැයෙන් වටවූ වටපිටාවක පිහිටි පැරණි ගොඩනැගිල්ලක් ලෙස සුප්‍රසිද්ධය.

රූප සටහන ***5. 8:*** *ක්වීන්ස් කොටේජ්*

ක්වීන්ස් කොටේජ් - මෙය එංගලන්ත ප්‍රදේශය ආශ්‍රිත අංග ලක්ෂණ වලින් යුක්තව නිර්මාණය වූ නිවසක් වූ අතර එය 19 වන සියවසේ දි බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන මධ්‍යස්ථානයක් ව 1948 වන තෙක් පැවතිණි.

ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

රූප සටහන 5. 9: සෙන්ට් සේවියර් පල්ලිය

සෙන්ට් සේවියර් පල්ලිය - මෙය යටත් විජිත ගෘහ නිර්මාණ ආකෘතිය අනුව 19338 දි ගොඩනැගි ඇත

ග්‍රහනය -නිලන්ත පරණගම , මාර්තු 2017

6. සංචාරක ආකර්ශන ස්ථාන

ප්‍රධාන සංචාරක මරමස්ථානයක් ලෙස නුවරඑළිය නගරය හා ඒ අවට ඇති සංචාරක නැරඹුම් ස්ථාන නුවරඑළියට අවේනික ගති ලක්ෂණ මූර්තිමත් කිරීම යන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මනා පිටුවහලක් වේ. ඒ අතර ග්‍රෙගරි උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය, හග්ගල උද්‍යානය, ගැල්වේස් උද්‍යානය, ගොල්ෆ් ක්‍රීඩාංගනය, හෝර්ටන් තැන්න, සඳතැන්න, සීතාඑළිය, සීතාකෝවිල, අඹේවෙල කිරි නිෂ්පාදනාගාරය කුඩාඔය ලබුකැලේ හා බොරලන්ද තේ කර්මාන්ත ශාලා හා ඒ ආශ්‍රිත තේවතු ප්‍රධාන වශයෙන් මෙම කලාපයේ පිහිටි සංචාරක ආකර්ශණීය ස්ථාන වේ. මීට අමතරව ලවර්ස්ලීප් දිය ඇල්ල, බ්‍රිතාන්‍ය යුගයට අයත් ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ සහිත ගොඩනැගිලි, මල් උද්‍යාන, තව දුරටත් සංචාරකයන්ගේ ආකර්ශන ස්ථාන වේ.

මෙම ස්ථාන වල සංචාරකයන්ගේ පැමිණීම පිළිබද තොරතුරු පහත වගු අංක 5.6 මගින් පෙන්නුම් කෙරේ.

*වගු අංක **5.4:** සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු*

	2012	2013	2014	2015	2016
විදේශීය සංචාරකයින්					
හග්ගල	**12489**	**14713**	**18071**	**24188**	**29192**
හෝර්ටන්තැන්න	**39123**	**34065**	**69979**	**87962**	**131670**
ගැල්වේස්	**82**	29	84	**49**	**198**
ග්‍රෙගරි උද්‍යානය					**61622**
වික්ටෝරියා උද්‍යානය					**47294**
සඳතැන්න					**8673**
දේශීය සංචාරකයින්					
හග්ගල	**587749**	**511879**	**578825**	**742133**	**956815**
හෝර්ටන් තැන්න	**184744**	**46511**	**198374**	**228858**	**319999**
ගැල්වේස්	**1521**	**1084**	**1669**	**2047**	**3345**
ග්‍රෙගරි උද්‍යානය					**721495**
වික්ටෝරියා උද්‍යානය					**643725**

මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය / නුවරඑළිය ම.න.ස 2017

ඒ අනුව බලන කල නුවරඑළිය ප්‍රදේශයේ ඇති සංචාරක ආකර්ෂණීයබව නිසාම වාර්ෂිකව දේශීය සංචාරකයින් මිලියන එකකට ආසන්න ප්‍රමාණයක් හා විදේශී සංචාරකයන් 130000කට ආසන්න ප්‍රමාණයක් පැමිණේ.මේ තුලින් ප්‍රෙද්ශයේ ආර්ථික වර්ධනයට මනා පිටුවහලක් වන අතර වාර්ෂිකව ප්‍රෙද්ශයට රු.මිලියන 12,000 පමණ මුදලක් ඇදී එයි. ප්‍රදේශය පුරා සංචාරක හෝටල් හා ලැගුම් හල් 180 ක් පමණ ව්‍යාප්තව ඇති අතර කාමර 1600 ක් පමණ සංචාරකයින් හට සපයනු ලබන බව නුවර එළිය මහ නගර සභා වාර්තා සනාත කරයි.මෙම සංචාරක ආකර්ෂණීය බව නිසාම ආර්ථික සංවර්ධනයට සෘජු දායකත්වයක් ලැබේ.මේ බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වර්තාව අනුව ප්‍රදේශයේ සේවා නියුක්තිය 20%කට ආසන්න ප්‍රමාණයක් සංචාරක ක්ෂේත්‍රයේ සෘජු රැකියවන්හි නියුක්තිය තහවුර කර ඇත. මෙම සාධක හේතුවෙන් 2030 වන විට දිදුලන ආර්ථිකයක් ලගා කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනීමට පහසු වනු ඇත.

රූප සටහන 5. 10: සංචාරක ආකර්ශන ස්ථාන

රූප සටහන 5. 11: සංචාරක ආකර්ශන ස්ථාන

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

7. උඩරට එළවළු ගොවිතැන

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ උඩරට කෘෂිකාර්මික ඉඩම් හෙක්. 897 ප්‍රමාණයක් වගා කරනු ලැබේ. නුවරඑළිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි දිනකට සාමාන්‍ය නිෂ්පාදන ටොන් 150 සාමාන්‍ය වාර්ෂික ආදායම - රු. මිලියන 5250. මෙය සමස්ත උඩරට එළවළු ආදායමෙන් 23%ක් වේ.

*රූප සටහන **5.12:** උඩරට එළවළු*

ග්‍රහනය -නිලන්ත පරණගම , මාර්තු 2017

8. තේ වගාව ශ්‍රී ලංකාවේ සමස්ත කඳුකර වැඩුණු තේ හෙක්ටයාර් 41137 ක් වන අතර නිෂ්පාදනය - 64 Mn/Kg වේ. මධ්‍යනා වශයෙන් නුවරඑළිය ප්‍රදේශය මඟින් කිලෝග්‍රෑම් මිලියන 1.83 ක් ලබා දුන් අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත නිෂ්පාදනයෙන් 2.8% කි. ඒ නිසා මේ තේ නිෂ්පාදනයෙන් රු. ප්‍රදේශයේ ආදායම මිලියන 836 කි. එය ශ්‍රී ලංකා තේ ආදායමෙන් 0.7% කි

9. ප්‍රදේශයට ආවේනික වන මල් වගාව සහ මල් වර්ග

මල් වර්ග - ජේබරා, ඩේසි, බාබන්ඩේසියා, කානේෂන්, ක්‍රිෂාන්තිමම්, ඇස්තමේරියා, ලිලී, රෝස, හයිඩ්‍රින්ජියා

වගා කරන ප්‍රදේශ - මීපිලිමාන, වජිරපුර, ලවර්ස්ලීප්, ශාන්තිපුර, කන්දේ ඇල

දළ වශයෙන් 270කට ආසන්න මල් වගාකරුවන් පිරිසක් නුවරඑළිය මල් සංගමයෙහි සාමාජිකයන් ලෙස ලියාපදිංචි වී ඇත.

රු. මිලියන 10ක පමණ ආදායමක් මාසිකව උපයා ගත හැක.

සංචාරක ආකර්ෂණය අතින් හා ආර්ථික අංශයෙන් ප්‍රධාන ස්ථානයක් ලෙස ගන්නා මෙම මල් වගාව හා සම්බන්ධව නුවරඑළිය වසන්ත කාලයේදි ප්‍රදර්ශනයන්ද පැවැත්වේ.

රූප සටහන 5. 13: උඩරට මල් වගාව

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

.5.2.2දුබලතාවයන්

1. **ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම**

ඉහත 5.1.2 යටතේ හදුනාගත් පරිදි ප්‍රදේශයේ පානිය හා මතු පිට ජලයේ ගුණාත්මක භාවය හිනවීම නිසාම පිරිසිදු ජල පද්ධතියක් යන නුවරඑළියට හිමි ආවේනික ගති ලක්ෂණය ඉවත් වීම කෙරෙහි බලපෑම් වී ඇත. තවදුරටත් මෙම මූලාශ්‍රයන් අපවිත්‍ර වීම මේ තුළින් පරිසර පද්ධතියට හානි සිදුවීම හා ජෛව විවිධත්වයට හානි සිදුවීම මෙම අරමුණු සපුරා ගැනීම සඳහා සිදුවන බලවත් දුබලතාවයකි.

2. **වනගහනය අඩුවීම හා රක්ෂිත ආක්‍රමණය**

වනාන්තර ගහනය හා හරිත වැස්ම නුවරඑළියේ ගති ලක්ෂණ මූර්තිමත් කරන ප්‍රධාන අංගයක් වේ. 34%ක් වු වනාන්තර ප්‍රමාණය ඒ සඳහා ඉවහල් වි ඇති නමුත් දිගින් දිගටම වනගහනය අඩු වීමත් පෙන්නුම් කෙරේ. එය 5.1.2 විස්තර කර පරිදි 2010 දි 40%ක් හා 2017දි 34%ක් ලෙස පහත වැටි ඇත. ඒ අනුව මෙම අරමුණු සපුරා ගැනීමට මෙම වනගහනය හීන වීම තර්ජනයක් වි ඇත.

3. නුවරඑළිය අවේනික ගෘහ නිර්මාණ ලක්ෂණ වල වෙනස්වීම.

නුවරඑළියට ආවේනික පරිසරය හා ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී අතීතයේ සිට පැවති කොලොනියල් ගෘහ නිර්මාණ ලක්ෂණ මේ වන විට විවිධ වූ අක්‍රමවත් ගොඩනැගිලි සැලසුම් තුලින් වෙනස් වී ඇත. සංචාරක ආකර්ශනීය ආවේනික ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ නොමැති වීමෙන් එහි පෙනුම නොමැති වීමත් සංචාරක සංවර්ධනය බාධාවක් වී ඇත.

*රූප සටහන **5. 14:** නුවරඑළියේ අනන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වල වෙනස්කම්*

පැරණි ගෘහ නිර්මාණ ලක්ෂණ	අද්විතීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලින් තොරව සිදු කරන නව ඉදිකිරීම්

ග්‍රහනය : නිලන්ත පරණගම මයා මාර්තු, 2017

4. නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශන තල අවහිර වීම.

නුවරඑළියට ආවේනික කඳු පන්තින් හා දිය ඇලි වල දර්ශන තල නව ගොඩනැගිලි හේතුවෙන් ආවරණය වී ඇත. මෙය නුවරඑළිය නගරයේ අවේනික පරිසර සුන්දරත්වය පිලිඹිබු කිරීම සඳහා වන බාධාවක් වී ඇත.

*රූප සටහන **5. 15:** නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශණ තල අවහිර වී ඇති අයුරු*

ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

රූප සටහන 5. 16:නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශණ තල අවහිරවීම අයුරු



ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

5. අඩු ආදායම් නිවාස හා පැල්පත්

නුවරඑළිය නගර සීමාව තුළ හා ඉන් පිටත ඇති නිවාස අතරින් 21%ක ප්‍රමාණයක් ඒකාබද්ධ නිවාස පේළි නිවාස හා ලයින් නිවාස වලින් සමන්විත වේ. විශේෂයෙන් විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම පාදක කරනු ලබන ග්‍රාම නිළධාරි වසම් 21 තුළ නිවාස තත්ත්වය හා එහි පදිංචි පවුල් සංඛ්‍යාව පිළිබඳ පහත වගු අංක 5.7 මගින් පෙන්නුම් කෙරේ. මීට අමතරව නුවරඑළිය මහ නගර සභා සීමාව තුල අඩු පැල්පත් නිවාස 590ක් තුල පවුල් 638ක් හා ජනහගහනය 3331 ක් වාසය කරනු ලබයි. මෙය සංචාරක නගරයක් වන නුවරඑළියේ පිලිඹිබුවට මෙන්ම ආර්ථික සංවර්ධනයටද බාධාවක් වී ඇතඑසේම මේ තත්වය යටතේ ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටමද ඉහල ගොස් ඇත.

*රූප සටහන **5. 17:** අඩු ආදායම් නිවාස*

ග්‍රහනය -නිලන්ත පරණගම ,මාර්තු 2017

*වගු අංක **5. 5:** නිවාස වල තත්ත්වය*

ග්‍රාම නිලධාරි කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	නිවාස සංඛ්‍යාව	නිවාස හිඟය	තනි මහල් නිවාස	මහල් 2 නිවාස	මහල් 2ට වඩා වැඩි නිවාස	ඒකාබද්ධ නිවාස	මහල්නිවාස	පැල නිවාස	පේළි නිවාස	පැල්පත්
එකතුව	**11008**	**10784**	**224**	**6861**	**791**	**71**	**483**	**19**	**231**	**2184**	**144**
පවත්නා නිවාස සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			**2.1**	**63.6**	**7.3**	**0.7**	**4.5**	**0.2**	**2.1**	**20.3**	**1.3**

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2017

එම තත්ත්වයත් සමඟ ප්‍රදේශයේ දරිද්‍රතා මට්ටම ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

සිතියම් අංක 5.7:දරිද්‍රතා මට්ටම



.5.2.3අවස්ථා

01.ජාත්‍යන්තර වශයෙන් පරිසර සංවේදි සංචාරක සඳහා වැඩි ඉල්ලීම

*වගු අංක **5. 6:** සංචාරක ආගමනය -අංශ අනුව*

	2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016
විනෝදාත්මක	67.4	67.1	73.2	80.0	78.9	80.4	74.4	72.7	67.95	66.6	83.4
ව්‍යාපාර	17.8	10.5	8.5	8.6	12.7	8.0	9.0	5.2	1.33	1.3	1.8
ඥාතීන් හමුවීමට	7.6	8.3	8.3	5.2	5.4	8.2	11.7	12.4	27.45	25.5	11.5
සමුළු හා රැස්වීම්	3.0	1.5	1.3	1.4	1.0	1.7	2.2	2.0	.29	.3	.8
සංස්කෘතික හා ආගමික	1.7	2.8	2.6	2.0	.8	.3	2.2	4.8	0.01	0.1	0.0
සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	[illegible]	[illegible]	0.6
ක්‍රීඩා	-	-	-	-	-	-	-	-	0.53	0.7	0.4
රාජකාරී	-	-	-	-	-	-	-	-	0.11	0.2	0.0
වෙනත්	2.5	9.8	6.1	2.8	1.2	1.4	0.5	2.9	1.49	1.7	1.2
මුළු	100	100	100	100	100	100	100	100	100	100	100

මූලාශ්‍රය : සංචාරක සං.අධි 2017

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ අරමුණ හා කාරණය පිළිබඳව සැලකීමේදී පසුගිය වසර කිහිපය තුළ පාරිසරික හා විනෝදාත්මක කටයුතු සඳහා පැමිණෙනන්ගේ සංඛ්‍යාව වැඩිවීමක් සිදුවී ඇති බව වගු අංක 5.8 මගින් පෙන්නුම් කෙරේ. ඒඅනුව පාරිසරික වැදගත්කමක් ඇති හා විනෝදාත්මක කටයුතුවලින් සමන්විත නගරයට සංචාරකයින්ගේ පැමිණීම වැඩි ප්‍රවණතාවයක් ඇති බව මෙයින් හදුනාගත හැක. එය ඉදිරි ආර්ථික වර්ධනයට සෘජුවම බලපානු ලබයි.

5.2. .4 තර්ජන

01කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම් .

රූප සටහන 5. 18: කාළගුණ විපර්යාස හා දේශගුණ තත්වයන් වෙනස්වීම්



මූලාශ්‍රය - MMI සමීක්ෂණ

ගෝලීය කාලගුණ තත්ත්වය වෙනස්වීම් හේතුකරගෙන නුවරඑළිය ප්‍රදේශයේද පවතින දේශගුණ හා කාලගුණ තත්ත්වයන් දිර්ඝ කාලයක පරාසයක් තුළ වෙනස්වීමකට භාජනය වන බව හඳුනාගත හැක. මෙය MMI ආයතනයේ සමීක්ෂණ අනුව තහවුරුවී ඇත.

ශක්තීන් S W දුබලතාවයන්

ශක්තීන් (S)

1. සංචාරක ආකර්ශන ස්ථාන
2. පවත්නා බ්‍රිතාන්‍ය සම්ප්‍රදායේ ලක්ෂණ සහිත ගොඩනැගිල්ල
3. උඩරට එළවළු වගාව.
4. තේ වතු
5. නුවරඑළියට සුවිශේෂීමල් වගාව
6. ඉහළ ආදායමක් සහිත මහ නගර සභාව
7. නුවර එළිය වසන්ත සැණකෙය
8. උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම
9. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම.
10. යෝජිත හා ක්‍රියාත්මක නව සංවර්ධන ව්‍යාපෘතීන්

දුබලතාවයන් (W)

1. පානිය ජලයේ අපවිත්‍රතාවය හා වියලි කාලයේ ජල හිගයක් පැවතීම.
2. රජයේ ඉඩම් ඌණ භාවිතය
3. නුවරඑළිය අවේනික ගෘහ නිර්මාණ සහිත ගොඩනැගිලි ඉදිකිරීම් අඩු වීම.
4. නව ඉදිකිරීම් හේතුවෙන් දර්ශන තල අවහිර වීම.
5. පැල්පත් මඩුක්කුක හා අඩු පහසුකම් නිවාස පැතිරීම.
6. කෘෂි කාර්මික ඉඩම් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිතා කිරීම.
7. සංචාරකයින් සඳහා ඇති පහසුකම් අවම වීම.

5.3. ප්‍රදේශය තුළ ජනතාව කේන්ද්‍ර කරගත් තිරසාර යහපත් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම

අවස්ථා (O)

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020
2. ශ්‍රී ලංකාවෙ යෝජිත නව අධිවේගී මාර්ග පද්ධතිය
3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති
4. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය

තර්ජන (T)

1. නව සංචාරක ආරක්ශන නගර ලෙස නුවරඑරළිය අවට නගර සංවර්ධනය වීම. (ඇල්ල, බණ්ඩාරවෙල, හපුතලේ, නල්ලතන්නිය)
2. නුවරඑළිය සඳහා ඇති පිවිසුම් මාර්ග නිතරම කාළගුණ තත්වයන් තුලදී අවධානම් වීම.
3. අප්‍රේල් මස තුල දින කිහිපයකදී පමණක් දේශිය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇදී ඒම.

අවස්ථා O T තර්ජන

5.3. ප්‍රදේශය තුළ ජනතාව කේන්ද්‍ර කරගත් තිරසාර යහපත් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම

.5.3.1ශක්තීන්

06. ආර්ථික අංශයෙන් පොහොසත් මහ නගර සභාවක් පැවතීම

නුවරඑළිය මහ නගර සභාව සතුව වාර්ෂිකව අතිරික්ත ආදායමක් සහිත වීම හේතුවෙන් නගර සීමාව තුල ප්‍රාග්ධන ආයෝජන සඳහා වැඩි ඉඩ ප්‍රශ්ථා ඇත. ඒ හේතුවෙන් නගරය තුල සංවර්ධන කටයුතු සඳහා හා අපරවායුහ පහසුකම් සංවර්ධනය සඳහා මෙය බලවත් රුකුලක් වේ. පසුගිය වර්ෂ 5ක මහ නගර සභාවේ ආදායම හා වියදම මෙන්ම අතිරික්තය ප්‍රස්ථාර මගින් පෙන්නුම් කෙරේ.

රූප සටහන 5. 19: නුවරඑළිය මහ නගර සභාව වාර්ෂික ආදායම් හා වියදම්



මූලාශ්‍රය :නුවරඑළිය මහ නගර සභාව

07.නුවරඑළිය වසන්ත සැණකෙළිය

නුවරඑළියේ වසන්ත සමයෙහි උත්සව සහ වැඩසටහන් සෑම වසරකම අප්‍රේල් මාසයේ පැවැත්වෙන අතර එබැවින් බොහෝ සංචාරකයින් ප්‍රදේශයට ආකර්ෂණය වේ. එය නුවරඑළියේ ප්‍රධාන උත්සවය වන අතර එය දේශීය සංචාරකයින් 100000-200000 ක් ආකර්ෂණය කරයි. පහත ප්‍රස්ථාරයෙන් සංචාරකයින්ගේ පැමිණීම පෙන්නුම් කරන අතර වසර පුරා බොහෝ සිදුවීම් සහ වැඩසටහන් සංවිධානය කරයි. ඍතුමයකාලපරිච්ඡේදය තුළ හෝටල් සහ ආගන්තුක නිවාස සඳහා ඉහළ ඉල්ලුමක් සහ ප්රදේශය සඳහා ආර්ථික ප්රතිලාභ වැඩි කිරීමට උපකාරී වේ.

රූප සටහන 5. 20: නුවරඑළිය වසන්ත සැණකෙළිය කාලසටහන

මූලාශ්‍රය :නුවරඑළිය මහ නගර සභාව

08. උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම

විසල් නුවරඑළිය සංවර්ධන සැලැසුම් ප්‍රදේශය උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම සංචාරක ආකර්ශනය වැඩිවීමට හේතු වී ඇත. විශේෂයෙන් උඩරට දුම්රිය මාර්ගයේ ඇති මනස්කාන්ත දර්ශන හේතුවෙන් සංචාරකයින් වැඩි ප්‍රමාණයක් තෝරාගනු ලබන ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය ප්‍රවාහන මාධ්‍ය කැපී පෙනේ. නානුඔය දුම්රිය ස්ථානය ප්‍රෙද්ශයට ආසන්න දුම්රිය ස්ථාවන වන අතර එය ප්‍රධාන ගමනාන්තයක් වී ඇත.

රූප සටහන 5.21: උඩරට දුම්රිය මාර්ගය ආසන්නයේ පිහිටීම



මූලාශ්‍රය :අන්තර්ජාලය ඇසුරෙන්

රූප සටහන 5. 22: උඩරට දුම්රිය මාර්ගයට ආසන්නව පිහිටීම

09. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම.

නුවරඑළිය නගරය දේශිය හා විදේශිය සංචාරකයින් අතර ප්‍රසිද්ධ ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම මෙහි සංචාරක ප්‍රවර්ධනයෙහි ලා මනා පිටුවහලක් වේ. ලෝක පාරිසරික සංචාරක ස්ථාන වල වර්ගීකරණයේදී නුවරඑළියට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එසේම ශ්‍රී ලංකාවේ සංචාරක ස්ථාන ලෙස ද නුවරඑළිය නගරය හඳුන්වා තිබීම තව දුරටත් බලපානු ඇත.

රූපසටහන 5.23 ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක කේන්ද්‍රස්ථානයක්



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

10. යෝජිත හා ක්‍රියාත්මක නව සංවර්ධන ව්‍යාපෘති

නුවරඑළිය නගරය තුල වර්තමානයේ ක්‍රියාත්මක ව්‍යාපෘතින් හා යෝජිත ව්‍යාපෘතින් පිළිබඳ විස්තර වගුව මඟින් පෙන්නුම් කෙරේ.

වගු අංක 5. 9 : යෝජිත හා ක්‍රියාත්මක ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය	වර්තමාන තත්වය	ආයෝජන වටිනාකම මිලියන	අයෝජන ආයතනය
1	නුවරඑළිය නව රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය	ක්‍රියාත්මකයි	14000.00	සෞඛ්‍ය අමාත්‍යාංශය
2	ග්‍රෙගරි වැව සංවර්ධන ව්‍යාපෘතිය	ක්‍රියාත්මකයි	450.00	නා. සං.අධි/ නු. මහ. නගර සභාව
3	ඉහල උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය	යෝජිතයි	12000.00	ක්‍රීඩා අමාත්‍යාංශය / පුද්ගලික ආයෝජන
4	නුවරඑළිය මධ්‍යම වෙළඳපොල සංවර්ධනය	ක්‍රියාත්මකයි	450.00	නා. සං.අධි/ නු. මහ. නගර සභාව
5	වතුසේවක නිවාස සංවර්ධන ව්‍යාපෘතින්	ක්‍රියාත්මකයි	-	වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය
6	ඕක්ලි කොටේජ් ඉකෝවිලා කොටේජ් ව්‍යාපෘතිය	යෝජිතයි	-	නා.සං.අධි
7	මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
8	ඕෂන් විව් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
9	නුවරඑළිය තේමා උද්‍යාන ව්‍යාපෘතිය	යෝජිතයි	-	-
10	මධ්‍යම අප ජලපිරිපහදු ව්‍යාපෘතිය	යෝජිතයි	-	-

මෙම ප්‍රධාන ව්‍යාපෘතින් ප්‍රදේශයේ දිදුලන ආර්ථිකයක් ඇති කිරීම සඳහා වන ප්‍රධාන පිටුවහලක් වනු ඇත.

5.3.2 දුර්වලතා
07. සංචාරකයින් සඳහා ඇති පහසුකම් අවම වීම.

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් සලකා බැලීමේදී 2016 වසරේදී මිලියන 02ක් පමණ වන අතර, 2016 වසරේ සංචාරක මණ්ඩල ප්‍රගති වාර්තාව අනුව ඉන් 7.5%ක සංචාරකයින් ප්‍රමාණයක් මධ්‍යම කඳුකරයේ සංචාරය කරනු ලබයි.

එසේම ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් අතරින් වැඩිම ප්‍රමාණයක් විනෝදාස්වාද කටයුතු සඳහා පැමිණෙන සංචාරකයින් වේ. එය 2016 වසරේදී 23% , 2015 දී 66%ක් ලෙස දැක්වේ.

මේ අනුව නුවරඑළියට වාර්ෂිකව පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය දළ වශයෙන් 2016 වසරේ දී දේශිය 950,000 හා විදේශිය 135,000 වන අතර වර්තමානයේ නුවරඑළිය ප්‍රදේශයේ පවතින පහසුකම් මෙම සංචාරකයින් සඳහා හා ඉදිරියේ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම ගැටළු තත්වයකි.

.5.3.3අවස්ථා

1. **ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020**

සංචාරක සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන සැලැස්ම සඳහා හඳුනාගත් ප්‍රධාන නගරයක් ලෙස නුවරඑළිය නගරයද නම් කර ඇත. එය ද නුවරඑළියේ සංචාරක සංවර්ධන සඳහාද ප්‍රධාන පිටුවහලක් වේ.මෙම සැලස්ම යටතේ හඳුනාගත් සංචාරක කලාප අතරින් පළමු අදියරයේදී ක්‍රියාත්මක කිරීම සඳහා නුවරඑළිය නගරයද තෝරගෙන ඇත.

රූප සටහන 5. 24 : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන සැලැස්ම 2017-2020



මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2. ශ්‍රී ලංකාවේ යෝජිත නව අධිවේගී මාර්ග පද්ධතිය

යෝජිත අධිවේගී මාර්ගවල ගමනාන්ත වනනුවරඑළියට වඩාත්ම සමීප වන රත්නපුර, මත්තල සහ මහනුවර යන නගර හරහා සංචාරකයින්ට ඉහත ගමනාන්තවලින් නුවරඑළියට පහසුවෙන් ළඟා විය හැකිය. ප්‍රදේශයේ නිෂ්පාදන වෙනත් ස්ථාන ප්‍රවාහනය කළ හැකි අතර සංචාරකයින්ට පහසුවෙන් මෙහි පැමිණීමට හැකිවීමද ඉහල අවස්ථාවක් වේ.

රූප සටහන 5. 25: ශ්‍රී ලංකාවේ යෝජිත නව අධිවේගී මාර්ග පද්ධතිය



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

3. කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකර්ම දෙපාර්තමේන්නව හා ඒ ආශ්‍රිත ආයතන මගින් 2017-2020 කේන්ද්‍ර කර ගත් නව කෘෂිකර්ම සංවර්ධන සැලැසුම් හා ව්‍යාපෘතින් කෘෂිකර්මාන්තයේ වැඩි දියුණුවටත් ඉහල අස්වැන්නක් ලබා ගැනීමටත් මනා පිටුවහලක් වේ.

4. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය වාර්ෂිකව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය වර්ධනය වීමක් පෙන්නුම් කරන අතර එය ප්‍රස්ථාර අංක 5.3.හා 5.4 මගින් පෙන්නුම් කරන අතර එමගින් වැඩි සංචාරකයින් ප්‍රමාණයක් නුවරඑළිය ප්‍රදේශයට ආකර්ෂණය කර ගැනීමටද පිටුවහලක් වේ.

රූප සටහන 5.26: සංචාරක ආගමනය



රූප සටහන 5.20.6: සංචාරක ආගමනය

Market Growth Trends by Nationality - Growth Indices
(Average 1963/1966 = 100) - 2006 to 2016

Table (a)

Market	2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	Average Annual Growth Rates
Western Europe	2,917	2,498	2,115	2,171	3,255	4,088	4,820	5,337	6,363	7,647	8,613	29.6
Asia	4,024	3,338	2,926	2,900	4,087	5,559	6,382	8,775	10,644	10,644	14,686	28.6
North America	1,014	806	660	712	1,153	1,525	1,612	1,990	2,065	2,614	3,216	7.2
Australasia	2,954	2,728	2,752	3,087	4,392	6,099	5,936	8,576	8,444	8,588	11,033	25.0
Others	3,536	5,749	6,492	6,507	9,461	11,980	17,092	23,193	30,450	30,776	30,776	54.0
All Markets	2,943	2,598	2,306	2,355	3,442	4,501	5,288	6,703	8,031	9,457	10,785	26.2

මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය

.5.3.4දුර්වලතා

1. නව සංචාරක ආකර්ශන නගර ලෙස නුවරඑළිය නගරය අවට නගර සංවර්ධනය වීම.

නුවරඑළිය නගරය අවට ප්‍රධාන සංචාරක නගර ඇල්ල බණ්ඩාරවෙල, හපුතලේ හා නල්ලලතන්නිය නගර හඳුනා ගත හැකි අතර ඒවායන්හි විදේශිය සංචාරකයින්ගේ ආකර්ශණය පසුගිය වසර වල සාපෙක්ෂව වැඩි වී ඇත. එය නුවරඑළිය නගරයට බෙහෙවින් බලපාන තර්ජනයක් වනු ඇත.

2. නුවරඑළිය නගරය සඳහා ඇති පිවිසුම් මාර්ගය කාළගුණික තත්ත්වයන් වලදී අවධානම් සහගත වීම.

නුවරඑළිය නගරයට ලඟාවීම සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග වල අවිස්සාවේල්ල, හැටන් මාර්ගය, මහනුවර ගම්පොල මාර්ගය හා බදුල්ල වැලිමඩ මාර්ගය අධික වර්ෂා සමයන්හිදී දැඩි මීදුම් සහිත වීම හා නාය යෑමේ අවධානයට ලක් වීම නිසා සංචාරකයින්ගේ ආගමනය අඩු වි ඇත.

රූප සටහන 5.20.7: නාය යෑමේ අවධානයට ලක් වීම

Nuwara Eliya district prepares to face landslides

By Shelton Hettiarachchi

With heavy rains expected in the next few months, the Government Agent and authorities in the Nuwara Eliya district are gearing up to face the possibility of landslides and other possible disasters in the Walapane area.

February 2011: The road close to Sri Sumangala Vidyalaya caved in due to heavy rains

In November 2007 the rains left eleven dead and three persons went missing in the Walapane and Hanguranketa divisions of the district. The area is also prone to landslides. In 1983 thirteen persons died in landslides at Ketayapathana, while Wathumulla was affected by landslides in 2006 and in 2007.

The Red Cross and a number of other NGOs continue to provide relief to victims of these landslides. To face this situation the Red Cross has identified a number of vulnerable areas and commenced setting up centres to house victims of landslides in addition to training community based organisations in disaster management.

Ven. Kudaligamuawe Seelavimala Thera of the Subodharamaya said the Red Cross had helped victims of the 2007 landslide. The Principal of the Pussadeva MMV A.K.R.M Dayarathne, said the Red Cross had trained the students of his school to help victims of such disasters.

He added in the event of earth slips or landslides his school would be used as a disaster management centre and a centre to house the victims. The school can house up to 3,000 victims he said. Mr. Dayarathne added the ICRC had undertaken to build a wall around the school for security reasons and provided first aid training to students to help victims of disasters.

He said the school also had adequate communication facilities but added it needed a stand-by electricity generator now that it had been designated a disaster management centre.

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

3. අප්‍රේල් මාසයතුල දින කිහිපයක තුල පමණක් දේශිය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇදී එම.

නුවරඑළිය වසන්ත සැණකෙළිය තුලදී දේශිය සංචාරකයින්ගේ පැමිණීම ඉහල අගයක් පෙන්නුම් කරන අතර (වගු අංක 6.5) අප්‍රේල් මස 10, 20 අතර කාලය තුල දෛනික සංචාරක ගහනය 100000- 150000 අතර වේ. මෙය ඔවුන් සදහා පහසුකම් සැපයීමේදී ප්‍රධාන ගැටලුවක් වන අතර තදබදය අඩු පහසුකම් හේතුවෙන් නැවත ඔවුන්ගේ පැමිණීම හීන කරයි.

ප්‍රස්තාර අංක 5.2: සංචාරක පැමිණීම - නුවරඑළිය



මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය / නු.එ. ම.න.ස

පරිච්ඡේද 06

සැලැස්ම

06

6.1. සංකල්පිත සැලැස්ම

6.1.1. හැදින්වීම

නුවරඑළියට ආවේනික සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා වන ආකාරයට ඒ වටා ඇති වනාන්තර සහිත කඳු පන්තින් ආරක්ෂා කිරීමටත් ඒ හා බැඳුනු ජල මුලාශ්‍ර පද්ධතින් ආරක්ෂා කිරීමටත් පෙර දැරි කරගත් සැලසුම් සංකල්පයන් මෙම සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ.

මෙම නගරය වටා ඇති කිකිළියාමාන, සිංගල් ට්‍රී, මාගස්තොට, සීතාඑළිය, ලවර්ස්ලීප්, පිදුරුතලාගල ආශ්‍රිත වනාන්තර අධි සංවේදි හරිත කලාපයක් ලෙස පවත්වා ගෙන යාමටත් එයින් පෝෂණය වන නානුඔය ඇල, තලගල ඇල, බ්රුක්ප්ලේන් ඇල හා ප්‍රධාන ඇල මාර්ග හා ඒ ආශ්‍රිත අතුරු ඇල මාර්ග හා ග්‍රෙගරි වැව, බ්රුක්ප්ලේන්, කටුමාන, ජලාශ වල පිරිසිදු උසස් ජල පද්ධතියක් ඇති කිරීමටත් ඒ වටා ඇති සංවේදි පරිසරය සමගින් නේවාසික, සංචාරක ජනතාව උදෙසා විනෝදාත්මක කලාප හා සංචාරක කලාප මගින් තිරසාර සංවර්ධනයක් ප්‍රදේශයට ලගා කර ගැනීමත් මෙම සැලැස්ම මගින් අපෙක්ෂා කෙරේ. එසේම නේවාසික ජනයාටම මෙන්ම සංචාරක ජනතාවට අවශ්‍ය වාණිජ අනෙකුත් සාමාජීය ආර්ථික අපරව්‍යුහ පහසුකම් නගර මධ්‍ය කේන්ද්‍ර කර ගනිමින් සැපයීමටත් හාවාඑළිය, බඹරකැලේ, මීපිලිමාන, කටුමාන ආශ්‍රිත මිශ්‍ර නේවාසික භාවිතය වැඩි කිරීමටත් නුවරඑළිය ආවේනික උඩරට කෘෂිකාර්මික භාවිතය එලෙසම පවත්වා ගැනීමටටත් එමගින් සිදුවන පාරිසරික හානිය අවම කිරීමත් සමබර සංවර්ධනයකින් යුක්ත පාරිසරික උද්‍යානයක් ලෙස පවත්වා ගැනීමටත් මෙම සංකල්පය අතර වේ.

6.1.විසල් නුවරඑළිය සංකල්පීය සැලැස්ම

6.1.විසල් නුවරඑළිය සංකල්පීය සැලැස්ම



6.2.යෝජිත භූමි පරිහරණ සැලැස්ම

නුවරඑළිය නගරය හා ඒ අවට කලාපයන්හි භූගෝලීය පිහිටීමත් පාරිසරික සංවේදිතාවයත් මෙන්ම ආකර්ෂණීය හා අද්විතීය පාරිසරික ලක්ෂණයන්ගෙන් සමන්විත වීමත් නිසාම සංචාරක ආකර්ෂණයට බෙහෙවින් පාත්‍රවී ඇත. එසේම මෙම දේශගුණික ලක්ෂණ නිසාම උඩරට එළවළු වගාවත්, තේ වගාවත් ප්‍රදේශයේ ඇති ප්‍රධාන සම්පත් වේ. මේ අනුව නුවරඑළිය ප්‍රදේශයේ ආර්ථිකය, සංචාරක, උඩරට එළවළු හා තේ වගාව ප්‍රධාන කර ගනිමින් ගොඩනැගී ඇති අතර පාරිසරික සමබරතාව මෙම අංශය කෙරෙහි මනාව බලපානු ලැබේ.

ඒ අනුව "මිහිඳුම් කඳුකරයේ පාරාදීසය" ලෙස දැක්මක් සහිතව සමබර තිරසාර පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් ඉදිරි ඉලක්ක ජය ගැනීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව යමින් පරිසර සංවේදි වනාන්තර පද්ධති, ජල මූලාශ්‍ර හා සබැඳි අනෙකුත් ස්ථාන ආරක්ෂා වන ආකාරයටත් සංචාරකයින් හට උපරිම පහසුකම් සැපයීම සඳහා වැඩි සංචාරක ආකර්ෂණ ප්‍රදේශ හඳුනාගැනීම හා ඔවුන්ගේ විනෝදාත්මක පහසුකම් සඳහා ප්‍රදේශ විශේෂ කොට ගෙන සංවර්ධන උපාය මාර්ග හා ව්‍යාපෘතින් හඳුනාගෙන ඇත. එසේම පදිංචි හා නේවාසික ජනතාවගේ පහසුකම් වැඩිදියුණු කරමින් සංචාරක කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ගෙන් ඔවුනට ලැබෙන ආදායම් වැඩිකිරීම තුළින් ආර්ථික වර්ධනයක් ඇති කිරීමත් සඳහා ඉදිරි භූමි පරිහරණ රටාව හඳුනාගෙන ඇත. ඒ සඳහා කලාපකරණය, උපාය මාර්ග හා ව්‍යාපෘතින් මෙන්ම රෙගුලාසි ද හඳුන්වා දෙනු ලැබේ.

සිතියම් අංක 6.9: යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම



යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම **විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම**	නාගරික සංවර්ධන අධිකාරිය නුවර එළිය කාර්යාලය සැප්තැම්බර් 2017

නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032) *සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං.. අ*

*රූප සටහන **6.0.2:** තුරඟ තරග පිටියේ සිට හරස්කඩ*





6.3 ආර්ථික සංවර්ධන උපාය මාර්ග

6.3.1. හැඳින්වීම

සංචාරක කර්මාන්තය, උඩරට එළවළු වගාව සහ තේ වගාව විසල් නුවරඑළිය සංවර්ධන ප්‍රදේශය තුළ ප්‍රධාන ආදායම් උත්පාදන ආර්ථික ක්‍රියාකාරකම් වේ. මෙම එක් එක් ආර්ථික අංශයේ සංවර්ධනය සඳහා යෝජිත උපාය මාර්ග මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

සංචාරක කර්මාන්තය වඩාත්ම වැදගත් ආර්ථික ක්‍රියාකාරකම වන අතර අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් ද ප්‍රදේශයේ සංචාරක ක්‍රියාකාරකම් සමඟ සැලකිය යුතු අන්තර් සම්බන්ධයක් ඇති බැවින්, ආර්ථික උපායමාර්ගය වැඩි වශයෙන් සංචාරක සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරයි. අනෙකුත් ආර්ථික අංශවල දියුණුව ද පරිච්ඡේදයේ අවසාන කොටසේ සාකච්ඡා කෙරේ.

6.3.2 නුවරඑළිය ප්‍රදේශය තුල සංචාරක ව්‍යාපාරයේ සහ අනෙකුත් ආර්ථික කටයුතුවල වර්තමාන තත්ත්වය

සංචාරක කර්මාන්තය දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් සමන්විත වීම කැපී පෙනෙන ලක්ෂණයකි. වාර්ෂිකව විදේශීය සංචාරකයින් 147,470 ක් සහ දේශීය සංචාරකයින් 1,400,000 ක් නුවරඑළියට පැමිණේ. ශ්‍රී ලංකාවට පැමිණි මුළු විදේශීය සංචාරකයින්ගෙන් 6%ක් විදේශ සංචාරකයින් පැමිණ ඇත්තේ නුවරඑළියටය.

විදේශ සංචාරකයින් නුවරඑළියට පැමිණීමෙන් රුපියල් මිලියන 6300ක ආදායමක් ලබන අතර . එය සමස්ත සංචාරක කර්මාන්තයේ ආදායමෙන් 1%කි. වාර්ෂිකව නුවරඑළිය නගරයට පැමිණෙන දේශීය සංචාරකයන්ගෙන් රුපියල් මිලියන 5500 ක ආදායමක් නුවරඑළිය ප්‍රදේශයට අවශෝෂණය වේ.

සංචාරක ව්‍යාපාරය පදනම් කරගත් හෝටල් සහ ආගන්තුක නිවාස 180ක් නුවරඑළිය ප්‍රදේශය තුළ පවතින අතර එම නවාතැන් පහසුකම්වල කාමර 1500ක් ඇත. ඍජු හා වක්‍ර සේවක සංඛ්‍යාවක් මෙම අංශයේ නියැලී සිටි. ඒ අතරින් ප්‍රධාන වශයෙන් සංචාරක මාර්ගෝපදේශකයින්, කර්මාන්තයට අදාළ විනෝදාස්වාද සේවා සපයන්නන් මෙම අංශයේ ජනනය කරන ලද රැකියා තුල දක්නට ලැබේ. මෙම රැකියා උත්පාදන අංශයේ ප්‍රධාන වශයෙන්ම නුවරඑළිය ප්‍රදේශයේ නියැලී සිටින සමස්ත සේවක සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විනෝදාස්වාද සේවා, සංචාරක මාර්ගෝපදේශකයන් ලෙස හඳුනා ගත හැක.

2030 වර්ෂයේදී මෙම සංවර්ධන සැලැස්ම මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධානතම ඉලක්කයක් වන්නේ විදේශීය සංචාරකයින් 10% දක්වා එනම් 65,000ක් දක්වාත් දේශීය සංචාරකයින් මිලියන 4 දක්වාත් මෙම නගරයේ රැඳී සිටින රාත්‍රි සංඛ්‍යාවද ඉහළ නැංවීමයි. මෙම සංවර්ධන සැලැස්ම මගින් රාත්‍රී 2 සිට රාත්‍රී 4 දක්වා එකී රැඳී සිටින කාලය වර්ධනය කරගැනීමට අපේක්ෂිතය.
දිනකට එළවළු ප්‍රවාහනය ටොන් 125ත් 150ත් අතර ප්‍රමාණයක් නගරයේ සිට අනෙකුත් ප්‍රදේශවලට ප්‍රවාහනය කෙරේ. විසල් නුවරඑළිය සංවර්ධන බල ප්‍රදේශය තුළ ඉඩම් හෙක්ටයාර් 897ක එළවළු වගාව සිදු කෙරේ.මෙම එළවළු වගාවෙන් උපයා ඇති ආදායම රුපියල් මිලියන 4200ක් පමණ වේ. එමෙන්ම මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන හරහා රුපියල් මිලියන 5000ක ආදායමක් විදේශ රටවලට ගලා යන අතර උඩරට එළවළු ඉපැයීමේ සමස්ත එළවළු ආදායමට සාපේක්ෂව මෙම මුදල වටිනාකමින් 23% කි.

එමෙන්ම තේ වගාව ශ්‍රී ලංකා ආර්ථිකයට යම් ප්‍රමාණයකට දායක වන අතර එය සංචාරක කර්මාන්තයේ දියුණුවට ද උපකාරී වේ. විසල් නුවරඑළිය සංවර්ධන සැලසුම් ප්‍රදේශයේ වගා කරන ලද තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1332 ක් පමණ වන අතර එය දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 23% කි. වතු කම්කරුවන් 2550ක් ප්‍රදේශය තුළ මෙම තේ වගාවේ නිරතව සිටිති. ප්‍රදේශය තුළ තේ වගාවෙන් වාර්ෂිකව මිලියන 250 ක ආදායමක් උපයන අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත තේ වගා ආදායමෙන් 0.01% කි

ඊට අමතරව පශු සම්පත් කළමනාකරණය සහ මල් වගාව ප්‍රදේශය තුළ ආදායම් උපදවන අංශ වේ. වාර්තා වන පරිදි පශු සම්පත් ගොවීන් 54 දෙනෙකු ප්‍රදේශයේ සිටින අතර ඔවුන්ගේ වාර්ෂික ආදායම රුපියල් මිලියන 65ක් පමණ වේ. ආවේණික මල් වගා කරන්නන් 270ක් සිටින බව වාර්තා වන අතර ප්‍රදේශයේ සියලුම ගෙවතුවල සාමාන්‍යයෙන් මල් සිටුවා ඇත. මල් වගාවෙන් වාර්ෂිකව උපයන ආදායම ප්‍රදේශය තුළ රුපියල් මිලියන 6ක් පමණ වන අතර ප්‍රදේශය තුළ මල් වගා කරන ප්‍රධාන ක්ෂේත්‍ර වන්නේ ශාන්තිපුර, ලවර්ස් ලීප් , මීපිලිමාන සහ බොරලන්ද යන ප්‍රදේශයන්ය.

මේ වන විට නුවරඑළිය ප්‍රදේශයේ ප්‍රමුඛ ආදායම් උපයන අංශයක් ලෙස සංචාරක ක්ෂේත්‍රය හඳුනා ගෙන ඇති බැවින් විසල් නුවරඑළිය සංවර්ධන ප්‍රදේශය තුලද එකී ප්‍රමුඛතාවය සාකච්ඡා කර ඇත. ඊට අදාළ උපාය මාර්ග තුළ සංවර්ධන සැලසුම් ක්ෂේත්‍රයේ අපේක්ෂිත "යහපත් ආර්ථිකය" සාක්ෂාත් කර ගැනීමේ ඉලක්ක වේ. එමෙන්ම ඉහළ සංචාරක ආකර්ෂණයක් තුළින් ශ්‍රී ලංකාවට පැමිණෙන සංක්‍රමණික සංචාරකයින්ගෙන් 10% ක් දක්වා සංචාරක පැමිණීම් සහ රාත්‍රී 4 දක්වා රාත්‍රී නවාතැන් ගැනීමට අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම උපාය මාර්ග ඔස්සේ නුවරඑළිය නගරයේ ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රය වන සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීමට අපේක්ෂා කරන අතර, 2030 වර්ෂයේ දී අපේක්ෂිත දෛනික සංචාරක පැමිණීම් 25,000 ක් වන අතර එහි ඉහළම ඉලක්කය සංචාරකයින් 50,000 ක් පමණ වනු ඇත. එය සංචාරක අංශයේ සංවර්ධනයේ සහ "යහපත් ආර්ථිකයක්" සඳහා ඉලක්ක සපුරා ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. එසේම, මුළු ශ්‍රී ලංකා විදේශ සංචාරක පැමිණීම්වලින් 12%ක් දක්වා නුවරඑළිය විදේශ සංචාරකයින් පැමිණීමත්, නවාතැන් ගන්නා සංචාරකයින්ගේ රාත්‍රී 4 දක්වා වර්ධනයටත් අපේක්ෂා කෙරේ.

6.3.3) සංචාරක සංවර්ධනය

යෝජිත සංචාරක සංවර්ධන උපාය මාර්ග, සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ග සහ සංචාරක පහසුකම් සැලසීමේ උපාය මාර්ග ලෙස කොටස් දෙකකට වර්ග කළ හැකිය.

1. සංචාරක නිෂ්පාදන සංවර්ධන උපාය මාර්ග

නුවරඑළිය සංවර්ධන සැලසුම් ප්‍රදේශය හා නුවරඑළිය මධ්‍යම සංචාරක ප්‍රදේශය සඳහා යෝජිත සංචාරක නිෂ්පාදන සංවර්ධන උපාය මාර්ග පහත අංශ ආවරණය කරනු ලබයි.

- ග්‍රෙගරි වැව, වික්ටෝරියා උද්‍යානය, තුරඟ පිටිය සහ ඒ අවට ප්‍රදේශය පදනම් කරගත් විනෝදාත්මක සංචාරක සංවර්ධනය
- නගර කේන්ද්‍ර කරගත් මල් සංචාරක ව්‍යාපාරය සහ නගර අලංකරණ වැඩසටහන
- නගරයේ අද්විතීය බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පය සංරක්ෂණය කිරීම
- නුවරඑළිය නගර මධ්‍යයේ සහ ඒ අවට පිහිටි සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- නුවරඑළිය නගර මධ්‍යයේ සහ ඒ අවට සංචාරක මංපෙත් ප්‍රවර්ධනය කිරීම.

- එළවළු, පළතුරු, මල්, දිනපොත සහ තේ ඇතුළු නුවරඑළියේ සුවිශේෂී සංචාරක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
- සංවර්ධන සැලසුම් ප්‍රදේශයෙන් පිටත පිහිටි සංචාරක ආකර්ෂණ ස්ථාන සඳහා පහසුකම් සැලසීම

I. ග්‍රෙගරි වැව, වික්ටෝරියා උද්‍යානය, තුරඟ පිටිය සහ ඒ අවට ප්‍රදේශය පදනම් කරගත් විනෝදාත්මක සංචාරක සංවර්ධන

ග්‍රෙගරි වැව සහ ඒ අවට ප්‍රදේශය පදනම් කරගෙන යෝජිත විනෝදාත්මක සංචාරක ව්‍යාපෘති සහ වැඩසටහන් පහත වගුවේ දක්වා ඇත.

*වගු අංක **5.1 :** විනෝදාත්මක සංචාරක ව්‍යාපෘති*

අංකය	ව්‍යාපෘතියේ නම
01	ග්‍රෙගරි වැවේ ඉහළ කොටසේ තේමා උද්‍යානයක් ඉදිකිරීම
02	ධාවන පථයේ ජාත්‍යන්තර ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම
03	බැරක්ප්ලේන් ජලාශයේ විනෝදාස්වාද කලාපයක් ඉදිකිරීම
04	ඉහළ ග්‍රෙගරි වැව ප්‍රදේශයේ යතුරුපැදි සහ මෝටර් රථ ධාවන පථ සංවර්ධනය කිරීම
05	නුවරඑළිය ග්‍රෙගරි වැවේ පොදු භූමිය වැඩිදියුණු කිරීම
06	නානුඔය දුම්රිය ස්ථානය නුවරඑළිය නගර මධ්‍යයේ සම්බන්ධ කරන කේබල් කාර් ව්‍යාපෘතිය
07	පදිකයින් ඇවිදින මාර්ග සහ බයිසිකල් පැදීම සඳහා නානුඔය ඇළ දිගේ හරිත තීරයක් සංවර්ධනය කිරීම.
08	නගරය අවට වනාන්තර මායිම් ඔස්සේ අඩි පාරවල් සහ පාපැදි මාර්ග සංවර්ධනය කරන්න.

ඒ අනුව සංචාරක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම තුළින් ග්‍රෙගරි වැව අවට පරිසර කලාපයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ. ඉහළ වැව ආශ්‍රිතව තේමා උද්‍යාන ඉදිකිරීම, ග්‍රෙගරි වැව වටා පදික හා පාපැදි මාර්ග සංවර්ධනය, මෝටර් බයිසිකල් සහ මෝටර් රථ සඳහා ධාවන මාර්ග ඉදිකිරීම, සංචාරක පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම, තිරසාර සංවර්ධන පද්ධතියක් ලෙස සංවර්ධනය අපේක්ෂිතය . තිරසාර සංවර්ධන පද්ධතියක් ලෙස නගර මධ්‍යයේ වාණිජ ප්‍රදේශයේ සිට ග්‍රෙගරි විල ආශ්‍රිත විනෝදාස්වාද කලාපය දක්වා සම්බන්ධ වන අඩි පාරවල් සහ බයිසිකල් පැදීමේ මාර්ග ඉදිකිරීම, ග්‍රෙගරි වැව අවට ප්‍රදේශයේ සිටින දේශීය සංචාරකයින්ට බහු ක්‍රියාකාරකම් ව්‍යාපෘති හඳුන්වා දීම තුලින් වැඩි කාලයක් ගත කිරීම සිදු වනු ඇති අතර වසරේ සියලුම මාස 12 තුළ සංචාරක පැමිණීම් ව්‍යාප්ත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සංචාරකයින් සඳහා නව ආකර්ශනීය කලාපයක් බවට පත් කරමින් නුවරඑළිය ප්‍රදේශයට සංචාරක පැමිණීම 12% කින් වැඩි කිරීමේ අරමුණ ඉටු කිරීමට බලාපොරොත්තු වේ. එම කලාපීය ප්‍රදේශ තුළ වඩාත් ආකර්ශනීය මහා මධ්‍යම හා කුඩා පරිමාණ ව්‍යාපෘති සමඟින් නව විනෝදාස්වාද ක්‍රියාකාරකම් හඳුන්වා දෙනු ලැබේ. ඒ

අනුව තුරඟ තරග පිටිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා පිටියක් වන අතර දකුණු ආසියාවේ මලල ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිරි වසර 3 තුළ විවෘත කෙරෙන අතර එය මලල ක්‍රීඩා පුහුණු ක්‍රීඩා කිරීමට මෙම නගරයේ වාසනාවන්ත අවස්ථාවක් වේ. එය නගරයට සංචාරක ආකර්ෂණයේ තවත් ප්‍රවණතාවක් වන අතර එය වාර්ෂිකව සංචාරකයින් 15,000 ක් පමණ වැඩි කරයි. එබැවින් මෙම උපාය මාර්ගයෙන් සංචාරකයින්ගේ පැමිණීම 1% දක්වා ඉහළ යනු ඇත.

තවද නානුඔය දුම්රිය ස්ථානයෙන් ආරම්භ වන සිංගල් ට්‍රී කඳුවැටිය සහ ග්‍රෙගරි වැව කලාපය හරහා ගමන් කරන කේබල් කර ව්‍යාපෘතිය සංචාරක ආකර්ෂණය සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

.

II. නගර කේන්ද්‍ර කරගත් මල් ආශ්‍රිත සංචාරක හා නගර අලංකරණ වැඩසටහන

මෙම උපායමාර්ග තුල ව්‍යාපෘතිමය දායකත්වය මෙන්ම නියාමන දායකත්වය යන ආකාර වලින් සමන්විත වේ. නුවරඑළිය යනු මල් සඳහා ප්‍රසිද්ධියක් උසුලන අතර ඍතුමය වශයෙන් මෙන්ම වසර පුරා විවිධ මල් වර්ග පිපෙන කලාපයක් ලෙස ප්‍රසිද්ධ වේ. ප්‍රදේශයට ආවේණික වූ ශීත දේශගුණය සහ නිරන්තර වර්ෂාපතන රටාව විවිධ මල් පැල සඳහා හිතකර කොන්දේසි සපයයි. කෙසේ වෙතත් මෑතක සිට නුවරඑළිය මල් වෙළෙඳ පොළ විවිධ හේතූන් මත සුළු පසුබෑමකට ලක් වූ අතර ලෝකයේ ඉහළම මල් ගමනාන්තයක් වීමට නුවරඑළියට හැකියාව තිබුණද එහි විභවය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොමැති බව පෙනේ.

එබැවින් නුවරඑළියේ මල් සංස්කෘතිය නැවත ප්‍රවර්ධනය කිරීම සඳහා නුවරඑළිය නගර මධ්‍ය කලාපය තුළ පහත ව්‍යාපෘති සහ නියාමන මාර්ගෝපදේශ යෝජනා කෙරේ.

වගු අංක 6. 2: ව්‍යාපෘති දායකත්වය

අංකය	ව්‍යාපෘතියේ නම
01	නුවරඑළිය නගර මධ්‍යයේ සහ ප්‍රධාන මාර්ග ආසන්නයේ මල් ආශ්‍රිත ව භූමි අලංකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම..
02	වික්ටෝරියා උද්‍යානය තුළ මල් වෙළෙඳපොළක් සහ මල් ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය ඉඩකඩ වෙන් කිරීම.
03	නුවරඑළිය ප්‍රදේශයේ අද්විතීය වාස්තු විද්‍යාත්මක හා සංස්කෘතික ලක්ෂණ මෙන්ම මල් සැකසුම් ග්‍රහණය කර ගනිමින් ප්‍රදේශය සඳහා සුවිශේෂී සංඥා පද්ධතියක් හඳුන්වා දීම.
04	දකුණු ආසියාවේ විශාලතම මල් ප්‍රදර්ශනය හඳුන්වාදීම - විලාසිතා සංදර්ශන සහ අශ්වාරෝහක සංදර්ශන වැනි අනුපූරක සිදුවීම් සමඟ ඒකාබද්ධ වූ නගර මධ්‍යයේ වසන්ත හා වාර්ෂික මල් සංදර්ශන, පෙළපාළි සහ උත්සව ආදිය වික්ටෝරියා උද්‍යානය සමඟ ඒකාබද්ධව පැවැත්වීම
05	නුවරඑළිය නගර මධ්‍යයෙහි හෝටල් සහ බංගලා සමග එක්ව "ඉංග්‍රීසි උද්‍යාන" යන සංකල්පය මත ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

වගු අංක 6.3: නියාමන ක්‍රියාමාර්ග

අංකය	ව්‍යාපෘතියේ නම
01	ගොඩනැගිලි සීමාව තුල මල් සහිත භූ දර්ශන නඩත්තු කිරීම සඳහා නියාමන මාර්ගෝපදේශ හඳුන්වා දීම සහ මල් ආශ්‍රිතව යෝජිත විවිධ තේමා අනුව සුදුසු මල් පැල සහිතව ගොඩනැගිලි මුහුණත නඩත්තු කිරීම.
02	ගොඩනැගිලි මුහුණත සඳහා සුදුසු වර්ණ තේමාවන් හඳුන්වා දීම.

III.නගරයේ අද්විතීය බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පය සංරක්ෂණය කිරීම

නුවරඑළිය බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක බලපෑම පිළිබිඹු කරන අද්විතීය වාස්තු විද්‍යාත්මක චරිතයකට උරුමකම් කියයි. බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සිහිපත් කරන දැනට පවතින ගොඩනැගිලි සහ නගර ලක්ෂණ ගණනාවක් තිබේ. නුවරඑළිය 'පුංචි එංගලන්තය' ලෙස හැඳින්වීමට ප්‍රධාන හේතු දෙකෙන් එකක් වන්නේ එහි ශීත දේශගුණය සහ ස්වභාවික කඳුකර ස්වභාවය සමඟ මුසු වූ මෙම අද්විතීය බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ස්වභාවයයි.

ඒ අනුව නුවරඑළිය නගර මධ්‍යයේ මෙම සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ස්වභාවය ආරක්ෂා කර ගැනීම සඳහා පහත ව්‍යාපෘති මැදිහත්වීම් සහ නියාමන මාර්ගෝපදේශ යෝජනා කෙරේ.

ව්‍යාපෘති මැදිහත්වීම්

වගු අංක 6. 4: නගරයේ අද්විතීය බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පය සංරක්ෂණය - ව්‍යාපෘති මැදිහත්වීම

අංකය	ව්‍යාපෘතියේ නම
01	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ අදාළ ප්‍රවීණයන්ගේ උපදෙස් මත අද්විතීය බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත පුරාවිද්‍යාත්මකව ප්‍රකාශිත ගොඩනැගිලි සහ ගොඩනැගිලි කෙරෙහි අවධානය යොමු කරමින් සංරක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
02	අද්විතීය බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පය විදහා දක්වන විදුලි පහන් කණු, සංකේත සහ ස්මාරක සහ බංකු වැනි මාර්ග අද්දර නගර අලංකරණ අංග හඳුන්වා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. - ජනාධිපති මැදුර සිට හැටන් පාර ඔස්සේ - ග්‍රෙගරි වැව දක්වා - ග්‍රෑන්ඩ් හෝටල් පාර - පාර්ක් පාර - වෙඩබන් පාර
03	ශ්‍රී ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පය සමඟ මුසු වූ අද්විතීය බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරමින් නුවරඑළිය නගර මධ්‍යයේ පොදු චතුරශ්‍ර හා වීදි සැලසුම් කිරීම. - ජනාධිපති බංගලාව හංදිය - අරලිය හෝටලයේ හංදිය - ලංකා බැංකුවට ආසන්නව නගර මධ්‍ය හංදිය - බස් නැවතුම්පළට ආසන්න හංදිය – - ජනාධිපති මැදුර ආශ්‍රිත හංදිය සිට අරලිය හෝටලයේ හංදිය දක්වා වීදි තීරුව

නියාමන ක්‍රියාමාර්ග

වගු අංක 6.5: බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශ සහ මාර්ග මංතීරුවල ගොඩනැගිලි මුහුණත නියාමනය කිරීම

අංකය	ව්‍යාපෘතියේ නම
01	බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශ සහ මාර්ග මංතීරුවල ගොඩනැගිලි මුහුණත නියාමනය කිරීම

III.නුවරඑළිය නගර මධ්‍යයේ සහ ඒ අවට පිහිටි සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

නුවරඑළිය නගර මධ්‍යයේ සහ ආසන්න වටපිටාවේ ආකර්ශනීය ස්ථාන ගණනාවක් ඇත. මෙම ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙම අනු උපාය මාර්ගය යටතේ සාකච්ඡා කෙරේ.

වගු අංක 6.6: සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය හා ප්‍රවර්ධනය

අංකය	ව්‍යාපෘතියේ නම
01	සිංගල් ට්‍රී කඳුවැටියේ අදාළ පහසුකම් සහිත නිරීක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සහ තේ ප්‍රවර්ධන කුටියක් සංවර්ධනය කිරීම. (මෙය කේබල් කාර් ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරේ)
02	ශාන්තිපුර ප්‍රදේශයේ අදාළ පහසුකම් සහිත නිරීක්ෂණ මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම, තේ ප්‍රවර්ධන කුටියක් සංවර්ධනය කිරීම මෙන්ම ප්‍රවේශ මාර්ගය ඔස්සේ භූමි අලංකරණය වැඩිදියුණු කිරීම.
03	ගැල්වේස් වනාන්තරය තුළ ස්වභාවික මංපෙතක් ප්‍රවර්ධනය කිරීම සහ ගැල්වේස් වනාන්තරය තුළ අවම බාධාකාරී ස්ථානයක විශේෂිත පරිසර හිතකාමී කඳවුරු භූමියක් තිබීම.
04	ගැල්වේස් වනාන්තරයේ සංවර්ධනයට සමගාමීව ඕක්ලි කොටේජ් සංවර්ධනය කිරීම
05	වික්ටෝරියා උද්‍යානයේ ඉටි කෞතුකාගාරයක් සංවර්ධනය කිරීම
07	සාමාන්‍ය ජනතාව සඳහා ගොල්ෆ් පිටියේ කොටසක් විවෘත කර ගොල්ෆ් පුහුණු වැඩසටහන් හා ඒ ආශ්‍රිත ජනතාව සම්බන්ධ කරගනිමින් වාණිජ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
08	ලවර්ස් ලීප් දියඇල්ල ආශ්‍රිතව පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය
09	කිකිලියාමාන සහ ලවර්ස් ලීප් කඳු ආශ්‍රිතව කඳු නැගීම සහ කඳවුරු බැඳීම ප්‍රවර්ධනය කිරීම.
09	ඔක්ලේ කොටේජ් හි දේශීය වෛද්‍ය ආයුර්වේද ස්පා සහ පාරිසරික සංචාරක මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම
10	නුවරඑළිය නගර මධ්‍යයේ හඳුනාගත් මාර්ගවල පදික වේදිකා සහ පාපැදි මාර්ග සංවර්ධනය.
15	නුවරඑළිය - උඩ පුස්සැල්ලාව මාර්ගය ආසන්නයේ පිහිටා ඇති පැරණි නුවරඑළිය දුම්රිය ස්ථානය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.
16	නුවරඑළියේ සුදුසු ස්ථානවල කැරවැන් ස්ථාන ප්‍රවර්ධනය කිරීම.

IV.තේ, එළවළු සහ පලතුරු ඇතුළු නුවරඑළියේ අද්විතීය සංචාරක නිෂ්පාදන සඳහා වෙළඳපල අවකාශයන් සංවර්ධනය කිරීම.

වගු අංක 6.7: අද්විතීය සංචාරක නිෂ්පාදන සඳහා වෙළඳපල අවකාශයන් සංවර්ධනය කිරීම

අංකය	ව්‍යාපෘතියේ නම
01	දැනට පවතින තේ ආශ්‍රිත කුටි සඳහා පහසුකම් සැලසීම, ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රධාන සංචාරක ආකර්ෂණ ස්ථාන, යෝජිත පොදු චතුරශ්‍ර/ පොදු වීදිවල තේ නිෂ්පාදන වෙළඳකුටි සංවර්ධනය කිරීම.
02	නගර මධ්‍යයේ පවතින එළවලු සහ පළතුරු වෙළෙඳපොල වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම

2. සංචාරක පහසුකම් සැලසීමේ උපාය මාර්ග

මෙම විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම හරහා නගරයේ ආර්ථිකයේ ප්‍රධාන පදනම ලෙස සංචාරක කර්මාන්තය හඳුනාගෙන ඇති අතර, සංවර්ධන ආශ්‍රිත යටිතල පහසුකම්වලට අදාළ අනෙකුත් සේවාවන් ද සංචාරක කර්මාන්තයේ දියුණුවට සෘජුව සහ වක්‍රව දායක වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව මාර්ග වැසි ජල අපවහන හා මලාපවහන පද්ධතිය සඳහා හඳුනාගත් යටිතල පහසුකම් උපාය මාර්ග ද සංචාරක කර්මාන්තයේ දියුණුවට සෘජුවම දායක වේ. විශේෂයෙන්ම පානීය ජලයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම තුළින් අවසානයේ එය සපයනු ලබන පානීය ජලය පිළිබඳ සංචාරකයින්ගේ විශ්වාසයේ වෙනසක් වනු ඇති අතර එය සංචාරකයින්ට හොඳ සේවා සැපයීමට සහ ප්‍රදේශයට පැමිණීම වැඩි කිරීමට හේතුවක් වන බව නොඅනුමානය

මධ්‍යගත මලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම තුළින් පරිසරය සුරැකීමට හේතුවක් වන අතර එමඟින් ජල පද්ධතිය දූෂණය වීම වැළකෙයි. එය නැවතත් සංචාරකයින්ගේ කර්මාන්ත ප්‍රගතියට සහ වක්‍ර ආකාරයෙන් ආර්ථික සංවර්ධනයට හේතුවක් වනු ඇත. සංචාරක ව්‍යාපාරය ඉලක්ක කර ගනිමින් ප්‍රමුඛත්වය දෙන කාර්යයන් සඳහා කලාප නියාමනය හරහා අධි ඝනත්ව සංචාරක කලාපයක් නිර්මාණය කිරීම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගතියක් වනු ඇත.

භූ දර්ශන උපාය මාර්ග සංවර්ධනය තුළින් දර්ශනීය සුන්දරත්වය වැඩි වන අතර එය සංචාරක ආකර්ෂණය තවදුරටත් ඉහළ නංවනු ඇත. පරිසරය සුරැකීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම හරහා සංවර්ධන උපාය මාර්ග සහ රෙගුලාසි හඳුන්වා දෙන ලදී. එම උපාය මාර්ග ආර්ථික සංවර්ධනයට වක්‍ර ලෙස බලපායි.

සංචාරක ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීම කෙරෙහි අවධානය යොමු කරන සංචාරක පහසුකම් සැලසීමේ උපාය මාර්ග සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ග මෙන් ම වැදගත් වේ. එබැවින්, මෙහි පොදු සංචාරක පහසුකම්, විවිධ ආකර්ෂණ ස්ථාන වෙත සහ ඒ අතර ප්‍රවේශ්‍යතා වැඩිදියුණු කිරීම, සංචාරක නවාතැන් පහසුකම් සංවර්ධනය සහ සංචාරක නවාතැන් පහසුකම් සහ අනෙකුත් සේවාවන් ප්‍රමිතිගත කිරීම වැනි විවිධ පහසුකම් සැලසීමේ ක්‍රම පිළිබඳව විස්තර කරයි.

I. පොදු සංචාරක පහසුකම් සංවර්ධනය

වාර්ෂිකව විදේශීය සංචාරකයින් 147,470 ක් සහ දේශීය සංචාරකයින් 1,400,000 ක් නුවරඑළියට පැමිණෙන බවට වාර්තා වේ. . විශේෂයෙන්ම මෙකි වසන්ත තුළ මෙම විශාල සංචාරකයින් සංඛ්‍යාවෙන් ඇති වන ඉල්ලුම සපුරාලීමට දැනට පවතින සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවේ. එබැවින් පහත දැක්වෙන පොදු සංචාරක පහසුකම් සංවර්ධන ව්‍යාපෘති යෝජනා කෙරේ.

*වගු අංක **6.5:** පොදු සංචාරක පහසුකම් සංවර්ධනය*

අංකය	ව්‍යාපෘතියේ නම
01	ග්‍රෙගරි වැව ආසන්නයේ ප්‍රධාන සංචාරක පහසුකම් මධ්‍යස්ථානය සහ තොරතුරු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.
02	සංචාරක ආකර්ෂණ ස්ථානවලට සුදුසු පරිදි පානීය ජල පහසුකම්, වැසිකිළි හා ආසන වැනි මූලික සංචාරක පහසුකම් සැපයීම.
03	නුවරඑළිය නගර මධ්‍යයේ තෝරාගත් ඉහළ සංචාරක ආකර්ශනීය ස්ථානවල සහ අනෙකුත් ආකර්ශනීය ස්ථානවල තොරතුරු පුවරු සවි කිරීම.

II.ප්‍රවේශ්‍යතා වැඩිදියුණු කිරීම

සංචාරක ආකර්ෂණ ස්ථානහි ආකර්ෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ප්‍රධාන වශයෙන් බලපානු ලබන සාධකයක් වේ. එබැවින් විවිධ ප්‍රවාහන ක්‍රම හරහා ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කිරීම වැදගත් වේ. සංචාරක ව්‍යාපෘතිවල ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා පහත ව්‍යාපෘති යෝජනා කර ඇත.

*වගු අංක **6.12:** ප්‍රවේශ්‍යතා වැඩිදියුණු කිරීම*

අංකය	ව්‍යාපෘතියේ නම
01	විද්‍යුත් කාර්, විද්‍යුත් බයිසිකල්, පා පැදි , විදුලි වාහක ආදී විවිධ වාහන ඇතුළුව පරිසර හිතකාමී වාහන කුලි පදනම මත සංචාරක කටයුතු සඳහා ලබා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම.

III.සංචාරක නවාතැන් පහසුකම් සහ අනෙකුත් සේවාවන් ප්‍රමිතිගත කිරීම

සංචාරක ගමනාන්තයක ආකර්ශනීය මට්ටම පවත්වා ගැනීමට සහ වැඩි වශයෙන් නැවත නැවතත් සංචාරකයින් ඇති කර ගැනීමට සංචාරක සේවාවන්හි ප්‍රමිතීන් පවත්වා ගැනීම වැදගත් වේ. ජාත්‍යන්තර සහ ජාතික ප්‍රමිතීන්ට අනුකූල වීම තුලින් සංචාරකයින් සඳහා ගමනාන්තය වඩාත් සහතික සහ විශ්වාසදායක බවක් ඇති කරනු ඇත . ඒ අනුව නුවරඑළියේ සංචාරක සේවා ප්‍රමිතිගත කිරීමට පහත ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

*වගු අංක **6.13:** සංචාරක නවාතැන් පහසුකම් සහ අනෙකුත් සේවාවන් ප්‍රමිතිගත කිරීම*

අංකය	ව්‍යාපෘතියේ නම
01	නුවරඑළියේ සියලුම වර්ගයන්හි සංචාරක සේවා සපයන්නන් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ඇති කර ගැනීම සහ නුවරඑළිය පිළිබඳ සියලුම සංචාරක තොරතුරු ඇතුළත් විවෘත වෙබ් ද්වාරයක් පවත්වාගෙන යාම මෙන්ම සංචාරක සේවා මාර්ගගතව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
02	සංචාරක නවාතැන් පහසුකම් මෙන්ම විශේෂයෙන්ම නිවාස කුලියට දීම සඳහා වන අනෙකුත් සේවාවන් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ප්‍රමිතීන් දැඩි ලෙස බලාත්මක කිරීම
03	මාර්ගගත වෙබ් ද්වාරය හරහා සංචාරකයන ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
04	හෝටල් සංගම් සහ අනෙකුත් සේවා සපයන්නන්ගේ සංගම් සමඟ සම්බන්ධිත සංචාරක සේවා සපයන්නන්ගේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6.3.2. උඩරට එළවළු වගාව තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීම

මෙම සංවර්ධන සැලැස්මෙන් දැනට පවතින තත්ත්වය අනුව උඩරට එළවළු වගාව අඛණ්ඩව පවත්වා ගෙන ගොස් නුවරඑළිය නගරයේ ආර්ථිකයට ඉහළ ආදායමක් උපයා ගැනීම සඳහා එය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. නුවරඑළිය නගරයේ සිට දිනකට උඩරට එළවළු ප්‍රමාණය ටොන් 100 - 150 අතර ප්‍රමාණයක් දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලට ප්‍රවාහනය කෙරේ. කෙසේ වෙතත්, ගොවීන් පිරිසිදු කිරීමකින් හෝ නිසි ඇසුරුම් කිරීමකින් තොරව සෘජුවම එළවළු වගා බිම්වලින් එළවළු ප්‍රවාහනය සිදු කරයි. එහෙයින් එළවළු ප්‍රවාහනය සඳහා පිරිසිදු කිරීමේ සහ ඇසුරුම් කිරීමේ සේවාවක් බවට පත් කිරීමේ උපාය මාර්ගයක් මෙම සංවර්ධන සැලැස්මේ හඳුන්වා දී ඇත.

ඒ සඳහා නගරයේ එළවළු සැපයුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජනා කරණ ලද අතර . කලාපකරණ සැලැස්මට අනුව දැනට ඉහළ ප්‍රදේශවල එළවළු වගා කරන සහ එළවළු වගා කලාප ලෙස නම් කර ඇති සඳතැන්නේ, ශාන්තිපුර, මීපිලිමාන යන ප්‍රදේශවල ජන ඝනත්වය සීමා කිරීමට අපේක්ෂා කෙරේ. ඒ හරහා තවදුරටත් බිම් ආවරණය අවම කිරීම සහ එම ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම් සහ ඉඩම් අනු කොටස් අඩු කිරීම අපේක්ෂා කෙරේ. උඩරට එළවළු වගාව දැනට පවතින ආකාරයටම පවත්වා ගෙන යාමටත් නුවරඑළියට ආවේණික උඩරට එළවළු වගාව සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ කිරීමටත් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා නියාමනය කිරීමටත් අපේක්ෂා කෙරේ. සැලසුම් සකස් කරමින් මෙම කලාප තුළ කෘෂි සංචාරක ව්‍යාපෘති සඳහා ඉඩ ලබාදීම අවශ්‍යවේ.

ගොවීන් කාබන් එළවලු වගාවට නැඹුරු කිරීමේ අරමුණින් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව කාබන් සහිත එළවලු වගාවට අදාල ව්‍යාපෘති වලට ඉඩ ලබාදීමට යෝජිතය. සියලුම කෘෂිකාර්මික කටයුතු සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් යහපත් කෘෂිකරිමික භාවිතයන් ලෙස නිකුත් කරනු ලබන "GPA" සහතිකය ලබා ගැනීම මෙම සැලැස්මේ නිර්දේශ කෙරේ.

මේ හරහා කාබනික පොහොර එළවලු වගාව වගා කිරීමට මෙන්ම ජල මූලාශ්‍රවල අපිරිසිදු බව අවම කිරීම සඳහා අධික පළිබෝධනාශක භාවිතය අවම කිරීමට ගොවීන් පෙළඹෙනු ඇත. එය කාබනික එළවළු වගාව සැපයීමට හේතුවක් වනු ඇත. මෙම ක්‍රමෝපායන් මගින් පරිසර සමතුලිතතාවය සඳහා අවශ්‍ය වන උපාය මාර්ග සපුරාලීමට මෙන්ම විසල් නුවරඑළිය සංවර්ධන ප්‍රදේශයේ ජලාශ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ජලයේ ගුණාත්මක නිර්දේශ ලබාගැනීමේ අවශ්‍යතා සපුරාලීමට හැකිවේ.

6.3.3. වාණිජ සේවා සංවර්ධනය

විශේෂයෙන්ම මෙම සේවාව නගර මධ්‍යයේ වෙසෙන ජනගහනයට මෙන්ම 2030 වසරේ අපේක්ෂිත සංචාරක ජනගහනයට වාණිජ යටිතල පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. පාරිභෝගික පහසුකම් සංවර්ධනය සඳහා නගර මධ්‍ය ප්‍රදේශයේ සිල්ලර වෙළෙඳාම මෙන්ම සමස්ත අලෙවි සංවර්ධනයද සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මධ්‍යම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය, කාගිල්ස් ක්‍රීඩාංගණය ආශ්‍රිත "ඕෂන් විව්" සාප්පු සංකීර්ණය, ශාන්ත ඇන්ඩෘස් සාප්පු සංකීර්ණය, උද්‍යාන මාර්ග සාප්පු සංකීර්ණය සහ විවෘත ආපනශාලා ඉදිකිරීම්, සංචාරකයන් ඉලක්ක කර ගැනීම සඳහා සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම වර්ධනයන් තුළින් නගරයේ මධ්‍යම ප්‍රදේශයේ වාණිජ හා ඒ ආශ්‍රිත කාර්යාල සේවා සඳහා සපයනු ලබන සේවාවන් සඳහා අවස්ථාව ලැබෙනු ඇත.

සිතියම් අංක ***6.10:*** *ආර්ථික සංවර්ධන උපාය මාර්ග*



ආර්ථික සංවර්ධන උපාය මාර්ග
විසල් නුවර එළිය ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය
නුවර එළිය

.64.පාරිසරික තිරසාර භාවය සඳහා වූ උපාය මාර්ග

.64.1.පරිසර සංරක්ෂණ සඳහා වන උපාය මාර්ග

6.4.1.1 හැදින්වීම.

නුවරඑළිය පිහිටි ඉහළ උන්නතාංශ කලාපය ස්වභාවික පරිසර පද්ධතිය වලින් අනූන හා අධි සංවේදී ලක්ෂණයන්ගෙන් හෙබි ප්‍රදේශයකි. 2011 ජාතික භෞතික සැලසුම් අනුවද 2017 නව ජාතික භෞතික සැලසුම් අනුවද නුවරඑළිය කලාපය අධි සංවේදී පරිසර කලාපයක් බවට නම් කර ඇත.

විසල් නුවරඑළිය කලාපය තුල පිහිටි කඳු පන්තින්, ජල මූලාශ ,වනාන්තර පද්ධතින් හා සංචාරක ආකර්ෂණීය ස්වභාවික දර්ශන තල ද සංවේදීතාවය තීව්‍ර කරනු ලැබේ. විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ හෙක්. 59.6ක් එනම් 1.08% ක ප්‍රමාණයක් ජල මූලාශ හා ජලාශ වලින් සමන්විත වේ.

ප්‍රධාන වශයෙන් ග්‍රෙගරි වැව නානුඔය ඇල හා ඒ ආශ්‍රිත අතුරු ඇලවල්, බ්‍රැක්ප්ලෙන් ජලාශය හා ඒ ආශ්‍රිත ජල මාර්ග, ලවර්ස්ලීප් දිය ඇල්ල, ග්ලේන්ඔවර් දිය ඇල්ල ,කටුමාන ජලාශය හා මාගස්තොට වාරි ජලාශය ඒ අතරින් ප්‍රධාන තැනක් ගනි. ග්‍රෙගරි වැව හෙක්. 90 ක ප්‍රමාණයෙන්ද බ්‍රැක්ප්ලෙන් ජලාශය හෙක්. 40 කින් ද සමන්විත වේ.

පාරිසරික සාධක අතර ප්‍රදේශය වටා ඇති කඳු පන්තින්ද වැදගත් කොට සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ උසම කඳු පන්තිය වන පිදුරුතලාගල හා කිකිළිමාන, හග්ගල කඳු පන්තීන්ද ඒ අතර වේ.මෙවා මුහුදු මට්ටමේ සිට මීටර් 2500කට වඩා වූ කඳු මුදුන්වේ.

එසේම සංවර්ධන සැලසුම් කලාපය තුළ වනාන්තර හෙක්. 1782ක් පිහිටා ඇති අතර එය සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් 34.8%ක් වේ. සිංගල්ට්‍රී, හග්ගල, පිදුරුතලාගල හා බොඹුරුඇල්ල වනාත්තර මෙහි ප්‍රධාන තැනක් ගනී. උඩරට කඳුකරයේ ප්‍රධාන ජල මූලාශ වන මෙම ප්‍රදේශය ජල මාර්ග මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගා 2ක් වන කොත්මලා ඔය හා උමා ඔය පෝෂණය කරනු ලබයි.

මෙම ප්‍රදේශය වටා ඇති හෙක්. 1332ක් වූ තේ වගාවද නුවරඑළිය ප්‍රදේශයට දර්ශනීය පෙනුමක් හා සංවේදී පරිසර පද්ධතියක් බිහිකර දීමට තවදුරටත් ඉවහල් වන සාධකයකි. නගරය තුළ පිහිටා ඇති ලවර්ස්ලීප් දිය ඇල්ල හා ග්ලෙන්ඩෝව දිය ඇල්ලද මෙම පරිසර අලංකාරත්වය තීව්‍ර කරයි. නගර මධ්‍යයේ පිහිටා ඇති හේක. 29.42කින් සමන්විත ගැල්වේස් ජාතික වන උද්‍යානයද සංවේදී පරිසර පද්ධතියේ තවත් එක් සන්දිස්ථානයකි. 1938 ගැල්වේස් අභය භූමිය ලෙස 2006 දී ජාතික උද්‍යානයක් බවටත් මෙය පත් කර ඇත. ශ්‍රී ලංකාවට අවේනික කුරුළු වර්ග හා සත්ව වර්ග 20ක පමණ මෙහි දකින්නට ලැබේ.

මීදුම් කඳුකරයේ පාරාදිසය යන දැක්ම යටතේ සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් සියළු දෙනාට තෘප්තිමත් විය හැකි නගරයක් බිහි කිරීමේ දැක්ම යටතේ ප්‍රධාන ඉලක්ක වශයෙන් පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ්‍රයක් ඇති කිරීම හඳුනා ගෙන ඇති අතර එය මෙම සංවේදි පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමෙහිලා සම්පූර්ණ කර ගත යුතු ඉලක්කයක් වේ. ප්‍රධාන අරමුණු වශයෙන් පවතින වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගැනීම ජල මුලාශ්‍රවල ජලයේ ගුණාත්මක බව ඉහළ නැංවීම, ගැප් (GAP) සහතික කෘෂිකාර්මික භාවිතයන් ඇති කිරීම යන අරමුණු හඳුනාගෙන ඇත්තේ මෙම පාරිසරික සංවේදිතාව ආරක්ෂා කිරීමටයි.

මෙම සංවර්ධන සැලැස්මේ දැක්ම වන්නේ මීහිදුම් කදුකරයේ පාරාදීසය වන අතර ඒ සඳහා වන ප්‍රධාන ඉලක්ක ලෙස පවත්නා පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම හා පිරිසිදු ජල මුලාශ්‍ර පද්ධතියක් යටතේ අරමුණු 5ක් හදුනාගෙන ඇත. ඒ අතුරින් 2030 වන විට පිරිසිදු පානීය ජලය සැපයීම ප්‍රධාන ජලාශ වල ජලයෙහි ගුණාත්ම භාවය වැඩි කිරීම ජල මුලාශ්‍ර ආශ්‍රිතව අනවසරයෙන් අල්ලාගත් ප්‍ර දේශ නිදහස් කර ගැනීම හා දැනට පවත්නා වනාන්තර ප්‍රතිශතය එලෙසම පවත්වා ගැනීම යන අරමුණු ප්‍රධාන වන අතර ඉහත කී සංවේදී පරිදර පද්ධතිය ආරක්ෂාක කර ගැනීමේ උපාය මාර්ග තුලින් මෙකී ඉලක්ක හා අරමුණු සපුරා ගැනීමට සෘජුව දායක වේ.

එසේම දිදුලන ආර්ථික සංවර්ධනයක් හා නුවරඑළිය ආවේනික ගති ලක්ෂන මුර්තිමත් කිරීම යන අනෙකුත් ඉලක්ක සම්පූර්ණ කිරීමද පූර්ණ ලෙස මෙම උපාය මාර්ගය දායක වේ. විශේෂයෙන් නුවරඑළියට ආවේනික වනාන්තර පද්ධති ආරක්ෂා කිරීම තුලින් නගරයට පිවිසෙන සංචාරකයින්ගේ දර්ශනීය තල හා භූ දර්ශන අලංකරණද වැඩි වේ. පරිසර සංවේදී හරිත සංචලන නගරයක් බවට පත් කිරීම ඒ තුලින් සංචාරක වර්ධනය ඇති කර ගැනීමත් හේතු වේ. මෙය දල සංචාරක රාත්‍රී 4ක් සඳහා වන අරමුණු ලගා කර ගැනීමටද වක්‍රාකාරව සහය වේ.

6.4.1.2. උපාය මාර්ග

1 - සංවේදි සංරක්ෂිත වනාන්තර පද්ධතියක්

පසුගිය වසර 5ක් තුළ ප්‍රදේශයේ වනාත්තර ගහනය 6%කින් පමණ අඩු වී ඇති බැවින් ඉදිරියේදි දැනට පවත්නා 34%ක් වු වන ගහනය අඩු නොවීමට මෙයින් බලාපොරොත්තු වේ. පවතින වනාන්තර සිමාවන් වෙන් කොට කලාපකරණයට ලක් කිරීම එම වනාත්තර කලාප කිසිදු ඉදිකිරීමක් සඳහා ඉඩ නොදිමේ රෙගුලාසි පැනවීමත් මෙයින් තවදුරටත් තහවුරු වේ. තවදුරටත් අනවසරයෙන් වනාන්තර එලිකිරීම් වැලැක්වීම සඳහා යාබද කලාප වල මායිම් දිගේ අවරෝධක උපක්‍රමයක් ලෙස අඩි පාරවල් සැකසීම සිදුකල යුතුයි. මෙම මාර්ග ජනතාවගේ ඇවිදිමේ හා පරිසරය විදීමේ අවශ්‍යතාවන්ද සම්පූර්ණ කරනු ලැබේ.

එසේම වනාන්තර කලාපයට මායිම් වන කලාප අවරෝධක කලාපයක් ලෙස නම් කීරිම එහි සංවර්ධන කටයුතු සීමා කිරීමත් වනාත්තර මායිමේ සිට අවම මීටර් 10 ක රක්ෂිතයක් ඉදිකිරීම් සඳහා පවත්වා ගැනීමට රෙගුලාසි පැනවීමත් පවත්නා වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.

සිතියම් අංක 6.11: පාරිසරික තිරසාර භාවය සදහා වූ උපාය මාර්ග සංවේදි සංරක්ෂිත වනාන්තර වැස්ම



පාරිසරික තිරසාර භාවය සදහා වූ උපාය මාර්ග සංවේදි සංරක්ෂිත වනාන්තර වැස්ම
විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
නුවර එළිය කාර්යාලය
සැප්තැම්බර් **2018**

නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)

සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං.. අ

2 - ජල මුලාශ්‍ර සඳහා රක්ෂිත වෙන් කිරීම

ප්‍රධාන ජල මාර්ග සඳහා අවම රක්ෂිතයක් පැන වීමත් ග්‍රෙගරි වැව අවට කලාපය සංවේදි පරිසර සීමාවක් ලෙස නම් කර ඉදිකිරීම් පාලනය කිරීමත් බ්රැක්ප්ලේන් ජලාශය අවට සීමා මායිම් පනවා ඒ වටා පදික හා පාපැදි මංතීරු ඉදිකිරීම තුළින් ජල මුලාශ්‍ර ආරක්ෂා කිරීමට බලාපොරොත්තු වේ.

එසේම ජලවහන පද්ධතියට මල අපද්‍රවය හා අනෙකුත් අප ජලය එක්වීම වැලැක්වීම සඳහා නව ඉදිකිරීම් සඳහා අපජලය පිරිපහදු පද්ධතියක් අනිවාර්යය කිරීමේ රෙගුලාසි පැන වීමද නව ක්‍රියා මාර්ගයකි. පවතින හෝටල් හා සංචාරක හෝටල් සඳහා පොකුරු ක්‍රමයට පිරිපහදු පද්ධතින් ඇති කිරීමත් දැනට නුවරඑළිය මහ නගර සභාව හා JICA ආයතනය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන මධ්‍යම මලාපවාහන පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් තවදුරටත් පරිසර සංවේදිතාවය ආරක්ෂා කර ගැනීමට ඉවහල් වේ. යෝජිත මලාපවාහන පද්ධතිය සඳහා ඉඩම් කොටස් වෙන් කිරීමත් මෙම සැලසුම මගින් හදුනාගෙන ඇත. ජල මුලාශ්‍ර ආශ්‍රිත හා එහි ආවරණය කරන ඉඩම් වල යහපත් කෘෂිකර්මය (ගැප්) අනිවාර්යය කිරීම සඳහා රෙගුලාසි පැනවීම.

3 – ජලාශ්‍රිත ක්‍රියාකාරකම් (Water front activity)

නානුඔය ඇල, බ්රැක්ප්ලෙන් ඇල හා අතුරු ඇල මාර්ග අවම රක්ෂිතයක් නියම කිරීමත් එකි රක්ෂිතයන් තුළින් ජනතාවට ඇවිදිමේ මංතීරු හා ජල මාර්ග වල පාරිසරික තත්වය විදගැනීමේ පහසුකම් සැපයීම තුළින් ජල මාර්ග රක්ෂිත ආක්‍රමණය කිරීමත් අපවිත්‍ර වීමත් අවම වේ.

4 - පාරිසරික සංවේදි ස්ථාන ආරක්ෂා කිරීම උදෙසා සීමා කොන්දේසි පැනවීම

පාරිසරික වශයෙන් සංවේදි ස්ථාන හදුනා ගැනීම හා සංවේදි කලාප ලෙස නම් කිරීම ද ඒ අනුව සංවේදි කලාප 1,2, 3 ලෙස කලාපකරණයේදි වෙන් කිරීම ප්‍රධාන උපාය මාර්ගයක් වේ. සංවේදිතා අධ්‍යයනයන් අධිසංවේදි කලාප ලෙස හදුනා ගන්නා ලද ප්‍රදේශයන් මෙම කලාපකරණයට භාජනය කරන ලදි.

ශාන්තිපුර හා උඩරදැල්ල වනාන්තර සීමාවට මායිම් ප්‍රදේශය, ශාන්තිපුර පිවිසුම් මාර්ගය බඹරකැලේ අධි බෑවුම් කොටස, බඹරකැලේ නානුඔය ඇල දෙපස කොටස, ශාන්ත ඇන්ඩෘස් පාර පල්ලිය ඒ ආශ්‍රිත වනාන්තර ප්‍රදේශය, ග්‍රෙගරි වැව ජලය පිටවාන සිට බ්ලැක්පුල් දක්වා ඇල දිගේ බිම් තීරුව, යුනික්විව් වනාන්තරයට යාබද කොටස මේ අතර ප්‍රධාන තැනක් ගනි. මෙම ප්‍රදේශයන් වල ඉදිකිරීම් සඳහා දැඩි කොන්දේසි පැනවීමත් වන වගාව ආරම්භ කිරීමත් සංවේදි තාවය ප්‍රගුණ කිරීමට සහයක් වන ඇත. එසේම සංවේදි දර්ශන පද්ධති තේ වගා බිම් කොටස් ද ඉදිකිරීම් වලින් නිදහස් කිරීම සඳහා රෙගුලාසි පැනවීමට මෙමගින් කටයුතු කරනු ලැබේ. ඒ යටතේ වින්ඩ්කෝනර් ප්‍රදේශය ආශ්‍රිත තේ වගාව බඹරකැලේ තේ වගා භූමිය සංවේදි කලාප ලෙස හදුනා ගෙන ඇත.

සිතියම් අංක 6.12: සංවේදී කලාප



උපාය මාර්ග 5 - දර්ශන තල අවහිර වීම වැලැක්වීම හා හරිත ගහනය වැඩි කිරීම

පාරිසරික සුන්දරතාවය හා සංවේදිතාව නුවරඑළියට පැමිණෙන සංචාරකයින්ටත් අනෙකුත් ජනතාවටත් විඳගැනීම සැලැස්විම සඳහා මේ තුළින් තවදුරටත් සංචාරක ආකර්ෂණය වැඩි කිරීම මෙමගින් අරමුණු කෙරේ. නගරය වටා ඇති කඳු පන්තින් වල දර්ශන තල අවහිර වන ආකාරයේ ඉදිකිරීම් සඳහා ඉඩ නොදීමටත් සෑම කඳු පන්තියකම 2/3 ක ප්‍රමාණයක් ප්‍රධාන පිවිසුම් මාර්ග ආශ්‍රිතව දර්ශනය වීමට සැලැස්වීම සඳහා ඉදිකිරීම් පාලනය කිරීම මෙහි අදහස් කෙරේ.

එසේම ප්‍රදේශයේ ඉදිකරනු ලබන සියළුම ඉදිකිරීම් හා සමගාමීව ඒ ඒ පරිශ්‍රයන් වල අවම වශයෙන් ගස් 5ක් සිටුවීමේ රෙගුලාසි පැනවීමත් දැනටමත් ඉදිකර ඇති ගොඩනැගිලි ආවරණය කිරීම සඳහා නව වන වගාවක් සෑම පරිශ්‍රයක් තුළ ආරම්භ කිරීමත් සිදුකල යුතුයි. එසේම ග්‍රෙගරි වැව වටා නව වන වගාව ආරම්භ කිරිමත් නගරයේ අනෙකුත් ප්‍රදේශ වල මාර්ග මායිමට යාබදව රුක් රෝපණ ව්‍යාපෘති සිදුකිරීමත් මෙම සංවේදි පරිසරය පවත්වා ගෙන යාම සඳහා තවදුරටත් ඉවහල් වනු ඇත.

උපාය මාර්ග 6 - පාරිසරික හිතෛෂි කෘෂිකාර්මික භාවිතයක්

විසල් නුවරඑළිය සංවර්ධන සැලැසුම් කලාපය තුළ ප්‍රධාන ආර්ථික මාර්ගයක් ලෙස උඩරට එළවළු වගාව හඳුනාගෙන ඇති වුවද ඒ තුළින් පරිසරයට ජල මුලාශ්‍ර වලට සිදුවන අපවිත්‍රතාවය පිළිබඳව ගැටළු තුළින් හඳුනාගෙන ඇත. ඒ හෙයින් ප්‍රදේශයේ ඇති හෙක්. 200ක පමණ වූ උඩරට එළවළු වගාව තුළින් අවම පරිසර හානියක් සිදුවන ආකාරයට කෘත්‍රිම පොහොර හා කෘමි නාශක භාවිතය අවම කර කාබනික වගාවක් කෙරෙහි නැඹුරු කිරීම මින් අදහස් කෙරේ. ඒ අනුව සියළුම කෘෂිකාර්මික කටයුතු කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ GAP සහතිකය ඇතිව පවත්වා ගෙන යාමට නිර්දේශ කරනු ලැබේ. මේ අනුව ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ උපාය මාර්ග යටතේ සෑම ගෙවත්තකම කොම්පොස්ට් බඳුනක් පිහිටුවීමේ අරමුණට අනුව මෙම උපාය මාර්ග සමගද ගැලපේ.

.64 2.භූදර්ශන අලංකරණ සැලැස්ම

6.4.2.1.හැදින්වීම.

ස්වභාවික සෞන්දර්යය නිසාම අතිශය ජනාදරයට පාත්‍ර වූ නුවරඑළිය ප්‍රදේශය භූදර්ශනය අලංකරණය විශේෂ වුවක් ලෙස සැලකිය හැකිය. විසල් නුවරඑළිය කලාපය තුල පිහිටි සංවර්ධිත පරිසරයම භූදර්ශනය පරිසරයකින් යුක්ත වීම ඊට ප්‍රධාන හේතුවක් වේ. විශේෂයෙන්ම අතීතයේ පටන් ස්වාභාවික සංවේදී කලාපයක් බවට නම්කර තිබීමත් බ්‍රිතාන්‍ය පාලන සමයේදී නුවරළිය පිවිසීමෙන් පසුවද Resot එකක් ලෙස පවත්වාගෙන යාමටද හේතු වුයේ නුවරඑළියේ පවතින ස්වාභාවික පාරිසරික භූ අලංකරණයයි. වර්තමානයේ සංචාරක ක්ෂේත්‍රය වර්ධනය වීමටද මෙම ස්වභාවික පාරිසර පද්ධතිය පදනම් කර ගත් භූදර්ශනය හේතු වී ඇත.

පවත්නා වනාන්තර පද්ධතිය, තේ වගාව ස්වභාවික ජල දහරා දියඇලි, විවෘත භූමි, ගෝල්ෆ් ක්‍රීඩා පිටිය, ග්‍රෙගරි වැව ආශ්‍රිත පාරිසරික කලාපය ආදිය ප්‍රධාන අංගයන් ඒ අතර වේ. විසල් නුවරඑළිය සංවේදී කලාප තුල හෙක්ටයාර් 18 වු වනාන්තර පද්ධතියත් හෙක්ටයාර් 2 පමණ වු විවෘත භූමි හා ක්‍රීඩා පිටි මෙන්ම 13.3 වු තේ වගාව හා 5 පමණ වන ජල ආශ්‍රිත පැතිරීම් ද හෙක්ටයාර් 8.5 පමණ වන උඩරට කෘෂිකාර්මික මෙම භූදර්ශන අලංකරණය තීවුර කරවයි.

වර්තමානයේ මෙම ස්වභාවික පරිසර පද්ධතින්ට අමතරව බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද 130ක් පමණ වු බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ වලින් හෙබි ගොඩනැගිලිද මානව නිර්මාණය ලෙස භූ අලංකරණය තව දුරටත් වර්ධනය කරයි. එසේම පසු කාලීනව ඉදිකරන ලද ග්‍රෙගරි උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය ද භූදර්ශන අලංකරණය තව දුරටත් වර්ධනය කරයි.

කෙසේ වෙතත් වර්තමානයේදී මෙම නුවරඑළියට ආවේනිකව ස්වභාවික භූදර්ශනය තව දුරටත් හීන වීමට ලක්ව ඇති අතර අධි උස ගොඩනැගිලි ඉදිකිරීම හේතුවෙන් භූදර්ශන පථ අවහිර විම, ස්වභාවික වනාන්තර ප්‍රමාණය හීන වීම ස්වභාවික දිය ඇලි, ජල මාර්ග දර්ශනය නොවීම හා ජල මාර්ග අපවිත්‍ර වීම. මේ තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. එසේම ආවේනික ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ වෙනුවට වෙනත් ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ භාවිතා වීමද අලංකරණයට බාධාවක් වී ඇත. ස්වභාවික හරිත ඉදිකිරීම් වෙනුවට නිර්මිත ඉදිකිරීම් වැඩිවීමද පසුගිය කාලයේදී දක්නට ලැබේ.

6.4.2.2.උපාය මාර්ග

01. ස්වභාවික භූ දර්ශන තල ප්‍රවර්ධනය

ස්වභාවිකව ඇති භූදර්ශනය අලංකරණ ප්‍රවර්ධනය කිරීමත්, ඉදිරි භූදර්ශන සංවර්ධනයේදී ස්වභාවික පරිසර පද්ධතින් සදහා මූලිකත්ව දීමත් මෙයින් අදහස් කෙරේ.ඒ අනුව ඉදිරියේදි කෘත්‍රිමව කරන ලද භූදර්ශනයට වඩා ස්වභාවිකව පවතින පරිසර පද්ධතින් පවත්වා ගෙන යාමට සිදුවනු ඇත.

ස්වභාවික වනාන්තර පද්ධතිය ආරක්ෂා කිරීම හා නව නුවරඑළිය ආවේනික ස්වදේශිය ශාක රෝපනය සදහා පහත සදහන් ස්ථාන හදුනාගෙන ඇත. ඒ අනුව බඹරකැලේ, ශාන්තිපුර සංවේදී කලාපය හා යුනික්විව් සංවේදී කලාපය, නානුඔය ඇල දෙපස,ග්‍රෙගරි වැව ඉහල වැව් කොටස, ග්‍රෙගරි වැව ලේක් ක්ලබ් ඉදිරිපස රථවාහන ගාල, තුරඟ තරග පිටිය, උඩපුස්සල්ලාව මාර්ග රක්ෂිතය, බ්ලැක්පූල් පාලම අසල හා නානුඔය ඇල දෙපස ප්‍රදේශ ස්වභාවික භූදර්ශන පද්ධති ආරක්ෂා කිරිම සිදු කරනු ලැබේ.

02. නගර මධ්‍යයේ විනෝදාත්මක කලාපය හා භූ අලංකරණය

නගර මධ්‍යයේ පිහිටි ග්‍රෙගරි වැව කලාපය, තුරඟ තරග පිටිය, ගොල්ෆ් උද්‍යානය, වික්ටෝරියා උද්‍යානය හා ජනාධිපති මන්දිරය, සෙන්පති මැදුර හා අගමැති මැදුර ආශ්‍රිත භූමි කොටස් අවම ගොඩනැගිලි භාවිතයන් හා ස්වභාවික භූදර්ශන තලයන් ආරක්ෂා කරමින් සිදුකරනු ලැබේ. ඒ සදහා කලාපකරණ රෙගුලාසි හා ගොඩනැගිලි රෙගුලාසි හදුන්වා දෙනු ලැබේ.

03. සැම ඉඩමකම ගෙවත්තක්

සැම බිම් කට්ටියකම ඉදිකිරිම්, සීමාව අධි ඝණත්ව මිශ්‍ර හා අධි ඝණත්ව සංචාරක කලාප හැර අනෙක් කලාප 50% ලෙස රෙගුලාසි පැනවීමත්, අධි ඝණත්ව මිශ්‍ර හා අධි ඝණත්ව සංචාරක කලාපවල 60% ලෙස නම් කිරීමත් තුලින් ඉතිරි බිම් කොටසේ මල් වගාව, කෘෂිකර්මාන්ත හෝ භූදර්ශන අලංකරණ කටයුතු සදහා නියම කිරීම හා සැම ගෙවත්තකම අවම වශයෙන් ශාඛා 05 සිටුවීම අනිවාර්ය කිරීම.

04. ජල මාර්ග ආශ්‍රිත භූඅලංකරණ තුලින් නගර අලංකරණය

නුවරඑළිය ප්‍රධාන සම්පතක් වන ජල මූලාශ්‍ර ආශ්‍රිතව භූදර්ශන තල ආරක්ෂා කිරීම හා තවදුරටත් ප්‍රගුණ කිරීම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව බැරැක්ප්ලේන් ජලාශය අවට භූඅලංකරණ ව්‍යාපෘතිය, නානුඔය ඇල රක්ෂිතය භූදර්ශනය කිරීම, කටුමාන වැව හා ඇලේ රක්ෂිත කොටස් භූ අලංකරණය, මාගස්තොට වැව ආශ්‍රිතව භූ අලංකරණය කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් මෙම ඉලක්කය සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

05. නගර අලංකරණය හා ස්වභාවික නිර්මිතයන් පවත්වා ගැනීම

නගර මධ්‍යයේ හා ප්‍රධාන මාර්ග ආශ්‍රිතව ඇති කොන්ක්‍රීට් නිර්මිතයන් හරිත වැසුම් මගින් ආවරණය කිරීමත් ඉදිරියේදි එවැනි ඉදිකිරීම් අවම කිරීමත් මෙමගින් ඉලක්ක ගත වේ . ඒ අනුව ප්‍රධාන මාර්ග ආශ්‍රිතව කොන්ක්‍රිට් නිර්මිතයන් අවම කිරීම හා දැනට පවතින ඉදිකිරිම් (බැමි/කාණු/තාප්ප) හරිත වැසුම් මගින් අලංකරණය මගින් ආවරණය කිරීම, වෙළඳ ව්‍යාපාර සඳහා නිශ්චිත දැන්වීම් පුවරු සඳහා සම්මත ප්‍රමාණයන් පැනවීම, අතුරු මාර්ග පිවිසුම් ආරම්භයේදී පොදු දැන්වීම් පුවරු හඳුන්වා දීම, වෙළඳ දැන්වීම් පුවරු සඳහා සීමා කොන්දේසි පැනවීම, මේ සඳහා රෙගුලාසි මගින් නිශ්චිත ප්‍රමාණය හා සවිකිරීම සඳහා නියමයන් ලබා දීම, ගොඩනැගිලි සඳහා නියමිත වර්ණ/වහලයේ වර්ණ නියම කිරීම, ගොඩනැගිලි සැලසුම් සඳහා නුවරඑළිය ආවේනික ගෘහ නිර්මාණ ශිල්පී ලක්ෂණ රෙගුලාසි මගින් හඳුන්වා දීම, රෙගුලාසි මගින් ගොඩනැගිලි වල උස පාලනය කිරීම මගින් ස්වභාවික දර්ශන තල අවහිර වීම වලක්වාලීම හා නුවරඑළියට පිවිසුම් ස්ථාන අලංකරණය යටතේ නුවරඑළිය පිවිසෙන ප්‍රධාන ස්ථාන වල බ්ලැක්පූල්, ටොප්පාස්, කටුමාන හා බොරලන්ද ස්ථාන වල නුවරඑළියට ආවේණික ලක්ෂණ ඇතලුව භූදර්ශන කිරීම.

.64 3.ආපදා කළමනාකරණ සැලැස්ම

6.*4*.3.1 හැදින්වීම.

විසල් නුවරඑළිය සැලසුම් කලාපය තුල නාය යාම් හා ජල ගැලීම් ආපදා ප්‍රධාන වශයෙන් හදුනාගත හැකි අතර ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙ දත්තයන් අනුව නාය යෑමට ලක් විය හැකි වඩාත් අවධානම් කලාප 3ක් හදුනාගෙන ඇත. ඒ අනුව යුනික් විව් ඉහල කොටසේ අවධානම් කලාපය, බඹරකැලේ ඉහල කොටසේ ශාන්තිපුර මාර්ගය ආශ්‍රිතව අවධානම් කලාපය හා වොටර්ෆීල්ඩ් ඉහල කොටසේ අවධානම් කලාපය ලෙස පෙන්වා දිය හැකිය.

එසේම නුවරඑළිය ලැබෙන අධික වර්ෂා දිනවලදී ප්‍රධාන ජල මාර්ග උතුරු යැමෙන් පහත්බිම් ප්‍රදේශ යටවීම නිසා ඒ ආශ්‍රිත ඇති නේවාසික ප්‍රදේශ වලට හානි පැමිණ වේ. පහත වගුව මගින් මෙම ආපදා තත්වයන් සදහා බලපාන ස්ථාන විස්තර කර ඇත.

*වගු අංක **6.14:** ආපදා ස්ථාන*

ස්ථානය	පවුල් සංඛ්‍යාව	ආපදාව
PWD නිවාස	60	ජල ගැලීම්
ශාන්ත ඇන්ඩෘස් ඩ්රයිව්	20	ජල ගැලීම්
ජෙම්ස් වීදිය	25	ජලගැනීම්
යුනික්විව් ඉහල කොටස	58	නාය යෑම්
තුරඟ තරග පිටිය	54	ජල ගැලීම්
මහින්ද මාවත දෝව කොටස	34	ජල ගැනීම්

මූලාශ්‍රය - නුවර එළිය මහ නගර සභාව

6.*4*.3.*2* උපාය මාර්ග

1. ආපදා සහිත කලාප ඌණ සංවර්ධන කලාප ලෙස නම් කිරීම.

යුනික්විව් ඉහළ කොටස, බඹරකැලේ ඉහළ කොටසේ ශාන්තිපුර ඉහළ කොටස සංවේදි කලාප ලෙස නම් කිරීමත් වෝටර්ෆිල්ඩ් ඩ්‍රයිව් ඉහළ කොටස, බොරලන්ද වන රක්ෂණයට යාබද කොටස් අඩු ඝනත්ව නේවාසික කොටස් ලෙස නම් කිරීමත් සංවර්ධන කටයුතු පාලනය කිරීම.

2.පදිංචි පවුල් ප්‍රතිස්ථාපනය කිරීම

- **i.** තුරඟ තරග පිටියේ පදිංචි පවුල් **54** දෙනා ඉහළ උන්නතාංශ ක්‍රිඩා සංකීර්ණ ව්‍යාපෘතියට සමගාමීව හාවාඑළිය නුවරඑළිය මහ නගර සභා ඉඩම් වලට ප්‍රතිස්ථාපනය කිරීම
- **ii.** නව නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යුනික්විව් ඉහළ කොටසේ පදිංචි පවුල් **24** ස්ක්‍රබ් වත්ත වෙත ප්‍රතිස්ථාපනය කිරීම

සිතියම් අංක 6.13: ආපදා කලාප සැලස්ම



ආපදා සහිත ප්‍රදේශ **විසල් නුවරඑළිය සංවර්ධන සැලස්ම** මූලාශ්‍රය - ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2018
නුවර එළිය නාගරික සංවර්ධන සැලැස්ම 2022- 2032	සැකසුම -මදුෂානි

3.ප්‍රධාන ජලාශ වල තැන්පත් වී ඇති රොන් මඩ ඉවත් කිරීම

I. බරුක්ප්ලේන් ජලාශයේ සීමා මායිම් නම් කරඑහි තැන්පත් වී ඇති රොන්මඩ ඉවත් කිරීම

II. කටුමාන ජලාශයේ රොන්මඩ ඉවත් කිරීම

4.ආපදාවට ලක්වී ඇති ඇල මාර්ග පුළුල් කිරීම

බ්රැක්ප්ලේන්, වෝටර්ෆිල්ඩ් ඩ්‍රයිව්, තලගල ඔය හා නානුඔය ගොල්ෆ් ඉඩම හරහා කොටස පුළුල් කිරීම

6.4.3.2.සංවර්ධන සැලසුම් දැක්ම / ඉලක්ක හා ගැලපීම

දිදුලන ඉසුරුමත් පුරවරයක් හා පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කර ගනිමින් නිසි ජල මුලාශ්‍ර පද්ධතියක් යන ඉලක්ක සැපරීම සදහා ඉහත ආපදා කළමනාකරණ උපාය මාර්ග ඍජුව හා වක්‍රව සහය වේ. සංවේදි පරිසර පද්ධතිය ආශ්‍රිතව පවත්නා ජල මුලාශ්‍ර තුළින් නේවාසික භාවිතය අවම කිරීමත් තුළින් ජල මුලාශ්‍ර පද්ධති වල සිදුවන දූෂණය වලක්වා ගත හැකිය.

6.4.3.3.අනෙකුත් උපාය මාර්ග හා සබැදීම

ආපදා කළමනකරණය අවම කිරීම සඳහා ජල මුලාශ්‍ර හා ජලාශ වල ධාරිතාව වැඩි කිරීම, ජල බස්නා කාණුහා වැසි ජලය බැසයාම සදහා වන උපාය මාර්ග සමග සබැදේ. එසේම නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යුනික්විව් ඉහළ කොටසේ නිවාස ප්‍රතිස්ථාපනයක්, ජේම්ස් වීදියේ නිවාස සංවර්ධනයත් මෙම ආපදා කළමනාකරණ ව්‍යාපෘතිය හා ඒකාබද්ධ වේ. එසේම ආර්ථික සංවර්ධන උපාය මාර්ග මගින් හඳුන්වා දී ඇති ඉහළ උන්නතාංශ ක්‍රිඩා සංකීර්ණ ව්‍යාපෘතිය යටතේ දැනටමත් පදිංචි අඩු ආදායම් නිවාස 54 ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියද මෙ හා සබැදේ.

සිතියම් අංක 6.14: පරිසර සංරක්ෂණ සදහා වන උපාය මාර්ග



පාරිසරික තිරසාර භාවය සදහා වූ උපාය මාර්ග

නාගරික සංවර්ධන අධිකාරිය
නුවර එළිය කාර්යාලය
2018

නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)

සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා ..සං.. අ

6.5සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් උපාය මාර්ග

.6.5.1සේවා සැලැස්ම

මිහිදුම් කදුකරයේ පරාදීසය යන ඉලක්කය කරා ගමන් කිරීමේදී විසල් නුවරඑළිය සංවර්ධන සැලසුම් කලාපය තුල සියලු දෙනාට තෘප්තිමත් විය හැකි තිරසර සංවර්ධනයක් ඇති කර ගනිමින් නේවාසික, සංක්‍රමණික ජනතාවගේ සේවා අවශ්‍යතා සැලසුම් සහිතව ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම මෙම සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් වේ.

විශේෂයෙන් සමස්ත ප්‍රදේශයටම 2030 වන විට වාර්ෂික සංචාරක ආගමනය මිලියන 4.5ක් මෙන්ම එය දෛනික සාමාන්‍ය 24,000ක් වන ඉලක්කයක් හා 2030 වන විට නේවාසික ජනගහනය 60,000 ලෙස ඉලක්ක කර ඇත. එසේම නගරයට පැමිණෙන සේවා ලාභීන් සේවා සපයන්නන් වන අනෙකුත් සංක්‍රමනික ජනතාව 2017 වන විට 40,000ක් පමණ වන අතර එය 2030 වන විට 60,000ක පමණ අගයකට වර්ධනය වනු ඇත. (ඇමුණුම් 05 - ජනගහන පුරෝකථන) මේ අනුව මෙම නේවාසික හා සංක්‍රමණික ජනගහනය උදෙසා අවශ්‍ය සේවාවන් පිළිබදව මෙම උපාය මාර්ගය යටතේ විග්‍රහ කරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන සේවාවන් අතුරින් නිවාස සෞඛ්‍ය හා අධ්‍යාපන යන සේවාව සදහා වැඩි අවධානයක් මෙම සැලැස්ම මගින් යොමු කෙරේ.

6.5.1 (අ) නිවාස

ප්‍රධාන වශයෙන් විසල් නුවරඑළිය කලාපය තුල නිවාස වල තත්ත්වය පහල මට්ටමක පැවතීම ගැටලුවක්ව පවතී. 21.6%ක ප්‍රතිශතයක් දරිද්‍රතා මට්ටමක් පිහිටීම මත ඔවුන්ගේ නිවාස වල තත්ත්වය ප්‍රමාණයක් පහල මට්ටක තිබීමක් දක්නට ලැබේ. එසේම අඩු පහසුකම් නිවාස මෙන්ම පැල්පත් නිවාස 2328 ප්‍රමාණයක් පැවතිමත් හඳුනාගත හැකිය. යුනික් විව්, කැලේගාල, නේස්බි වත්ත, ගැල්වේස්වත්ත, MC නිවාස, PWD නිවාස, පොලිස් පටුමග නිවාස, ස්ක්‍රබ්වත්ත, ස්ක්‍රබ් වත්ත වතු නිවාස මේ අතරින්ප්‍රධාන වේ.

එසේම ප්‍රදේශයේ තිබෙන නිවාස අහිමි පවුල් සංඛ්‍යාව 224ක් වන බව ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වාර්තා කරයි. 2016 වන විට පැල්පත් හා පේලි නිවාස 2328 වේ.

විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම යටතේ මෙම 21.6%ක් වන අඩු පහසුකම් නිවාස ප්‍රමාණය 2032 වන විට 10%ක් දක්වා අඩු කිරීමේ ඉලක්කයක් හඳුනාගෙන ඇත.විසල් නුවරඑළිය කලාපයේ 2016 වර්ෂයේ ජනගහනය 49,331 ලෙසද 2017 වසරේ එය 52302 ක් ලෙසද වන අතර පවත්නා ජනගහන වර්ධන වේගය අනුව කලාපය තුල 60,000ක පමණ වන ජනගහනයක් අපේක්ෂා කල හැකිය.
2012 වසරේදී මුළු පවුල් සංඛ්‍යාව 11008 වන අතර එසේම 2017 වසරේදී මෙම ප්‍රමාණය 11,644ක් පමණ වේ. ඒ අනුව කුටුම්භයක ප්‍රමාණය 4.4ක් ලෙස ගණනය කල හැකිය.

එසේම 2012 වර්ෂයේදී 242 වු නිවාස හිගය 2017 වර්ෂයේදී 247ක් වේ. එසේම 2028 වසර වන විට අමතර ජනගහනය 7,698 ක් ඒක්වන අතර ඒ සදහා නිවාස 1,749ක් අවශ්‍යව පවතී.

2017 වසරේදී සමස්ථ නිවාස 2.1%ක හිගයක් පවතින බැවින් ඊට සාපේක්ෂව 2028 වන විට වැඩි වන නිවාස ප්‍රමාණයෙන් 3%ක ප්‍රමාණයක් සෘජු නිවාස සංවර්ධනයක් හා නිවාස 1443ක් වෙළඳපොළ ප්‍රවාහය මගින් වැඩි දියුණු වීමක්ද මෙම සැලැස්ම මගින් යෝජනා කරනු ලැබේ. ඒ අනුව,

2032 වන විට අවශ්‍ය අමතර නිවාස ප්‍රමාණය	**1749**
මුළු ප්‍රමාණයෙන් කල් ඉකුත් වූ නිවාස	**116**
2032 වන විට මුළු අවශ්‍යතාවය	**1865**

සෞඛ්‍ය නිවාස ඉදිකිරීම් **03%**	**179**
2017 වසර වන විට හිඟ නිවාස	**247**
සම්පූර්ණ සෞඛ්‍ය නිවාස ඉදිකිරීම් ප්‍රමාණය	**422**

සෞඛ්‍ය නිවාස සැපයීම	**422**
වෙළඳපල ප්‍රවාහනය අනුව	**1443**

6.5.1.(ආ**)** උපාය මාර්ග

1. සෞඛ්‍ය නිවාස ව්‍යාපෘති

මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතින් **02**ක් ක්‍රියාත්මක කිරීම

1. ස්ක්‍රබ් වත්ත නා.සං.අධි ඉඩම **80**
2. මධ්‍යම පාන්තික නිවාස යෝජිත - භාවාඑළිය කාලගුණික විද්‍යා දෙපාර්තමේන්තු ඉඩම **100**

වෙළඳපොල ප්‍රවාහය අනුව නිවාස සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීමත් අපරව්‍යුහ පහසුකම් වර්ධනය කිරීමත් හා කාලපකරණ රෙගුලාසි, සැලසුම් රෙගුලාසි අනුව මධ්‍ය ඝණත්ව නේවාසික කලාප ලෙස බ්ලැක්පූල්, මීපිලිමාන, රුවන්පුර, කටුමාන, ප්‍රදේශ හඳුනා ගැනීම මෙම සැලසුම් මගින් ක්‍රියාත්මක කෙරේ.

2.දැනටමත් අඩු පහසුකම් නිවාස ප්‍රතිසංස්කරණය

2012 දත්ත අනුව පේලි හා පැල්පත් නිවාස **2328 (21.6)** හා **2017** අනුව **2533**ක් ලෙස හඳුනා ගත හැකිය. විශේෂයෙන් ආන්තික කලාපවල මෙන්ම වතු ආශ්‍රිත සේවක නිවාස ලෙස බොහොමයක් පේලි නිවාස, පැල්පත් නිවාස, මේ තුලට අන්තර් ගත වන අතර එම නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග ක්‍රම කිහිපයකට යෝජනා කරනු ලබයි.

*වගු අංක **6.15:** නිවාස වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය*

අ.අ	ස්ථානය	නිවාස සංඛ්‍යාව	ඉඩමේ අයිතිය	නිවාස වැඩි දියුණු කිරීමේ උපාය මාර්ගය
1	බඹරකැලේ **PWD** නිවාස	55	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	පවත්නා ස්ථානයේම පෞද්ගලික අයෝජකයින් සමග ඒකාබද්ධව වැඩි දියුණු කිරීම
2	බඹරකැලේ වතු නිවාස	150	වතු සමාගම් /ඉ.ප්‍රකො.ස	මෙම ස්ථානයේම නා.සං.අධි මගින් ලබා දෙන සැලැස්මකට අනුව ඉදිකිරීම් කිරීම
3	ජෙම්ස් වීදිය නිවාස	50	ගෝල්ෆ් නිවාස	පවත්නා ස්ථානයේම පෞද්ගලික අයෝජකයින් සමග ඒකාබද්ධව වැඩිදියුණු කිරීම
4	ලේඩි මැක්ලම් පාර **MC** නිවාස	400	නුවරඑළිය මහනගරසභාව	ආකෘතිමය විසඳුමක් මගින් පොදු විවෘත ප්‍රදේශ හා ප්‍රවේශ ඉඩ ප්‍රමාණයට වැඩිදියුණු කර ගැනිම
5	ගැල්වේස්උද් යානනිවාස	60	නුවරඑළියමහනගරසභාව	පවත්නා ස්ථානයේම නිසි සැලැස්මකට සංවර්ධනය කිරීම හා අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් සැපයීම.
6	ස්ක්‍රබ් වත්ත	300	**LRC/** වතු පහසුකම්	පවත්නා ස්ථානයේම සංවර්ධනය කිරීම.

*මූලාශ්‍රය **-** නුවර එළිය මහ නගර සභාව/නාගරික සංවර්ධන අධිකාරිය*

6.5.1.(අ) 3 නව ස්ථාන වෙත විතැන් කිරීමේ උපාය මාර්ග

*වගු අංක **6.16:** නිවාස ඉදිකිරීමේ උපාය මාර්ගය*

අංක	ස්ථානය	නිවාස සංඛ්‍යාව	ඉඩමේ අයිතිය	නිවාස ඉදිකිරීමේ උපාය මාර්ගය
1	යුනික් විව් නිවාස	54	රජයේ	මේ වෙනුවෙන් ස්ක්‍රබ් වත්ත කොටසේ අක්කර 2ක් අත්පත් කරගෙන එහි පදිංචි කිරීම හා ඒ සමගම ස්ක්‍රබ් වත්ත නිවාස කොටසක් අලුතින් ඉදිකිරීම.
2	ස්ක්‍රබ් වත්ත	100	රජයේ	නව නිවාසවල අලුතින් පදිංචි කිරීම
3	ගෝල්ෆ් නිවාස	54	ගොල්ෆ් ක්‍රීඩාංගණය - නුවරඑළිය මහ නගර සභාව	යෝජිත ඉහළ උන්නතාංශ සංකීර්ණ ව්‍යාපෘතිය සමග ඒකාබද්ධව ඉදිකිරීම.
4	බොරලන්ද අඩු ආදායම් නිවාස සංකීර්ණය	50	නාගරික සංවර්ධන අධිකාරිය	පවත්නා ස්ථානයේම අයිතිකරුවන්ගේ ආයෝජනය ඉදිකිරීම් කිරීම.

6.5.1 (ආ) අධ්‍යාපනය

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුල ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන මට්ටම දිස්ත්‍රික්කයේ අනෙක් කලාප සමග සංසන්දය කිරීමේදී පහල අගයක් ගනි. 2016 වසරේදී ජාතික වශයෙන් අ.පො.ස (සාපෙළ) සමත් ප්‍රතිශතය 71%ක් ලෙස හා උසස්පෙළ සමත් ප්‍රතිශතය 70%ක් ලෙස පැවතියද මෙම කලාපයේ එය පිලිවෙළින් 53% ක් හා 50% අගයක් ගනී. මෙම කලාපයේ පාසල් **14** පවතින අතර ළමුන් **8,600** පමණ අධ්‍යාපනය ලබයි. ඉන් 30%ක් පමණ කලාපයෙන් බාහිරව දෛනිකව අධ්‍යාපන කටයුතු සඳහා නගරයට ඇදී එයි.

6.5.1 (ආ) උපාය මාර්ග.

1. ප්‍රදේශයේ පාසල් 14ක් අතරින් ප්‍රමාණවත් ක්‍රීඩා පිටි ඇත්තේ පාසල් 05 ක පමණක් වන අතර ප්‍රධාන පාසල් 04ක නව ක්‍රීඩා පිටි සංවර්ධනයක් මෙම සංවර්ධන සැලසුම් මගින් යෝජනා වේ.

   1. හාවාඑළිය වජිරඥාන ක්‍රිඩා පිටිය විධිමත්ව සංවර්ධනය කිරීම.
   2. මිපිලිමාන සේනානන්ද විදුහලේ ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීම
   3. කළුකැලේ ප්‍රාථමික විදුහලේ ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීම
   4. මාගස්තොට මද්දුම බණ්ඩාර විදුහල් ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීම

2. ප්‍රාථමික අධ්‍යාපන අංශ සංවර්ධනය

නේස්බි වත්ත,ගැල්වේස් ලැන්ඩ් නිවාස,MC නිවාස , යෝජිත ස්ක්‍රබ් නව නිවාස ආශ්‍රිතවහා යෝජිත ගෝල්ෆ් නිවාස වෙත විතැන් කිරීම් ව්‍යාපෘතිය ආශ්‍රිතව පෙර පාසල් සඳහා ඉඩකඩ වෙන් කිරීම.

3. තෘතියික අධ්‍යයන සංවර්ධනය

ප්‍රදේශයේ තෘතිය අධ්‍යයන සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ආයතන 4ක් පිහිටුවා ඇත. එනම් වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය ,නුවරඑළිය කාර්මික විද්‍යාලය හා තරුණසේවා සභාව වේ.
මීට අමතරව පෞද්ගලික අධ්‍යාපන ආයතන 02ක්ද පිහිටුවා ඇත.ඉදිරි සංචාරක හා කෘෂිකර්මික සංවර්ධන ඉලක්ක කරගත් පාඨමාලා සඳහා නව අවස්ථා ඇති කිරීම.

I. වෘත්තිය පුහුණු අධිකාරිය පරිශ්‍රය තුල හෝටල් පාසලක් ආරම්භ කිරීම.

II. බඹරකැලේ ප්‍රාථමික විද්‍යාලය, මල් වගාව, කෘෂිකාර්මික / පශු සම්පත් සංවර්ධන ආශ්‍රිත වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පත් කිරීම

III. සිතාඑළිය බීජ අල පර්යේෂණ ආයතනය තුල කෘෂිකාර්මික පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම. ප්‍රදේශයේ ගොවියන්ට යහපත් කෘෂිකාර්මික පිළිබදව දැනුවත් කිරීම හා යෝජිත GAP සහතික ක්‍රමවේදය සඳහා පාඨමාලාව අවතීර්ණ කිරීම

6.5.1 (ඇ). සෞඛ්‍ය සේවාව

ප්‍රදේශයේ ප්‍රධාන වෛද්‍ය පහසුකම් සපයන ස්ථානය ලෙස නුවරඑළිය මහ රෝහල පත්ව ඇත. එහි නව රෝහල් සංකීර්ණය සමග ජාතික රෝහලක් ලෙස පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර වර්තමානයේ පවත්නා ඇඳන් ප්‍රමාණය 425 හා වෛද්‍යවරුන් 105 වේ. .එසේම යෝජිත නව රෝහල් සංකීර්ණය සමග ඇඳන් 525 ක් අමතර ඒකතු කරගනු ලැබේ.

6.5.1 (ඇ) 1.උපාය මාර්ග

01. නව රෝහල් සංකිර්ණය ප්‍රමාණවත් රථ වාහන ගාල් පහසුකම් සංවර්ධනය කිරීම.

ඒ අනුව නව රෝහල තුලට පැමිණෙන සේවා වාහන, වෛද්‍යවරුන්ගේ වාහන හා හදිසි පිවිසුම් මාර්ගයක් ලෙස ලේඩි මැක්ලම් මාර්ගයෙන් නව ප්‍රවේශයක් නව රෝහල තුළට ලබා ගැනීම

උඩපුස්සල්ලාව මාර්ගයේ සිට රෝහල තෙක් ඇති මාර්ගය අවම පළල මීටර් 12ක් ලෙස සංවර්ධනය කිරීම

ප්‍රධාන රෝහල ආශ්‍රිතව අපජලය පිරිපහදු කරණය පුළුල් කිරීම හා රෝහල් අපද්‍රව්‍ය දහනාගාරයක් නව රෝහල් පරිශ්‍රයේ පිහිටුවීම

18. රෝහලේ ප්‍රධාන රථවාහන ගාල සංවර්ධනය

02. පෞද්ගලික රෝහල් ප්‍රවර්ධනය

නුවරඑළිය කලාපය තුල වර්තමොනයේ එක් පෞද්ගලික රෝහලන් පවතින අතර එහි ඇඳන් ධාරිතාව ඇඳන්39ක් වේ.කෙසේ වෙතත් ඉදිරි සංචාරක අපරව්‍යුහ පහසුකම් ප්‍රවර්ධනය උදෙසා අධි ඝණත්ව මිශ්‍ර කලාපය තුල ඇඳන් 10-20 අතර පෞද්ගලික රෝහලක් සඳහා ඉඩදීම සුදුසු වේ.

03.ආයුර්වේද ප්‍රතිකාර ප්‍රවර්ධනය

දිස්ත්‍රික්කය තුල ආයුර්වේද රෝහලක අවශ්‍යතාව පැනනගින අතර සංචාරක ව්‍යාපාරය සංවර්ධනයට සමගාමීව ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ආයුර්වේද රෝහලක් ඇති කිරීම. ඒ සඳහා රාජ්‍ය / පෞද්ගලික අංශයට විවෘත අවස්ථාවක් ලබා දීම හා ඉහල වැව පාර නාගරික සංවර්ධන අධිකාරිය සතු ඕක්ලේ කොටේජ් ඉඩමෙන් අක්කර 02ක් ඒ සඳහා වෙන් කිරීම.

සිතියම් අංක 6.15 : සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් උපාය මාර්ග



සාමාජයීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධන සැලැස්ම **විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම**	නාගරික සංවර්ධන අධිකාරිය නුවරඑළිය 2019

මිහිඳුම් කඳුකරයේ පාරාදීසය ලෙස දැක්ම පෙරදැරි කරගෙන පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම හා පිරිසිදු ජල මූලාශ්‍ර පද්ධතින් හා, නුවරඑළියට ආවේනික ගති ලක්ෂණ මූර්තිමත් කිරීම හා දිදුලන ආරථික පුරවරයක් යන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම සේවා උපාය මාර්ග ඍජුව හා වක්‍රව සහය වනු ලැබේ.

නව නිවාස ඉදිකිරීම හා දැනට පවතින අඩු පහසුකම් නිවාස සංවර්ධනය තුළින් දරිද්‍රතා මට්ටම පහල අගයකට ගෙන ඒමත් ඒ තුලින් දිදුලන ආර්ථිකයක් යන ඉලක්ක සපුරා ගැනිමට හැකි වනු ඇත. එසේම පරිසර සංවේදී පද්ධති වල ආශ්‍රිතව ඇති පී.ඩබ්.ඩී නිවාස යුනික් විව් නිවාස, විකල්ප ලබා දිම තුලින් පරිසරයට සිදු වන හානිය අවම කර ගැනීමත් ඒ තුලින් පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනිම හා පිරිසිදු ජල මූලාශ්‍ර පද්ධතියක් යන ඉලක්කය සපුරා ගැනීමට හැකි වනු ඇත.

නුවරඑළිය නගරයේ 21% වන පැල්පත් හා අඩු පහසුකම් නිවාස ප්‍රතිශතය 10% දක්වා අඩු කිරීම යන අරමුණ යටතේ දැනට පවතින අඩු පහසුකම් නිවාස වැඩි දියුණු කිරීම තුලින් නුවරඑළියේ භූදර්ශන පථ අවහිර වීම වැලැක්වීම හා පරිසර අලංකාරය වැඩි දියුණු වීම නිසා නුවරඑළියේ ගති ලක්ෂණ මූර්තිමත් කිරීම යන ගති ලක්ෂණ සපුරාලීමට හැකි වනු ඇත.

නව ක්‍රිඩාංගන සංවර්ධන හා ප්‍රාථමික පාසල් සංවර්ධනය තුළින් දිදුලන ඉසුරුමත් පුරවරයක් සඳහා නේවාසික ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමටත් යෝජිත නේවාසික භාවිතය සඳහා ඉල්ලුම් වැඩි කිරීමට මිපිලිමාන හා බැලැක්ෆුල් යන ප්‍රදේශ වල නේවාසික ආකර්ෂණය සඳහා ඉවහල් වනු ඇත.

තෘතියික අධ්‍යාපන සංවර්ධනය යටතේ සංචාරක ක්ෂේත්‍රයේ හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුහුණු ස්ථාන ඇති කිරීම තුළින් දෛනික සංචාරක ආගමනය 24,000 ක් සඳහා සේවා සැපයීමට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සිදුකල හැක. එමගින් දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගත හැක. නිවැරදි කෘෂිකාර්මික භාවිතයක් සඳහා ජනාතව හුරුකිරීමෙන් පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා ඉලක්කය සම්පූර්ණ කර ගැනිමට හේතුවේ.

සෞඛ්‍ය සේවාව යටතේ දැනටමත් සංවර්ධනය කරනු ලබන රෝහලේ රථවාහන ගාල් ප්‍රවර්ධනය තුළින් සෞඛ්‍ය පහසුකම් ලබා ගන්නා ජනතාවගේ සේවා සංවර්ධනයට ඉවහල් වන අතර එය දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගැනීමට සහය වේ.

පෞද්ගලික රෝහල් ප්‍රවර්ධනය හා ආයුර්වේද රෝහලක් ඇති කිරීම තුළින් සංචාරක ආගමනයට රුකුලක් වන අතර ඒ තුළින් දිදුලන ඉසුරුමත් පුරවරයක් යන ඉලක්කය සපුරා ගත හැකිවේ.

6.5.2ප්‍රවාහනය

6.5.2.1. හැඳින්වීම

නුවරඑළිය නගරය සංචාරක කේන්ද්‍රස්ථානයක් මෙන්ම දිස්ත්‍රික්කයේ පරිපාලන කේන්ද්‍රස්ථානයක් ලෙසද කටයුතු කරනු ලැබේ. **2012** වසරේ දිස්ත්‍රික් ජනගහනය **706210** ක් වන අතර ඉදිරි වසර **10** වන විට එය **7012000** පමණ අගයක් ගනු ඇත මේ අනුව පරිපාලන හා අනෙකුත් කටයුතු සඳහා නුවරඑළිය නගරයට ඇදී එන ජනහගහනය දෛනිකව **62000**ක් පමණ වනු ඇත. එසේම දෛනික සංචාරක පැමිණීම සාමාන්‍ය **24,000** පමණ වනු ඇත. මේ අතර **2016** වසරේ **52500**ක් වන ප්‍රදේශයේ ජනගහනය ඉදිරි වසර **10**කින් **60,000**ක අගයක් ගනු ඇත.

19. මෙම සමස්ත සංචාරක ජනතාවගෙන් **75%** පමණ භාවිත කරණු ලබන්නේ පෞද්ගලික ප්‍රවාහන මාධ්‍ය වන අතර සංක්‍රමණික ජනතාවගෙන් **50%**කට ආසන්න ප්‍රමාණයක් පොදු මගී ප්‍රවාහනය භාවිතා කරනු ලබයි.

20. **6.5.2.2.** උපාය මාර්ග

01. පොදු ප්‍රවාහන ක්‍රම ශක්තිමත් කිරීම.

21. නගරයට ඇදී එන ජනතාව සඳහා පොදු ප්‍රවාහන සේවා විධිමත් කිරීමත් වැඩි ජනතාවක් පොදු ප්‍රවාහන සේවා මගින් අද්දවා ගැනීමත් සිදු කිරීම.

(අ). සංචාරකයන් වැඩි ප්‍රමාණයක් දුම්රිය මගින් ගෙන්වා ගැනීම හා දුම්රිය සමග ඒකාබද්ධ මගී ප්‍රවාහන සේවයක් නානුඔය දුම්රිය ස්ථානයේ සිට නුවරඑළිය නගරය තෙක් ඇති කිරීම

(ආ). නානුඔය දුම්රිය ස්ථානය කේන්ද්‍රකර ගනිමින් එතැන් සිට නගර මධ්‍යයට, ග්‍රෙගරි වැව උද්‍යානයට සංචාරකයන් ඉලක්ක කර ගත් කේබල් කාර් ව්‍යාපෘතිය ඇති කිරීම හා එය ප්‍රවාහන මාධ්‍යක් ලෙස භාවිතා කිරීම.

22. (ඇ). නුවරඑළිය බස් නැවතුම් පොල 2වන අදියර සංවර්ධනය කිරීම හා බස්නැවතුම්පොල තුල කාර්යක්ෂමව ඉඩකඩ කළමනාකරණය කිරීම.

(ඈ). පෙරටු බස් නැවතුම් සඳහා උඩුපුස්සැල්ලාව මාර්ගය දෙපස, ඉහල වැව මාර්ගය දෙපස හා ග්‍රෙගරි වැව රථවාහන ගාල් භාවිතා කිරීම හා ඒ මගින් බස්නැවතුම්පලේ තදබදය අවම කිරීම

23. **02.** නගර අභ්‍යන්තරයේ තිරසාර ප්‍රවාහන ක්‍රමයක්

(අ).. නගරය ආශ්‍රිතව හා ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය, නගරය අධිසණත්ව සංචාරක කලාපය හා අධි සණත්ව වාණිජ කලාපය යා කරන පදික හා පාපැදි ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපිත කිරීම. මෙමගින් ග්‍රෙගරි

වැව ආශ්‍රිත කාලපය සිට නානුඔය ඇල රක්ෂිතය දිග පේරාදෙණිය බදුල්ල A 5 හා උඩුපුස්සල්ලාව මාර්ගය දිගේ පදික මංතීරු හා පාපැදි මන්තීරු ඉදිකිරීම.

(ආ) ග්‍රෑන්ඩ් හොටෙල් පාර, නව නුවර පාර හා උද්‍යාන පාර, ලේඩි මැක්ලම් පාර, යුනික් විව් පාර ආශ්‍රිතව පදික මංතීරු ඇති කිරීම

(ඇ) සංචාරකයින් වැඩි පිරිසක් පැමිණෙන තදබදය වැඩි කාල වලදී නගරය තුල නගර සේවා ප්‍රවාහන ක්‍රමයක් ඉදිකිරීම තුලින් පෞද්ගලික වාහන අවම කිරීම.

(ඇ) නගර මධ්‍යයේ පදිංක මංතීරු වගින් ඇතිවන තදබදය අවම කිරීම සදහා ලෝසන් වීදියේ ලෝසන් චතුරශ්‍රය ඉදිරිපිට උමං පදික මාර්ගයක් ඉදිකිරීම හා එය යෝජිත මධ්‍යම වෙළඳපොල දක්වා දීර්ඝ කිරීම හා බස් නැවතුම් පොල ඉදිරිපිට ටෙලිකොම් පදික මංතීරුව සදහා උමං මාර්ග ඉදිකිරීම.

(ඉ) යුනික් විව් මාර්ගයේ සිට බදුල්ල මාර්ගයට සමාන්තරව ග්ලේන්ෆෝල් මාර්ගය හරහා ග්‍රෑන්ඩ් හෝටල් මාර්ගය සම්බන්ධ කරමින් නව පදික මාර්ග ජාලයක් ඇති කිරීම

(ඊ) නානුඔය ඇලේ දකුණු ඉවුරේ හා උද්‍යාන පාර ආශ්‍රිතව පදික මාර්ග ඇති කිරීම

03.ආවරz සහිත පදික මංතීරු

(අ) නගර මධ්‍යයේ එළිසබත් රජින මාවත නව නුවර පාර පැරණි උඩපුස්සැල්ලාව පාර උසාවිය පාර උද්‍යාන පාර හා ලෝසන් වීදිය සියළු පදික මාර්ග ආවරණ සහිත පදික මංතීරු ලෙස සංවර්ධනය කිරීම

04, ප්‍රධාන මාර්ග හා නගර මධ්‍යයේ තදබදය අවම කිරීම

24. විශේෂයෙන් සංචාරකයින් බහුලව පැමිණෙන වසන්ත සමයේදි මෙන්ම සති අන්ත නිවාඩු කාල වලදි නගර මධ්‍යයේ පේරාදෙණිය බදුල්ල මාර්ගයේ රථවාහන තදබදයක් දක්නට ලැබේ. එමෙන්ම සංචාරක හෝටල් බහුලව ඇති යුනික් විව් මාර්ගය ග්ලේන්ෆෝල් මාර්ගය හැඩන්හිල් මාර්ගය ඉහළ වැව මාර්ගය ගැමුණුපුර මාර්ගය හා බේකර්ස්ෆාම් මාර්ගය තදබදය වැඩි වීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය අවම කිරීම සඳහා එම මාර්ග පුළුල් කිරීම හා පදික ගමනාගමනයට සංවර්ධනය කිරීම කල යුතුවේ.

ඒ අනුව පහත සඳහන් මාර්ග ඒ ඒ කණ්ඩාංක ස්ථානයේ සිට අවම පළල මීටර් 9ක් වන ලෙස පුළුල් කිරීමට යෝජනා කරනු ලැබේ.

*වගු අංක **6.17:** පුළුල් කිරීම සඳහා යෝජිත මාර්ග*

අංකය	මාර්ගය	කණ්ඩාංක ස්ථානය	කණ්ඩාංකඅගය	
			අක්ෂාංශ	දේශාංශ
අ	යුනික් විව් පාර	1	**6.963183°**	**80.766802°**
		2	**6.963303°**	**80.762125°**
ආ	ග්ලෙන්ෆෝල් පාර	1	**6.967167°**	**80.766553°**
		2	**6.966035°**	**80.762083°**
ඇ	හැඩන්හිල් පාර	1	**6.962537°**	**80.766718°**
		2	**6.961483°**	**80.763590°**
ඇ	ලේඩි මැක්ලම් පාර	1	**6.970334°**	**80.784507°**
		2	**6.973198°**	**80.771879°**
		3	**6.977272°**	**80.768346°**
		4	**6.976908°**	**80.767072°**
		5	**6.977326°**	**80.765488°**
		6	**6.976876°**	**80.765215°**
		7	**6.976525°**	**80.764472°**
ඉ	ඉහළ වැව පාර	1	**6.966681°**	**80.772169°**
		2	**6.952154°**	**80.787155°**
ඊ	මාගස්තොට - බ්ලැක්ඵුල් පාර	1	**6.947405°**	**80.791090°**
		2	**6.945892°**	**80.789567°**
		3	**6.942315°**	**80.777272°**
උ	සඳතැන්න පාර	1	**6.954727°**	**80.787399°**
		2	**6.970076°**	**80.785663°**
ඌ	බාරෝස් පාර	1	**6.972220°**	**80.775379°**
		2	**6.968925°**	**80.779421°**
එ	ජයතිලක මාවත	1	**6.973944°**	**80.767163°**
		2	**6.977217°**	**80.768351°**
ඒ	කනගරත්නම් පාර	1	**6.974697°**	**80.767670°**
		2	**6.976469°**	**80.766378°**
ඔ	ග්ලේන්ෆෝල් අතුරු මාර්ගය	1	**6.965870°**	**80.767262°**
		2	**6.967150°**	**80.766555°**

5.සියලු මාර්ග ආශ්‍රිතව පදික මාරු හා භූදර්ශන අලංකරණ සඳහා වන සම්මත නියමයන් ඇති කිරීම. අනුව ඉදිරියේදී සංවර්ධනය කරනු ලබන සියලුම මාර්ගවල අවම මීටර 1ක පමණ පළලින් යුතු පදික මාර්ග දෙපසම සහ අවම මීටර් 0.5 ක පමණ රුක් රෝපණ හෝ නුවරඑළියට ආවේණික මල් / එළවළු වගා තීරුවක් ඇති කිරීම. එසේම සියලුම අලුතින් සංවර්ධනය කරනු ලබන මාර්ග සඳහා මාර්ගයට සමාන්තරව සේවා සැපයීම සඳහා Windows (Multi Service duct) කවුළුව අනිවාර්ය කිරීම

සිතියම් අංක 6.16: මාර්ග සංවර්ධන ව්‍යාපෘති



සාමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් උපාය මාර්ග- මාර්ග සංවර්ධන ව්‍යාපෘති **විසල් නුවරඑළිය සංවර්ධන සැලැස්ම**	නාගරික සංවර්ධන අධිකාරිය නුවර එළිය කාර්යාලය සැප්තැම්බර් 2018
නුවර එළිය සංවර්ධන සැලැස්ම (2022-2032)	සකස් කිරීම: නුවර එළිය කාර්යාලය, නා..සං.. අ

6.5.3පානීය ජල සැපයුම.

6.5.3.1. හැදින්වීම

නුවරඑළිය මහ නගර සීමාවේදී පානිය ජලය බෙදා හැරීම නුවරඑළිය මහ නගර සභාව මගින් සිදුකරනු ලැබේ. ජල සම්බන්ධතා 6977ක් (නේවාසික හා වාණිජ) මුළු ජනගහනයේ 35000ක් පමණ පානිය ජලය බෙදා හරිනු ලබයි. නේවාසික ඒකක 3950, වාණිජ 411 ගෘහ නොවන 950 ක ආයතන හා වෙනස් ලෙස 245 ලෙස සමබන්ධතා ලබා දී ඇත. දෛනික ඝන මීටර් 4500ක පමණ අවශ්‍යතාවයක් පවතින අතර ඉන් 72% නේවාසිකද 18% වාණිජ හා සංචාරක බැවින්ද රජයේ හා පෞද්ගලික ආයතන හා සදහා 10%ක් ලෙසද සපයනු ලබයි.

මෙම සියලු ජල සැපයුම් ජල පෝෂක ලෙස ස්වභාවික ජල උල්පත් 9ක් මගින් ජලය ලබා ගන්නා අතර එම ජලය ගබඩා ජලාශ 15ක් මගින් කලාප 7ක් මගින් ආවරණය කර බෙදා හරිනු ලැබේ. එසේම වියළි කාළගුණ තත්ත්වය යටතේ ඇතිවන ජල හිගය සදහා නළ ළිං 9ක් මගින් අමතර ජල අවශ්‍යතාවය ආවරණය කරනු ලබයි. වියලි සමයේදී ප්‍රධාන ජල මුලාශ්‍ර මගින් සපයනු ලබන්නේ ඝණ මීටර් 3500ක ප්‍රමාණයක් බැවින් නල ළිං මගින් අමතර ජල අවශ්‍යතාවය වන ඝණ මීටර් 1000ක සැපයුමක් සපයනු ලබයි.

මින් සම්පුර්ණ ජල අවශ්‍යතාවය 70%ක් පමණ හැඩන්හිල් කලාප වන අතර ප්‍රධාන ජල මුලාශ්‍ර වශයෙන් පීඩෲ හා ටොප්පාස් ජල උල්පත් කටයුතු කරනු ලැබේ. නගරයේ ප්‍රධාන නේවාසික/සංචාරක හා වාණිජ කලාප මෙමගින් ආවරණය කරනු ලබන අතර ප්‍රධාන ගබඩා ටැංකි 5කින් යුක්ත වේ.

එසේම ලවස්ලිප් හා පහල කොටස කලාප මගින් හාවාඑළිය මගින්ද පාර , රෝහල අවට ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර දිනකට ඝන මීටර් 1750ක් පමණ සපයනු ලබයි.

ප්‍රධාන නේවාසික හා වැසි ජන ගණත්වයක් ඇති හා ප්‍රධාන රෝහල පිහිටා ඇති කලාපය සදහා මෙම ජල පෝෂකය මගින් සපයනු කරනු ලැබේ.

කෙසේ වෙතත් මෙම කලාප වියලි සමයේදී එනම් ජනවාරි - අප්‍රේල් කාලවලදී ධාරිතාව පමන 900 අඩු වන බැවින්H1, H2, H3, H4 නල ළිං මගින්ද ජලය ලබා ගෙන බෙදා හැරේ.

කෙසේ වෙතත් වියලි කාල සීමාවලදී එනම් දෙසැම්බර් - අප්‍රේල් කාල සීමාවලදී ජල මුලාශ්‍රවල ධාරිතාව දෛනිකව 3500ක් දක්වා අඩුවන අතර දෛනික ජල ඉල්ලුම 5500ක් පමණ දක්වා වැඩි වේ. මේ සදහා දෙසැම්බර් සහ අප්‍රේල් මාස වල සංචාරක ආගමනය වැඩි වීමත් සමග ඇති වන ඉල්ලුමද මේ තත්ත්වයට බලපානු ලබයි.

නුවරඑළිය ප්‍රාදේශිය සභාවට අයත්වන රුවන්පුර, මීපිලිමාන, කටුමාන හා බ්ලැක්පූල්, ශාන්තිපුර ප්‍රදේශය සදහා වෙන වෙනම ප්‍රාදේශිය හා ග්‍රාමීය ජල සැපයුම් පද්ධති ක්‍රියාත්මක වන අතර ඒ සදහා නුවරඑළිය ප්‍රාදේශිය සභාව මගින් විධිමත්ව මැදිහත්වීමක් නොමැත.

6.5.3.2. උපාය මාර්ග

01 - විශ්වාසනිය ජල සැපයුම

නේවාසික හා සංචාරක ජනගහනය වෙනුවෙන් අඛණ්ඩ පානීය ජල සැපයුම මෙයින් අරමුණු කර ගනු ලැබේ. ඒ අනුව 2028 වන විට 60,000ක් වන මුළු ජනගහනය වෙනුවෙන් හා දෛනික සංචාරක ජනගහනය වන 35,000 ක් හා දෛනික අනෙකුත් අවශ්‍යතා සඳහා පැමිණෙන සංක්‍රමණික ජනතාව වන 52,000ක් වෙනුවෙන් ජල අවශ්‍යතාවය කියුබික් මීටර් 9500ක් ලෙස ගණනය කරනු ලැබේ. මේ අනුව දැනට සපයනු ලබන කි.මී 4500ක් වන ජල සැපයුමට අමතරව තවත් කි.මී. 5000ක ජල මූලාශ්‍ර මෙමගින් හඳුනා ගනු ලැබේ.

(අ). මධ්‍යගත ජල පිරිපහදු මධ්‍යස්ථානයක්

(ආ).ලවර්ස්ලීප් ජල තටාංගනය

ලවර්ස්ලීප් දියඇල්ල පාමුල පිඩෘ වතු යායට අයත් අක්කර 7ක පමණ වූ භූමි ප්‍රදේශයක ජලය එක්රැස් කරනු ලබන ජලාශයක් ඉදිකිරීම. එමගින් අක්කර අඩි 15ක පමණ ධාරිතාවයකින් යුත් ජලය එක්රැස් කරනු ලබන ජලාශයක් ඉදිකිරීම වන අතර ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස ලවර්ස්ලීස් දිය ඇල්ලේ ජල මූලාශ්‍රය ලබා ගැනීම.

(ඇ).කටුමාන හා සීතා එළිය ආශ්‍රිතව හග්ගල වනාන්තරයේ ජල පෝෂිත භාවිතා කරමින් පදිංචි නේවාසික හා සංචාරක ඒකක සඳහා වූ ජලය ඝණ මීටර් 1000 සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරේ.

(ඇ). මීපිලිමාන හා රුවන්එළිය කලාපය සඳහා 2030 වන විට අපේක්ෂිත නේවාසික හා සංචාරක ඒකක් සඳහා ජලය ඝන මීටර් 2000 ප්‍රමාණයක් සඳහා ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මෙම ප්‍රදේශ සඳහා දැනට පානීය ජලය බෙදාහරිනු ලබන නුවරඑළිය මහනගර සභා සැපයුම් පද්ධතිය සමග සම්බන්ධ කිරීම.

සිතියම් අංක ***6.17:*** *මධ්‍යම ජල පිරිපහදු ඒකකය හා ජල තටාකාංගනය*



සමාජීය හා භෞතික සංවර්ධනය
ජල සැපයුම සැලැස්ම

නාගරික සංවර්ධන සංවර්ධන අධිකාරිය
නුවරඑළිය.
2019

නුවර එළිය නාගරික සංවර්ධන සැලැස්ම (2022- 2032)

6.5.4විදුලි බල හා දුරකථන පහසුකම්

6.5.4.1 හැඳින්වීම.

විසල් නුවරඑළිය කලාපය තුල **2017** වන විට ජනගහනය **59000**ක් හා දෛනික සාමාන්‍ය සංචාරක ප්‍රමාණය **7300** පමණ වන අතර උපරිම දෛනිකව සංචාරකයින් පැමිණීම **15000**ක් ලෙස වාර්තා වේ. මේ අතර දෛනිකව අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා නගරයට ඇදී එන සංක්‍රමනික ජනගහනය **40000**ක් පමණ වේ. එසේම **2032** වන විට කලාපය තුල ජනගහනය **60000**ක ඉලක්කයක් හා දෛනික සංචාරක සාමාන්‍ය **23000**ක්ද එය උපරිමය **33000**ක් ලෙසද පුරෝකථනය කල හැකිය.

ඒ අනුව වර්තමානයේ සමස්ත ප්‍රදේශ සඳහා දෛනිකව විදුලි බලය කිලෝ වොට් **8156**ක ප්‍රමාණයක් අඛණ්ඩව ලංකා විදුලි බල මණ්ඩලය මගින් සපයනු ලැබේ. **2032** වන විට නේවාසික, සංචාරක හා සංක්‍රමනික ජනතාව වෙනුවෙන් අමතර කිලෝ වොට් **4700**ක ප්‍රමාණයක් සමග **9665**ක විදුලි ධාරිතාවක් අවශ්‍ය වන බව පුරෝකථනය කල හැකිය. ඒ අනුව ඒ ඒ කලාප වලට අවශ්‍ය පුරෝකථනය කරන ලද විදුලි ධාරිතාවය සිතියම් මගින් දැක්වේ.

එසේම ප්‍රදේශය පුරා ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන සම්බන්ධතා ප්‍රමාණවත් පවතින අතර අනෙකුත් සියලුම් දුරකථන ජාල සම්බන්ධතා ප්‍රමාණවත්ව පවතී. කෙසේ වුවත් **2032** වන විට දෛනික උපරිම සංචාරක ආගමනය **33000**ක් ලෙස ගණනය කර ඇති බැවින්ද දල සංචාරක රාත්‍රී ප්‍රමාණය දින **4**ක් දක්වා වැඩි කිරීම තුලින් එකවර ග්‍රාහකයින් **100000** ආසන්න ප්‍රමාණයකට පහසුකම් සැපයීම සඳහා කටයුතු කල යුතුව ඇත.

ඒ අනුව ඉදරි සංචාරක සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රධාන අපරව්‍යුහ පහසුකමක් වන විදුලිය හා සන්නිවේදන පහසුකම් සපුරාලීම තුළින් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනයත් ඒ තුළින් දිදුලන ආර්ථිකයක් යන ඉල්ලක්කයත් සම්පූර්ණ කර ගත හැකිය.

6.5.5ජලාපවාහන හා මලාපවාහන සැලැස්ම

6.5.5.1 හැඳින්වීම.

නුවරඑළිය ප්‍රදේශයට පසුගිය වසර 10 තුල ලැබී ඇති වර්ෂාපතනය පිලිබඳ සැලකීමේදී සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මි 2000ක් පමණ වන අතර පසුගිය වසර 10 තුල 2010 වසරේදී මි.මි 2182ක් හා 2013 වසරේදී 2157ක් ලෙස උපරිම අගය වාර්තා කරයි. (වගු අංක 6.4)

වගු අංක 6.6: සාමාන්‍ය වාර්ෂික වාර්ෂාපතනය

වර්ෂය	වාර්ෂික වර්ධනය (මි.මි)
2007	1675.7
2008	1587
2009	1639.9
2010	2182.3
2011	1699.6
2012	1971.1
2013	2157.9
2014	1857.7
2015	2021.2
2016	1137

කෙසේ වෙතත් වැඩිම වර්ෂාපතනයක් වාර්තාවන්නේ ජුනි, ජුලි අගෝස්තු සැප්තැම්බර් මාස වල වන අතර පසුගිය වසර 10 තුලදී දිනකදී වාර්තා වන ලබන උපරිම වර්ෂාපතනය 2015.02.05 දින මි.මි 120ක් ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වර්ග කිලෝමීටර් 56.78 පමණ වූ සම්පූර්ණ ප්‍ර දේශයටම උපරිම වර්ෂාපතන අවස්ථාවකදී ජලය කියුබික්මීටර් 6814000 ක ආසන්න ප්‍රමාණයක් ලැබේ.

කෙසේ වෙතත් සමස්ත විසල් නුවරඑළිය කලාපය තුල වර්ග කිලෝමීටර් 50කට ආසන්න ප්‍රමාණයක් වනාන්තර තේවගාව හා කෘෂිකාර්මික ඉඩම් වලින් සමන්විත වන බැවින් ජල ප්‍රමාණයේ 50% පමණ පොළොවට උරාගනු ලැබිය හැකි අතර ඉතිරිය ප්‍රධාන ජල මාර්ග හරහා ගලා යනු ලැබේ.

මේ සඳහා ප්‍රධාන ජල මාර්ග හා ඇල මාර්ග ප්‍රදේශය පුරා පැතිර පවතින අතර නානුඔය ඇල බ්රැක්ප්ලේන් ඇල , තලගල ඔය, වෝටර් ෆීල්ඩ් ඇල, ග්ලේන්ෆෝල් ඇල, කටුමාන ඇල, ඒ අතර ප්‍රධාන වේ. මෙම ජලය ප්‍රධාන වශයෙන් ග්‍රෙගරි වැව බ්රැක්ප්ලේන් වැව හා කටුමාන වැව හරහා මහවැලි ගග පෝෂණය කරනු ලබයි.

කෙසේ වෙතත් නුවරඑළිය නගරය තුල ජලය බැස යන කාණු අවහිර වීම ප්‍රධාන ජල මාර්ග හා ජලාශ ආශ්‍රිතව රොන් මඩ තැන්පත් වීම ජල මාර්ග රක්ෂිත විවිධ කටයුතු සඳහා ආක්‍රමණය කිරීම ගැටලුකාරි තත්ත්වයක් ලෙස හඳුනා ගෙන ඇත.

විසල් සංවර්ධන සැලසුම් කලාප තුල පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ්‍රයක් වන ඉලක්කය සම්පූර්ණ කිරීම සඳහා එහි සියලු ජල මාර්ග වල අවහිරයන් හා බාධාවන් ඉවත් කිරීම සිදු කල යුතු වේ. ඒ අනුව මෙම උපාය මාර්ග මෙම සැලැස්මේ ප්‍රධාන ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා සෘජුව සහය වේ.

එසේම ජල මුලාශ්‍ර වෙත අප ජලය හා මලඅපවහන එකතුවීම වැලැක්වීම සඳහා ඒ ඒ සංවර්ධන කටයුතු ආශ්‍රිතව වෙන වෙනම පිරිපහදු කරන පිහිටුවීමත් මධ්‍යගත පරිපහදු ජාලයක් ස්ථාපිත කිරීමත් මෙම සැලැස්මේ ප්‍රධාන ඉලක්ක වන පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පිරිසිදු ජල මුලාශ්‍රයක් යන්න සම්පූර්ණ කිරීමට සෘජුව දායක වේ.

6.5.5.2 උපාය මාර්ග

01. නිදහස් හා ස්වභාවික ජල බැස්ම සඳහා ඉඩකඩ

භූවිෂමතාවය අනුව මනා ජල බැස්මක් සහිතව දළ වශයෙන් අංශක 10ත් 20ත් අතර සිට අංශක 40 දක්වා පරතරයකින් යුත් බෑවුම් සහිත ඉඩම් පිහිටා ඇත. කෙසේ වුවද නගර මධ්‍යයේ නානුඔය ඇල හා ග්‍රෙගරි වැව ආශ්‍රිතව මෙන්ම බිරුක්පේලෙන් වැව ආශ්‍රිතව පහත් බිම් කොටස් වල ජල අපවහනය මන්දගාමීව සිදුවන බැවින් එහි වැසි ජලයෙන් යටවීම වැලැක්වීම සඳහා වැසි ජලය නිදහසේ ගලා බැසීමට ඉඩකඩ සැලසීම මෙමගින් ප්‍රධාන වශයෙන් අදහස් කෙරේ. ඒ අනුව බිරුක්පෙලෙන් ජලාශය ජලය සපයනු ලබන ප්‍රධාන ඇල මාර්ග පුළුල් කිරීම, රොන් මඩ ඉ වත් කිරීම , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය මහ නගර සභාව හරහා ගලා යන කාණු පද්ධතිය පුළුල් කිරීම, සඳතැන්න මාර්ගය ආශ්‍රිත කාණු පද්ධතිය සංවර්ධනය, තලගල ඔය,වෝටර් ෆීල්ඩ් ඇල හා නානුඔය ඇල රක්ෂිත ආක්‍රමනයන් ඉවත් කර ඇල පුළුල් කිරීම, කටුමාන ඇලේ ජල ප්‍රවාහන මාර්ගය පුළුල් කිරීම ප්‍රධාන ව්‍යාපෘති ලෙස හඳුනා ගනු ලැබේ.

02. ඇල මාර්ග සඳහා රොන් මඩ රැදවුම් ඉදිකිරීම.

විසල් නුවරඑළිය කලාපය තුළ පිහිටි ප්‍රධාන ජල මුලාශ්‍ර වල මඩ තැන්පත් විම අවම කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම මෙයින් සිදුකෙරේ. ඒ අනුව නානුඔය ඇල ග්‍රෙගරි වැවට එක් වීමට ප්‍රථම රොන් මඩ රදවනයක් ඉදිකිරීම, බිරන්ප්ලේන් ජලාශයේ ප්‍රධාන පෝෂිත ඇල මාර්ග දෙක සඳහා මඩ රදවන ඉදිකිරීම හා කටුමාන ඇල සඳහා මඩ රදවන ඉදිකිරීම ප්‍රධාන ව්‍යාපෘති ලෙස හඳුනා ගනු ලැබේ.

03. මලාපවහන පද්ධති සංවර්ධනය

නුවරඑළිය නගර සීමාව තුල මලාපහන පද්ධතියක් නොමැති අතර නගරයට අවශ්‍ය පරිදි මධ්‍යගත මලාපවහන හා අපජලය පවිත්‍ර කිරීමේ පද්ධතියක් සඳහා නුවරඑළිය මහ නගර සභාව මගින් ජපන් බැංකු ආධාර යටතේ ආරම්භ කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව 20128 වන විට අපේක්ෂිත නේවාසික හා සංචාරක සනත්ව ප්‍ර දේශ සංවර්ධනය කරමින් මෙම මධ්‍යගත මලාපවහන පද්දතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර න අතර මධ්‍යම පිරිසිදු ස්ථානය ලෙස බ්ලැක්පූල් **GPS** ඛණ්ඩාංක **6.950552°** හා **80.768683°** පිහිටි ස්ථානයේ යෝජනා කරන ලදි.

එසේම ඉදිරියේදී ඉදිකරනු ලබන සියලුම කාමර 5ක වඩා වන සංචාරක හෝටල් සඳහා හා නාගරික හෝටල් සඳහා අප ජලය පිරිපහදු කරණයක් ස්ථාපිත කිරීම සඳහා රෙගුලාසි මෙම සැලැස්ම මගින් යෝජනා කරන ලදි.

.6.56 ඝන අපද්‍රව්‍ය හා අපජලය කළමනාකරණය

නුවරඑළිය මහනගර සභාව මගින් තම සීමාව තුල දිනකට ඝන අප ද්‍රව්‍ය ටොන් 25ක් පමණ එක්රැස් කර ගනු ලබන අතර ඉන් ටොන් 20ක් (80%) පමණ දිරන අපද්‍රව්‍යවන අතර ඉන් ටොන් 5 ක් 20%ක් පමණ නොදිරන අපද්‍රව්‍ය වේ.

එසේම නුවරඑළිය මහ නගර සභාව වෙත පිටතින් පිහිටි නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ ප්‍රධාන මාර්ග ආශ්‍රිතව පමණක් අපද්‍රව්‍ය එක් රැස් කිරීමසිදුවන අතර නේවාසික ප්‍රදේශ ආවරණය වන පරිදි ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම දක්නට නොලැබේ.නුවරඑළිය මහනගර සභාව සතු සඳතැන්න ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් ස්ථානයේ කිසිදු වෙන් කිරීමක් නොකර බහාලන අතර ඉදිරි වසර 10-15 කාලයක් සඳහා මෙම ඉඩකඩ ප්‍රමාණවත් වේ. තව දුරටත් ඝන මීටර් 60,000ක පමණ මෙම ස්ථානයේ බැහැර කල හැකි ධාරිතාවයකින් යුක්ත වේ. කෙසේ වෙතත් මෙම අපද්‍රව්‍ය බහාලන ස්ථානය තව දුරටත් ඉදිරි වසර 30ක කාලයක් භාවිතා කල හැකි පරිදි ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සිදු කිරීමට මෙම සංවර්ධන සැලැස්ම මගින් උපාය මාර්ග 3ක් හඳුනා ගනු ලැබේ. මෙම උපාය මාර්ග සමඟ සෘජුව කෘෂිකාර්මික සඳහා වන උපාය මාර්ග සමඟ ගැලපෙන ආකාරයට වක්‍රව සංචාරක ව්‍යාපාරය වැඩි දියුණුවීම තුළින් ආර්ථික සංවර්ධන උපාය මාර්ග සමඟ ඒකාබද්ධ වේ.

6.5.6.1 උපාය මාර්ග

1. අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය නොවීම

ඉදිරි ජනහගන වර්ධනය හා සංක්‍රමණික ජනගහන වර්ධනය අනුව දෛනිකව එක්රැස් වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 32ක් පමණ 2030 වන විට අපේක්ෂා කල හැකි අතර 1.1 යටතේ නේවාසි පරිශ්‍රයන් තුලදීම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ක්‍රියාත්මක කිරීම තුලින් මෙම ප්‍රමාණය ටොන් 20 දක්වා අඩු කිරීම සිදු කල හැකිය. ඒ අනුව මෙම දෛනික දිරන අපද්‍රව්‍ය කොම්පොස්ට් ව්‍යාපෘතියක් සඳහා යොමු කිරීම.සංවර්ධන සැලසුම් කලාපය තුළ මධ්‍ය සනත්ව, ඌණ සනත්ව

මිශ්‍ර, නේවාසික හා සංචාරක කලාප තුළ පිහිටි සියළුම පරිශ්‍ර තුල දිරන ඝන අපද්‍රව්‍ය කොම්පොස්ට් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම. මෙම කලාපයන්හි ගොඩනැගිලි සැලසුම් සමග කොම්පොස්ට් බදුනක් පිහිටුවීම අනිවාර්යය කිරීම හා නුවරඑළිය මහ නගර සභාව මගින් නොදිරන අපද්‍රව්‍ය පමණක් එක් රැස් කිරීම. මෙය දැනට සඳතැන්න අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානය තුල පිහිටුවීම ඒ අනුව උක්ත කලාපයන් වලදී සියළුම පරිශ්‍රයන් ආශ්‍රිතව කොම්පොස්ට් බදුන් ඉදිකිරීම තුළින් තම ගෙවත්තේ කාබනික පොහොර සඳහා උනන්දු කරලීම මෙයින් සිදුකරනු ඇත. මෙම කලාපයන් තුළ භූමි ආවරණ අනුපාතය උපරිම 50% වන බැවින් ඉතිරි බිම් කොටස් වල උඩරට එළවළු වගාව මල් වගාව හා භූදර්ශන කටයුතු සඳහා ඉඩ දෙනු ලැබේ.

එකී භාවිතයන් සඳහා මෙම කොම්පොස්ට් පොහොර යෙදවීම උනන්දු කරලීම තුළින් තම පරිශ්‍රය තුළ ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම තුළින් මහ නගර සභාව මගින් දෛනිකව එකතු කල යුතු ප්‍රමාණය අඩු අගයකට පත්වේ.

2. නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය

2028 වන විට ඇස්තමේන්තු ගත නොදිරණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 08ක් ලෙස ගණනය කල හැකි අතර එම ප්‍රමාණය පමණක් සඳතැන්න අපද්‍රව්‍ය බහාලනය වෙත යොමු කිරීම. කෙසේ වෙතත් ඉදිරියේදි සංචාරක ජනගහනය උදෙසා නොදිරන අපද්‍රව්‍ය භාවිතය අවම කිරීම සිදුකල යුතුව ඇති අතර නුවරඑළිය මහ නගර සභාව සතුව ඇති කසළ බහලුම් මධ්‍යස්ථාන තුළ නැවත භාවිතයට ගත හැකි පොලිතින් හා ප්ලාස්ටික් එක්රැස් කිරීම තව දුරටත් වැඩිදියුණු කල යුතුව ඇත.

6.6පොදු විවෘත ස්ථාන සඳහා වන උපාය මාර්ග

6.6.1හැදීන්වීම

පොදු ස්ථාන යටතේ එළිමහල් හා පුරහස්ත ලෙස වර්ග දෙකකට වෙන් කල හැකි අතර එයද සෘජු (active) වක්‍ර (Passive) ලෙස වර්ග කල හැකිය. ඒ අනුව ප්‍රදේශයේ දැනට ඇති පුරස්ථ හා විවෘත පොදු ස්ථාන ලෙස පහත වර්ග කල හැකිය.

වගු අංක 6.19: පොදු විවෘත ස්ථාන

ගෘහස්ත/ විවෘත	වර්ගය	ස්ථානය	ප්‍රමාණය (ව.කි)
ගෘහස්ත	සෘජු (active)	සිනිසිටා ගෘහස්ත ක්‍රීඩාංගනය	
		පොදු වෙළඳපොල ව්‍යායාම ස්ථානය (Gym)	
		නුවරඑළිය ක්‍රීඩා සමාජය	
		නුවරඑළිය මොටර් රේසිං සමාජය	
		පැරණි නුවරපාර ව්‍යායාම ස්ථානය	
	වක්‍ර Passive	සිනෙසිටා ශ්‍රවණාගාරය	
		නාගරික පුස්තකාලය	
		රීගල් සිනමාහල	
		මිපිලිමාන ප්‍රජා ශාලාව	
විවෘත	සෘජු (active)	තුරඟ තරග පිටිය	29
		ග්‍රෙගරි වැව විනෝදාත්මක කලාපය	88
		වික්ටෝරියා උද්‍යානය	10
		ගොල්ෆ් ක්‍රිඩාංගනය	20
		හාවාඑළිය ක්‍රිඩාංගනය	1.6
		වජිරඥාණ විද්‍යාල ක්‍රිඩාංගනය	0.5
		කළුකැලේ විද්‍යාල ක්‍රිඩාංගනය	0.2
		සේනානන්ද විද්‍යාල ක්‍රිඩාංගනය	0.4
		ධර්මපාල ප්‍රාථමික විද්‍යාල ක්‍රිඩාංගනය	0.01
		ශාන්තිපුර විද්‍යාල ක්‍රිඩාංගනය	0.1
		බොරලන්ද ක්‍රිඩාංගනය	1
		හොලිට්‍රින්ටි විද්‍යාල ක්‍රිඩංගනය	0.1
		යහපත් එඬේරාගේ කන්‍යාරාම විද්‍යාල ක්‍රිඩාංගනය	0.1
		රුවන්එළිය ක්‍රිඩාංගනය	0.5
	වක්‍ර Passive	ශාන්තිපුර, පිදුරුතලාගල, සිංගල් ට්‍රී නැරඹුම් ස්ථාන	
		නුවරඑළිය ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ පෙන්නුම් කරන බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද 129ක් පමණ වූ පැරණි ගොඩනැගිලි	
		පල්ලිය පාර බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද පැරණි සුසාන භූමිය	
		හාවාඑළිය නාගරික සුසාන භූමිය	

ඒ අනුව ප්‍රදේශය පුරා පැතිරි ඇති හෙක්. 153ක පමණ වූ විවෘත භූමි හා ක්‍රිඩා පිටි ප්‍රදේශයේ ජනතාව හා සංචාරකයින් සඳහා වෙන් කර ඇත.

සිතියම් අංක ***6.18:*** *විවෘත භූමි හා ක්‍රීඩා පිටි*



2032 වන විට විසල් නුවරඑළිය කලාපය තුළ නේවාසික ජනගහනය 60,000ක් ද සංචාරක දෛනික ප්‍රමාණය 35,000ක් ද අනෙකුත් කටයුතු වෙනුවෙන් නගරයට ඇදි එන දෛනික සංක්‍රමණික ජනගහනය 52,000ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව විවෘත භූමි හා ක්‍රීඩාංගන අවශ්‍යා ප්‍රමාණය

නේවාසික ජනගහනය වෙනුවෙන් හෙක්. 60

සංචාරක ජනගහනය වෙනුවෙන් හෙක්. 35

දෛනික සංක්‍රමණික ජනතාව වෙනුවෙන් - හෙක්. 13

(සංක්‍රමණික ජනතාව සඳහා නේවාසික ජනතාවගේ අවශ්‍යතාවය මෙන් 25%ක විවෘත භූමි ප්‍රමාණයක් අවශ්‍ය බව ගණනය කර ඇත.)

ඒ අනුව අවශ්‍ය සමස්ත විවෘත භූමි ප්‍රමාණය හෙක්. 108ක් වන අතර දැනටමත් පවත්නා භූමි ප්‍රමාණය හෙක්. 153ක් වන බැවින් ඉදිරි වසර සඳහා ද මෙම ප්‍රමාණය ප්‍රමාණවත් වේ.

නමුත් නගර මධ්‍යයේ වැඩි විවෘත භූමි ප්‍රමාණයක් පිහිටිම හේතු කොට ගෙන බැහැර ප්‍රදේශ වල එනම් හාවාඑළිය, මීලිපිමාන කලාපයන්හි අඩු විවෘත භූමි ප්‍රමාණයක් ඇති බව පෙනේ.

6.6.2උපාය මාර්ග

මෙම තත්ත්වය මග හැරීමට පහත සඳහන් ක්‍රිඩා භූමි සංවර්ධනය යෝජනා කරනු ලැබේ.

1. බොරලන්ද ක්‍රිඩාංගනය වැඩි දියුණු කිරීම
2. හාවාඑළිය වජිරඥාණ විද්‍යාල ක්‍රිඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
3. රුවන්එළිය ක්‍රිඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
4. මීපිලිමාන සේනානන්ද විද්‍යාල ක්‍රිඩාංගනය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම

.6.7සංස්කෘතික හා පෞරාණික ස්ථාන වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග

විසල් නුවරඑළිය සංවර්ධන කලාපය තුළ බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද ගොඩනැගිලි 129ක් පිහිටා ඇත. එම ගොඩනැගිලි වල ඇති වික්ටෝරියානු, ජෝර්ජියානු, හා බ්‍රිතාන්‍ය යුගයට අයත් ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කරනු වස් මෙම ගොඩනැගිලි 129 සංරක්ෂිත ගොඩනැගිලි ලෙස නම් කර ඇත.

මෙකී ගොඩනැගිලි වල ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කිරිම හා තවදුරටත් නුවරඑළිය කලාපය තුළ එම ගෘහ නිර්මාණ ලක්ෂණ ප්‍රවර්ධනය කිරිම හා ගොඩනැගිලි රෙගුලාසි හඳුනා ගෙන ඇත.

විසල් සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් වන නුවරඑළියට අවේනික ගෘහ නිර්මාණ ශිල්පි ලක්ෂණ ආරක්ෂා කිරිම හා ප්‍රධාන මාර්ග ආශ්‍රිතව හදුනාගත් කලාපයන් වල අනිවාර්යය බවට රෙගුලාසි පැනවීම

6.7.1 ඓතිහාසික හා ගෘහ නිර්මාණාත්මක වටිනාකමක් ඇති ගොඩනැගිලි- නුවරඑළිය මහා නගර සභා සීමා ප්‍රදේශය - 2002

*වගු අංක **6.20** :සංරක්ෂිත ගොඩනැගිලි*

වීථියේ නම		වරිපනම් අංකය.	භූමි ප්‍රමාණය					තොරතුරු නොමැති	එකතුව	ගොඩනැගිල් ලේ කාලය (අවුරුදු)		තොරතුරු නොමැති	එකතුව
			>10	11-20	21-30	31-40	41 වැඩි			>100	101<		
01	එළිසබත් රැජින පාර	**ක්වීන්ස් කොටේජ් , 44,140,02යු.වී.,132ඒ,126, 114,108,104,50,01,42,38**	**03**	**02**	**05**	**01**	**02**	**-**	**13**	**01**	**10**	**02**	**13**
02	ඉහළ වැව පාර	**39,34,43/2,71(71/1,71/2, 71/3),55,(55/1,)35,(35/2, 35/3,35/4,37),85,(85/1),8 1/2**	**02**	**02**	**02**	**01**	**-**	**01**	**08**	**-**	**04**	**04**	**08**
03	බදුල්ල පාර	**162,34,68,66,46,142,1/1, 25,144,136/3,156**	**07**	**01**	**02**	**-**	**-**	**01**	**11**	**07**	**02**	**02**	**11**
04	හැඩන්හිල් පාර	**16(17),07,02,71**	**02**	**01**	**-**	**01**	**-**	**-**	**04**	**02**	**01**	**01**	**04**
05	වෙඩබන් පාර	**02,05,12,14(14/1),24,09,7 /5,22,13(13/1,13/2)**	**03**	**04**	**-**	**-**	**-**	**02**	**09**	**03**	**05**	**01**	**09**

06	පල්ලිය පාර	**06,6/1,15,10,12,26,(26/1,26/2),30(30/1,)1/22,30,34/1,32**	**08**	**02**	**01**	**-**	**-**	**-**	**11**	**02**	**07**	**02**	**11**
07	උද්‍යාන පාර	**25,31(31/1)**	**01**	**01**	**-**	**-**	**-**	**-**	**02**	**02**	**02**	**-**	**02**
08	නුවර පාර	**340,381,395,(395/1,401/1,325/1**	**03**	**-**	**-**	**-**	**-**	**01**	**04**	**02**	**02**	**-**	**04**
09	ශාන්ත ඇන්ඩෲ පාර	**150,132/1,128,20,100,160,124**	**01**	**03**	**-**	**-**	**-**	**-**	**07**	**01**	**03**	**03**	**07**
10	වෝටර් ෆිල්ඩ් පාර	**102,96,98,92,55,56,26,46,20/1**	**03**	**06**	**-**	**-**	**-**	**-**	**09**	**-**	**04**	**05**	**09**
12	යුනික්ව්ව් පාර	**07**	**-**	**01**	**-**	**-**	**-**	**-**	**01**	**-**	**-**	**01**	**01**
13	ලෙබනන් පාර	**112/11**	**01**	**-**	**-**	**-**	**-**	**-**	**01**	**-**	**01**	**-**	**01**
14	ග්ලෙන් ෆොල් පාර	**¾,1/1,25**	**02**	**01**	**-**	**-**	**-**	**-**	**03**	**-**	**03**	**-**	**03**
15	උඩපුස්සැල්ලාව පාර	**95,123,125,2/143*** පරණ දුම්රියපල ගොඩනැගිල්ල	**01**	**01**	**-**	**-**	**01**	**02**	**05**	**02**	**02**	**01**	**05**
16	මවුන්ට් මේරි පාර	**18(24/1)**	**01**	**-**	**-**	**-**	**-**	**-**	**01**	**-**	**-**	**01**	**01**
17	රාහුල මාවත	**07,06,20,**	**03**	**-**	**-**	**-**	**-**	**-**	**03**	**-**	**-**	**03**	**03**

18	කීනා පාර	25	01	-		-	-	-	01	01	-	-	01
19	ග්‍රෑන්ඩ් හෝටල් පාර	17,29,76,19/10,10,21	04	02		-	-	-	06	02	04	-	06
20	හීල් වීදිය	14,	-	-	01	-	-	-	01	-	01	-	01
21	කනගරත්නම් මාවත	09,11	01	01	-	-	-	-	02	-	02	-	02
22	පරණ කඩ වීදිය	90	-	-	-	-	01	-	01	-	-	01	01
23	ලෝන්ග් වීදිය	05	-	-	01	-	-	-	01	01	-	-	01
24	හරස් වීදිය	25	-	01	-	-	-	-	01	-	01	-	01
25	ජයතිලක මාවත	24,10,20,17	01	03	-	-	-	-	04	-	04	-	04

*** පරණ වරිපනම් අංකය** **යූ.වී. – යුනික්විව්** **මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - නුවරඑළිය**

6.7.2.වීථි අනුව සංරක්ෂණය සඳහා හඳුනාගත් ගොඩනැගිලි ව්‍යාප්තිය

වගු අංක Error! Use the Home tab to apply 0 to the text that you want to appear here. 7: සංරක්ෂිත ගොඩනැගිලි මාර්ග අනුව

වීථියේ නම		ඒකක වල එකතුව	බිම් ආවරණය (පර්චස්)					ගොඩනැගිලි වල කාලය (අවු.)					
